ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණීම සිංහල පුවත්පත



මුල් වරට පැවැත්වූ හලාවත පදවියේ දහම් කතිකාවත පිළිබඳ සංෂිප්ත සටහනක්.

**2012 සලාපුර පදවි දහම් කතිකාව**

3 පිටුව



**සයුරෙන් මතු වූ කුමරිය**

මාතර අප ස්වාමිදූගේ වාර්ෂික මංගලෝත්සවය අරබයා පිදෙන තිළිණයකි.

8 පිටුව



පැවැත්වීමට නියමිත සබරගමු, උතුරුමැද, නැගෙනහිර පළාත් සභා මැතිවරණය පිළිබඳ අතීත මතකය විමසීමකි.

**ජනමතය විමසන පළාත් සභා මැතිවරණය**

14 පිටුව



**2010 වසරේ හොඳම ආගමික පුවත්පත**


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07




**කන්‍යමරියෝත්තමාවන්ගේ උත්පත්ති මංගලෝත්සවය සැප්. 08 දා**

ක්‍රි.ව. 2012 ක් වූ සැප්තැම්බර් 02 ඉරිදා 147 වෙළුම 14 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

# මාංශගත වූ දෙවි වදන තුළ ජීවිතයේ කඳුළට අරුතක් තිබෙනවා

## තේවත්ත වාර්ෂික සුවදන මෙහෙයේ දී කාදිනල් හිමිපාණෝ අවධාරණය කරති

සී. ආර්. ඩික්සන් ඇන්ටනි හා ඇන්ටන් ජයසූරිය

"වේදනාව, දුක, කඳුල නැති ලොවක් ගැන අප හිතුවොත් එය ආත්මාර්ථකාමී අදහසක්. ජේසුන් වහන්සේ තුළ තිර සාර විශ්වාසයෙන් දුක වේදනාව ප්‍රතික්ෂේප නොකරන්න. කුරුසිය තුළ දුක වේදනාව වැළඳ ගැනීමෙන් අපට ඒවා ජයගත හැකියි. කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි එසේ අවධාරණය කළේ "මරිමවුනි, මාංශගත වූ දෙවි වදනින් අප බලවත් කළ මැනව" තේමා කරගෙන රාගම තේවත්ත ලංකා අප ස්වාමිදූගේ ජාතික බැසිලිකා සිද්ධස්ථානයේ දී පැවැති වාර්ෂික සුවදාන මෙහෙයේ ප්‍රධානත්වය ගනිමිනි. 15 පිටුවට ▶






පැමිණි අති මහත් සැදැහැ පිරිස හමුවේ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් ප්‍රමුඛ රදගුරුතුමන් සුවදාන ආශිර්වාදය දානය කළ අයුරු (සේයා රොෂාන් ප්‍රදීප්)

## තේවත්ත සුවදාන මෙහෙය අයි නාලිකාවේ

පසුගියදා තේවත්ත ලංකා අප ස්වාමි දූ ජාතික බැසිලිකාවේ පැවැති වාර්ෂික සුවදාන මෙහෙය සැප්. 02 ඉරිදා (අද) ජාතික රූපවාහිනියේ අයි නාලිකාවේ පෙ.ව. 11.00 සිට ප.ව. 12 දක්වා විකාශනය වන බව වැඩසටහන් සම්පාදක රංජුල සේනාධීර මහතා දන්වා සිටී.

## සාන්ත සබා මාතාවගේ නොමැකෙන උරුමය නිකුත් වේ



"සාන්තුවර වීරාවලියේ නොදිරන සිරුරු" ග්‍රන්ථය ලියා කතෝලික පාඨක ජන හද දිනූ ඥානාර්ථ ප්‍රදීපය සහකාර සංස්කාරක ශිරාන් මෛත්‍රිගේ නවතම ග්‍රන්ථය "සාන්ත සබා මාතාවගේ නොමැකෙන උරුම" ලෙස දැන් නිකුත් වී තිබේ. කතෝලික උරුමයේ අක් මුල් සොයා යන්නන්ට පිදෙන අත්වැලක් ලෙස මේ ග්‍රන්ථය කතුවරයා හඳුන්වා දෙයි.

## විවාහාපේක්ෂකයන්ට බලාපොරොත්තුවක්

බම්බලපිටිය සා. මරියා දේවස්ථාන පරිශ්‍රයේ ඇති විවාහ හමුව කාර්යාංශයේ විවාහ වීමට බලාපොරොත්තුවෙන් සිටින අපේක්ෂක අපේක්ෂිකාවන් 600 ගේ තොරතුරු සහිත ලිපිගොනු ඇතැයි වෛද්‍ය මැක්සි ප්‍රනාන්දුපුල්ලේ මහතා ප්‍රදීපයට පැවසීය. විවාහ වීමට අපේක්ෂාවෙන් සිටින කතෝලික විවාහ අපේක්ෂක අපේක්ෂිකාවන්ට මේ කාර්යංශයේ ලියාපදිංචි වී තමන්ගේ ලිපිගොනු විවෘත කිරීමට ද අවකාශ ඇති අතර, එම කාර්යංශය බ්‍රහස්පතින්දා හා සෙනසුරාදා දිනයන්හි පෙ.ව. 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා විවෘතව පවතී.

## නිලසිරිගම දෙව්මැඳුර

යෝජිත බෝපිටිය නිලසිරිගම දෙව්මැඳුර ගොඩනැඟීම තවදුරටත් පමා වීම පිළිබඳව ප්‍රදේශවාසීන්ගේ බලවත් කනස්සල්ල වැඩිවෙමින් පවතින බව ප්‍රදීපයට වාර්තා වේ. ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන මෙන් වගකිව යුත්තන්ගෙන් ඔවුහු ඉල්ලා සිටිති.

## "කතෝලික අධ්‍යාපනය සහ පාසල් රජයට පවරා ගැනීම" නමැති ග්‍රන්ථයේ මුල් පිටපත කාදිනල් හිමිපාණන්ට පිළිගන්වයි

ලෙනාඩ් හපුආරච්චි

ඩබ්ලිව්. එම්. ප්‍රනාන්දු මහතා තමා විසින් රචනය කර පළ කර ඇති "කතෝලික අධ්‍යාපනය සහ පාසල් රජයට පවරා ගැනීම" නමැති ග්‍රන්ථයේ මුල් පිටපත ඉකුත් දා කොළඹ අගරදගුරු මැදුරේදී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට පිළිගැන්වීය.

කතෝලික සභාවෙන් මෙරට අධ්‍යාපනයට සිදුවී ඇති විශිෂ්ට සහ දීර්ඝ කාලීන සේවය මෙම පොතෙන් මනාව පිළිබිඹු කෙරේ. පාසල් රජයට පවරා ගැනීමට පෙර මෙරට පැවති අධ්‍යාපනයේ ගුණාත්මක භාවයත්, පාසල් රජයට පවරා ගැනීමෙන් පසු ඒ පිළිබඳ තත්ත්වයත් පිළිබඳව මෙම පොතෙන් කෙරෙන සැසඳීම, අධ්‍යාපනය පිළිබඳව සැළකිලිමත් වන කාගේත් අවධානයට යොමුවිය යුත්තකි.

## සුවදාන දිනයේ වෙනසක්?

වන්නියේ මරුද මඩු මාතා මහා මංගල්‍යය නිමාවීමත් සමග අගෝස්තු මාසයේම අවසාන ඉරිදා තේවත්ත ජාතික බැසිලිකා පුදබිමේ සුවදානයේ මෙහෙය පැවැත්වෙන නිසා උතුරු - නැගෙනහිර ප්‍රදේශවල වන්දනාකරුවන්ට පැමිණීමේ දුෂ්කරතා මතුව ඇතැයි ඔවුහු ප්‍රදීපයට ප්‍රකාශ කළහ.

ජාතික බැසිලිකා පුදබිමේ වාර්ෂික ලංකා අප ස්වාමිදූ මංගල්‍යයට සමගාමීව සුවදාන මෙහෙය පවත්වන්නේ නම් ජාතික නිදහස් සමරු දිනයේ ජාතික සමගිය ප්‍රකාශ කිරීමට ද එය කදිම නිමිත්තක් වෙතැයි විශ්වාස කැරේ.

## සමාජ සාධාරණය උදෙසා ජාතික ව්‍යාපාරයක්

රට තුළ හිතකර පාලන තන්ත්‍රයක් ඇතිකරලීම සඳහා ප්‍රබල කතිකාවක අවැසිතාවයක් පිළිබඳව සාකච්ඡා කිරීමට ආගමික සමුළුව පසුගිය 29 දා කරිටාස් ශ්‍රී ලංකා (සෙඩෙක්) ආයතනයේ දී ආගමික නායක හමුවක් පැවැත්විය.

අති පූජ්‍ය මාදුළුවාවේ සෝභිත ස්ථවිරයන් වහන්සේ ඇතුළු සංඝයා වහන්සේ පිරිසක් ද, විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමි ඇතුළු කතෝලික පියතුමන් ද එකතුව පැවැති මෙම හමුවේ දී එහි මුඛ්‍ය දේශනය ජනාධිපති නීතිඥ ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා විසින් පවත්වන ලදි.

## ජාකොමේ ගොන්සාල්වෙස් පිය චරිතය සිනමාවට

ශ්‍රී ලාංකේය කතෝලික සාහිත්‍යයේ පුරෝගාමියාණන් වූ අති ගෞරවනීය ජාකොමේ ගොන්සාල්වෙස් පිය චරිතය අළලා සකස් කැරෙන සිනමා-පටය සඳහා එතුමාණන්ගේ ජීවිත සිද්ධි හා සම්බන්ධ පැරණි පතපොත හා අනිකුත් දෑ ඔබ සතුව ඇති නම් ප්‍රදීපය කතුතුමන් වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

## මැවිල්ලේ මහිමය දැසින් දුටු නීල් ආම්ස්ට්‍රෝං දෙව්ඳුන් තුරුළට

"ලොව මුල් වරට සඳ මත පා තැබූ මිනිසා" ලෙස විරුදාවලි ලත් නීල් ආම්ස්ට්‍රෝං ගගනගාමියා අසූ දෙහැවිරිදි වියේ දී සදා සාමය දිනීය.

1969 ජුලි 20 දා ඇපලෝ 11 යානයෙන් සඳ මත පා තැබූ මොහොතේ ඔහු පැවසුවේ දෙවියන් වහන්සේගේ මැවිල්ලේ මහිමය අති උත්කෘෂ්ට බවයි. ඊට පෙර ඇතැම් ගගන ගාමීන් අභ්‍යවකාශයේ දී දෙවියන් හමු නොවූ බවට උසුළු විසුළු හා ආගමික විශ්වාසයන් සැහැල්ලුවට ලක්කර තුබූ පසුබිමක නීල් ආම්ස්ට්‍රෝං එදා ගත් විශ්වාසයේ මඟ ඇමරිකාවේ පමණක් නොව මුළු ලොවේම ඇස් අරවන්නක් විය.



## හලාවත දෙවන ජුවාම් පාවුළු උසස් අධ්‍යාපන ආයතනය විවෘත කැරේ

පර්සි ප්‍රනාන්දු

අති උතුම් වැලන්ස් මෙන්ඩිස් සලාපුර රදගුරු හිමිපාණන්ගේ මෙහෙයවීමෙන් උසස් අධ්‍යාපන ආයතනයක් වෙන්නප්පුව ලුණුවිල හංදියේ සැප්තැම්බර් මස 4 දා ඇරඹීමට කටයුතු සූදානම් කැර තිබිණ.

එම උසස් අධ්‍යාපන ආයතනය ආරම්භ කිරීමේ අරමුණ පුත්තලම් දිස්ත්‍රික්කයේ දුවා දරුවනට ගෞරවාන්විත, විනයගරුක, මිනිස් වටිනාකමින් පිරිපුන් පරිසරයක් ඇති කරමින් ආගමික වටිනාකම් වලින් හෙබි පූර්ණ අධ්‍යාපනයකට මඟ පෙන්වීම බව එම අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ගරු නෙවිල් කුඤ්ඤේ පියතුමා සඳහන් කරයි.

**"ඊශ්‍රායෙල් කෙරෙහි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැඟී එන්නේය." (මීකා 5: 1- 5)**

# හලාවත දහම් කතිකාවතෙන් නව පිබිදීමක්!

ගිහි පැවිදි පූජක ලෙසින් අප කැඳවීම් ලැබුවත් එකම ස්වාමියෙකුට සේවය කරන පිරිසක්. අපගේ විවිධ කැඳවීම් ඒකරාශි කරන පදනම දේව වචනයයි. දේව වචනය සියලු දෙනාගේ ජීවිත වලට පහනක්. අප එකිනෙකාගේ ගමන් මග විවිධ ක්ෂේත්‍රයන් තුළ වෙනස් වූවත් ඒ හැමට මඟ පෙන්වන්නේ දේව වචනයයි. සියලු දෙනාගේ අධ්‍යාත්මය රඳා පවතින්නේ දේව වචනය මතයි. එකම ස්වාමින් වහන්සේ කෙනෙක් මතයි.

සලාපුර රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්දිස් හිමි පසුගියදා තලවිල සා. ආනා සිද්ධස්ථානයේ පැවති හලාවත පදවි දහම් කතිකාවත සමාප්ති සැමරුම් දේව මෙහෙයේදී ප්‍රකාශ කළේය.

දින තුනක් පුරා පැවති දහම් කතිකාවනට මහනුවර රදගුරු අතිඋතුම් ජෝශප් වියානි ප්‍රනාන්දු, බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු, විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස්, කොළඹ සහායක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් ද, ගරු හෙන්රි සිල්වා පියතුමා හා හලාවත පදවියේ සියලුම ගරු පියතුමන් පැවදි සොහොයුරු තුමන් හා සොයුරියන්ද වෙනත් පදවිවලින් පැමිණි ගරු පියතුමන් කිහිප දෙනෙක්ද, තෝරාගත් සිවිල් සේවයෙ විශේෂිත මහත්ම මහත්මීන් පිරිසක්ද, පදවියේ එක් එක් මීසම් නියෝජනය කරමින්ද අපෝස්තලික සේවා සමිති නියෝජනය කරමින්ද පැමිණි ගිහි මහත්ම මහත්මීන් රැසක්ද සහභාගි වූහ.

ජනවන්දනාව, කිතුනු පවුල. සන්නිවේදනය, ආගමික සුහදතාව, යුක්තිය හා සාමය, අධ්‍යාපනය, ධර්මෝපදේශ සේවා පූජක පැවදි සේවය කතෝලික යොවුන් නවෝදය, ගිහි අපෝස්තලික සේවා හා නව ධර්මදානය සහ පදවි දූත සේවා ක්‍රමවේදය පිළිබඳ මෙහිදී ගැඹුරින් සාකච්ඡා කෙරුණු අතර තීරණ රාශියක් ගැනිණ.

කේ. නිහාල් ප්‍රනාන්දු



නාත්තන්ඩිය මීසමට අයත් දුෂ්කර ග්‍රාමයක් වූ පුස්වැල් කුඹුර ග්‍රාමයේ දේවමාතා ප්‍රතිමාවක් තැන්පත් කැරිණ. මීසම් සේවක ගරු උපාලි චර්චිල් පියතුමා හා ප්‍රදේශ වාසී ජනතාව එක්ව ඉතා උත්කර්ශවත් අන්දමින් හා ගෞරවයෙන් දෙව්මව් ප්‍රතිමාව රැගත් පෙරහර ග්‍රාමය වටා සංචාරය කර අවසානයේදී සහයක ගරු දුමින්ද සුරේෂ් පියතුමා ප්‍රතිමාව ආසිරි ගන්වා තැම්පත් කරන ලදී.

ශ්‍රියාංගනි පිලිපියා

## බාල පරපුර රැක ගත යුතු කාලයක

අද පුංචි දැරියකට කාන්තාවකට පාරේබැහැල යන්න බැරි තත්ත්වයක් තමයි උදා වෙලා තියෙන්නෙ. මේ බාල පරපුර අපි ආරක්ෂා කර ගත යුතුයැයි කැකිරාව මීසම් සේවක ගරු රංජිත් ද මෙල් පියතුමා කලඑළිය සා. ජුවකීනු මුනි දෙව්මැඳුරේ වාර්ෂික මංගල මෙහෙයේ දී පැවසීය.

ගරු පියතුමා මෙසේ ද පැවසීය. අද අහන්නට ලැබිල තියෙන විදියට දරුවන්ට කානත්වාන්ට කිසිම රැකවරණයක් නැහැ. වෛරය අද ජීවන මාර්ගයක් බවට පත් වෙලා. අධ්‍යාත්මය විනාශවෙනවා නම් තාක්ෂණය මොන තරම් දියුණු වුනත් වැඩක් නැහැ.

ලෙස්ලි පෙරේරා

# ධර්මදූත කලාපයේ ධර්මෝපදේශ මෙහෙවර බිම් මට්ටමින්

කොළඹ අගරදගුරු පදවියේ දුෂ්කර මීසම් වන මතුගම සහ හොරණ ප්‍රදේශවල දුරස්ථව විසිරී සිටින දහම් පාසල් දූ දරුවන් සහ දෙමාපියන් කේන්ද්‍රගතව නැතිවූ බැටළුවන් සොයා යාමේ ජේසු සමිඳාණන්ගේ සංකල්පය ක්‍රියාවට නංවමින් විවිධ වැඩමුළු, සාකච්ඡා, නිවෙස් බැහැදැකීම් තුළින් නැගෙනහිර නව ධර්මදූත කලාපයේ ධර්මෝපදේශ සහ බයිබල් අධ්‍යයන අපෝස්තලික සේවා කලාපීය සම්බන්ධීකාරක ගරු මංජුල නිරෝෂන් පියතුමාගේ මූලිකත්වයෙන්, අම්පිටිය ජාතික දෙව්සත්හලේ ගරු සොහොයුරන් කිහිප දෙනෙකුගේ සහභාගිත්වයෙන් දියත් කළ ධර්මෝපදේශ අපෝස්තලික දූත මෙහෙවර දුෂ්කර ප්‍රදේශවල වෙසෙන කිතුනු සැදැහැවතුන්ගේ මහත් පැසසුමට ලක්විය.

එහි දෙවැනි අදියර සැප්තැම්බර් 02 සිට (අද) ගුරුබැවිල දිසාවේ වග මීසමේ දියත් කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත. ගම්පහ දිසා දහම්ගුරු මෙහෙයුම් කමිටුවේ තීරණයක් අනුව 1 සිට 11 ශ්‍රේණිය දක්වා ප්‍රභේද තුනකට දහම් පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් සැප්තැම්බර් 09 වැනි ඉරුදින උදේ දිව්‍ය පූජාවෙන් පසුව මොරගොඩ මීසමේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

එච්. ඊ. ජනකාන්ත සිල්වා



බෝලවලාන මීසමේ ප්‍රයෝජනය සඳහා ඕගනයක් ගම්පහ දිස්ත්‍රික් පර්ලිමේන්තු මන්ත්‍රී ජෝන් අමරතුංග මහතා රු. 150,000 වැයකර පසුගියදා ලබා දුන්නේය. ඒ මහතා මීසම් සේවක ගරු සුජීව අතුකෝරළ පියතුමාට එය පිළිගැන්වූ අයුරු.

# රාවතාවත්ත ස්වර්ණ ජයන්තිය ද නව දෙව්මැඳුර ආසිරි ගැන්වේ

දෙවියන් වහන්සේ මනුෂ්‍යයන් අතර වැඩ සිටින ස්ථානය දේවස්ථානයයි. කතෝලික සභාව කියන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වටා ගෙතුනු සභාවක්. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගන්නා විට උන්වහන්සේ අපගේ ශරීරයට ඇතුළු වනවා වගේම අපව උන්වහන්සේ තුළට ඇතුළු කර ගන්නවා. එවිට අප පරිවර්තනය වෙනවා. අපේ ජීවිතය උන්වහන්සේ අල්ලා ගන්නවා. එවිට අපට ස්වර්ගීය අත් දැකීම් ලැබෙනවා යැයි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කළහ.

මොරටුව රාවතාවත්ත සුරතාවයන්ගේ රාජේශ්වරි දෙව් මැඳුරේ ස්වර්ණ ජයන්තියට සමගාමීව ඉදිවූ නව දෙව්මැඳුර ආසිරි ගැන්වීමෙන් පසු කාදිනල් හිමිපාණෝ



එසේ පැවසූහ. අද ඇතැම් කිතුනුවන් මූලධර්මවාදීන් පසු පස යාමට පුරුදුව ඇතැයි වැඩිදුරටත් පැවසූ එතුමා ඒ අය බයිබලයේ කොටසක් රැගෙන කියවනවා පමණක් බවත් ඒ කණ්ඩායම් වල දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නැති අතර වචනය පමණක් ඇත්තේ යැයි පැවසීය. රාවතාවත්ත මීසම් සේවක ගරු ටිරෝන් පෙරේරා පියතුමාගේ දැඩි වෙහෙසත්, ජනතාවගේ ඇප කැපවීමත් මත කටයුතු සාර්ථකව ඉටුවිය.

හෙන්රි ප්‍රියශාන්ත මෙන්දිස්

# අගරදගුරු පදවි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැඩ සටහන (AELT POST A/L) 2012

මෙවර අගරදගුරු පදවි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැඩසටහන (AELT), අ.පො.ස උසස් පෙළ විභාගයට මෙම වසරේ පෙනී සිටින සිසු සිසුවියන් සඳහා 2012 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා සති අන්ත දහයක් නේවාසිකව පවත්වනු ලැබේ. මේ වැඩසටහන හා සමගාමීව මෙවර පිළිගත් විශ්ව විද්‍යාල ආචාර්ය මඩුල්ලක් සම්පත් දායකයින් ලෙස මඟ පෙන්වනු ලබන පරිගණක පාඨමාලා දෙකක් පරිගණක වැඩසටහන් ඩිප්ලෝමාව (DICA) සහ ග්‍රැෆික් ඩිසයිනින් පිළිබඳ සහතික පත්‍රය (CIGD) ලෙස පැවැත්වේ.

අයදුම් පත් සහ විස්තර පත්‍රිකා රු. 100/= ක් ගෙවා පහත සඳහන් ලිපිනයෙන් හෝ තමන්ගේ නම සහ ලිපිනය ලියූ, දිග මුද්දර කවරයක් සමඟ රු. 100/= මුදල් ඇණවුමක් (ජාඇල තැපැල් කාර්යාලය ලෙස) එවා තැපෑලෙන් ද ලබාගත හැකිය.

අයදුම් පත් භාරග න්නා අවසාන දිනය 2012 සැප්තැම්බර් මස 08 වෙනිදායි.

ගරු අධ්‍යක්ෂ පියතුමා, දෙවන ජුවාම් පාවුළු මධ්‍යස්ථානය මාඑළිය, ජාඇල,
දු.ක. 011-2236251

## බදුල්ලේ කතෝලික තරුණ පරපුරේ අළුත් එකමුතුවක්



බදුල්ල සා. මරියා ආසන දෙව්මැඳුරේ තරුණ තරුණියන්ට නව ජීවයක් ලබාදෙමින්, කතෝලික තරුණ සමිතිය ප්‍රතිසංවිධාන කිරීමේ අරමුණින් විශේෂ දේව මෙහෙයක් පැවැත්විණි. මීසම් සේවක ගරු ප්‍රියලාල් කුරේ සහ සහායක ගරු රොබට් ජේකබ් පියතුමන් ඊට මුල්විය. පියතුමන් ඇතුලු මීසමේ තරුණ තරුණියේ ප්‍රදීප කැමරාව හමුවේ.

ශ්‍රීකාන්ති ගුණවර්ධන



රාගම මීසමේ දිව්‍ය හෘද සමිතියේ වාර්ෂික සංවත්සර උත්සවයෙන් පසු මීසම් සේවක ගරු සෑම් කුවින්ටස් පෙරේරා පියතුමා හා සභාපති රෙජිනෝල්ඩ් සොයිසා මහතා සමඟ සාමාජික සාමාජිකාවෝ ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු.

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2012 සැප්තැම්බර් 02 ඉරිදා

# ගබ්සාව ඉදිරියේ කළලය නඟන හඬ

දරු සම්පත පිළිබඳව කතෝලික ඉගැන්වීම ඉතා පැහැදිලියි. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව සිය 'නූතන ලෝකය තුළ ශුද්ධ වූ සභාව' නමැති ශුද්ධාසන ව්‍යවස්ථාවෙහි පැහැදිලිව සඳහන් කර ඇති පරිදි දෙමව්පියන්ගේ අභිවෘද්ධිය උදෙසා දෙවිඳුන් වෙතින් ත්‍යාග සේ ලබන දරුවන්ගේ පැවැත්ම විවාහය නමැති සක්‍රමේන්තුව තුළින් හා අත්‍යන්ත ප්‍රේමය නමැති දීමනාවෙන් සුරැකිය යුතුයි. මේ ඉගැන්වීම ශුද්ධාසනයේ මුල් කාලීන ඉගැන්වීම් හරහාම පැවැත එන්නක් නිසා එදත් අදත් ඇගේ ඉගැන්වීම තුළ මේ අවධානය දැඩිවම පවතින්නකි.

ජීවිත සුරැකීම සෑම ආගමකම මූලික ඉගැන්වීම් තුළින් විද්‍යාමානවේ. එම ඉගැන්වීමට පිටුපාන්නා එකී දහම තුළ තවදුරටත් ජීවත් වන්නෙක් නොවේ. ඊටත් වඩා පටු චේතනාවන්ගෙන් හා කෙටි කාලීන සුවදායකත්වයෙන් ජීවිතය අන්ධ කර ගන්නා තුළ රැඳී පවතින්නේ තමන් පමණක් සුරක්ෂිත වූවොත් සීහේය යන්නයි. එය කෙලෙසවත් අනුමත කළ හැක්කක් නොවේ. ජීවිතයක් නැති කරන්නේ කුමන අවස්ථාවකදී ද යන්න අද විවාදයකට තුඩු දිය යුතු ප්‍රශ්නයක් නොවේ. කළලයක ආරම්භයේ සිටම ජීවිතයක් උත්පාද වෙන්නේ නම් ඒ කළලය විනාශ කිරීමේ අරමුණින් නීති සම්පාදනය කිරීමට ජීවිත අයිතිය සපුරා සුරකින්නට ප්‍රතිඥා දෙන රජයකට කළ හැක්කක් නොවේ. ඒ ජීවිත විනාශ කිරීමේ ක්‍රියාදාමයට තම වෘත්තිය නිපුනතාවයෙන් මුදල මුල් කොට ගෙන ක්‍රියා කරන්නට කිසිදු වෛද්‍යවරයකුට අයිතියක්ද ඇත්තේ නොවේ. ගබ්සාවකින් පසු අනෙක් දරුවන්ගේ ජීවිතයට ආදරය කරන බවට මුසා බස් දෙඩීම කිසිම මවකට, පියෙකුට අවංකත්වයෙන් කළ හැක්කක් ද නොවේ.

කථාවට බඳුන් වන ඒ සියලු ආදීනව පෙන්වා දෙමින් කවදත් ජීවිත අයිතිය තුළ සමානත්වයෙන් කටයුතු කළ ශුද්ධාසන ඉගැන්වීම් වලින් ගැබ්බරව කටයුතු කරන දේශිය කතෝලික සමූහය නැවතත් රට හමුවේ තිබෙන ගබ්සාව නීති ගත කිරීමේ නීති කෙටුම්පත් ඉදිරියේ සිය හඬ අවදි කරවීම සැබවින්ම ප්‍රශංසා කටයුතුයි. එය එසේ විය යුත්තක් මයි. එකී නීති පනත් සම්පාදනය කරන්නට මේ දේශයේ දේශපාලන බල ව්‍යුහය කතිකා කරන්නේ මන්ද යන්නම විමතියට කරුණකි. ධර්මද්වීපය නමින් ප්‍රකටව පැවති මේ දේශය, මේ අන්දමින් තවමත් වරදක් කර නොමැති අහිංසකයින් දහස් ගණනින් මරා දමන්නට තරම් පිරිහුනු මානසිකත්වයකට ඇද වැටුනේ මන්ද? කිසිදු ආගමික ධර්මතාවයක් අනුමත නොකරන මේ 'ගබ්සාව' නීතිගත කරන්නට හා එකී ජීවිත විනාශයට දායක වන්නට පාලනාධිකාරියට ඇති වුවමනාව කුමක්ද?

ගබ්සාව සාධාරණීකරණය කරන්නට පෙරට එන්නෝ විවිධ උපකල්පන හා හේතු ගණනාවක් ඉදිරිපත් කරති. දරිද්‍රතාව, අවිවාහකව ගැබ් ගැනීම, අනියම් සබඳතා, දූෂණයට ලක්වීම, පවුල් සැලසුම් ක්‍රම අසාර්ථක වීම සහ අනාගත සැලසුම් සඳහා ගර්භණීභාවය බාධාවක් වීම ඒ අතර ප්‍රධානය. දැනට ඇති සම්මතය අනුව මේ දේශයේ ගබ්සාවට ඉඩක් නොමැත. ඒ නිසාම අනියම් අයුරින් මෙය ඉටුකර ගන්නට නීති විරෝධි මධ්‍යස්ථාන වෙත රැස් වන්නන්ගේ අඩුවක් නොමැති බවක් පෙනීයනු ලබයි.

සමහර විට සැමියන්ගේ හා පිරිමින්ගේ බලපෑම මත අකමැත්තෙන් වුවත් එකී නීති විරෝධි මධ්‍යස්ථාන වෙත කාන්තාවන් පා තබන්නේ කළ යුතු වෙනකක් නොමැති නිසා වන්නට පිළිවන. ඉතා ග්‍රාම්‍ය ආකාරයට සිදුවන මෙම ගබ්සාවන් නිසා අඳුරු වන්නේ ඒ කළලය පමණක් නොව මවගේ ද ජීවිතයයි. කෙසේ හෝ ගබ්සාවක් සිදු විය යුතුමය යන තැනට ගමන් කරන පිරිමියා නිසා ගැබ තුළ දරුවා විනාශ කිරීමක් සිදු වූවත් ඉන් පසුව කාන්තාව බරපතළ ලෙස රෝගී වී මියයාමට පවා ඇති වන දැඩි අවදානම ගැන කතා කරන්නේ කවුරුන්ද යන්න ප්‍රශ්නයකි. අද තවත් විශාල ප්‍රශ්නයක් වී ඇත්තේ එලෙස මිය යන කාන්තාවන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යාමයි. විෂබීජ හරණය නොකළ විවිධ ද්‍රව්‍යයන් නිසා භයානක විෂබීජ රාශියක් කාන්තාවගේ සිරුරට ඇතුළු වන නිසා ජීවත් වන අනෙකුත් දරුවන්ටත් එයින් ඇතිවන අහිතකරතාව ඉතා ඉහළයි. නිර්වායු පරිසරයක් තුළ රුධිරය මත ගණනය වන එම විෂබීජ නිසා ජීවිත විනාශ වීමේ අවදානම කිසිදු ලෙසකින් අවම කළ හැකි නොවේ. 'ගබ්සාව' නිසා ජීවත්වන්නන්ගේ ජීවිත අහිමි වීමක් එලෙස සිදුවන විට එයට ප්‍රතිකාර ලබා ගැන්මකට තිබෙන අවකාශ ද ඉතා විරලයි.

ඒ පමණක් නොව විවිධ ගබ්සා ක්‍රමවේද නිසා ගර්භාෂය සිදුරු වීම් සහ රුධිර කැටි මගින් පැලෝපීය නාල අවහිර වීම මත කාන්තාවන්ගේ වඳභාවය ද ඉහළ ප්‍රතිශතයක් ගනිමින් පවතී. ඒ නිසාම අවුල් වූ පවුල් සංඛ්‍යාව ඉමහත්ය. සමාජයේ එලෙස පවත්නා ප්‍රශ්න හමුවේ සාධාරණව ගබ්සාව නීති ගත කිරීමක් කළ යුතු බවට හඬ නගන්නන්ගේ ශබ්දය ද යම් තරමකට ඇසෙන මානයට පැමිණ ඇත. එය කාන්තා මුවින්ම ඉදිරිපත් වීම නම් අති ශෝචනියයි. එහෙත් කාන්තාව තුළ වැඩෙන, කාන්තාවගෙන් ස්වායත්ත වූ ජීවියා මරා දැමීමට කාන්තාවට අයිතියක් තිබේද? වැඩිහිටියන් කරන ක්‍රියාවන් හේතුවෙන් මේ ලෝකයේ කාටවත් වරදක් කර නොමැති අහිංසක ජීවයක් විනාශ කිරිම සාධාරණීකරණය කළ හැක්කේ කෙසේද?

මේ ප්‍රශ්නය හමුවේ ජීවිතය සුරැකීමේ ප්‍රතිඥාව මත කොළඹ අගරදගුරු පදවියේ එකී කතෝලික කණ්ඩායම එක්තැන්වීම හා හඬක් නැගීම ප්‍රශංසනීයයි. ඒ හඬ සමාජයේ අස්සක් මුල්ලක් නෑර සිසාරා විහිද යවන්නට ගන්නාවූ ආධ්‍යාත්මික ජීව බලයට ගබ්සාව ඉදිරියේ කළලය නඟන හඬත් මුසු කළ හැකි නම් හඬා වැටෙන ආධ්‍යාත්මයේ කඳුළු පිස ලන්නට යම් ශක්තියක් එයින් උත්පාද කරන්නට තවත් පිටිබලයක් ලැබෙනු ඇත යන්න අප විශ්වාසයයි.

# සාර්ථකව නිමාවූ "2012 සලාපුර පදවි දහම් කතිකාව"




"සමිඳුන් වෙතටමය" යන තේමාව සහ "අප ගැන මදකුත් නොතකා කැපවී ඔබ සඳහා" යන තේමා ගීතය පාදක කර ගනිමින් 2012 අගෝස්තු 20, 21, 22 තෙදින තුළ තලවිල සා. ආනා ජාතික සිද්ධස්ථාන භූමියේ පැවති 2012 සලාපුර පදවි දහම් කතිකාව ඉතා සාර්ථක ලෙස පසුගියදා නිමාවට පත්විය. සභා නවෝදයක් කරා යන ගමනේදී ශුද්ධාත්ම මඟ පෙන්වීම තුළ පදවියක් ලෙස තවත් පියවරක් ඉදිරියට තබමින් ගිහි, පැවිදි, පූජක වශයෙන් අත්වැල් බැඳ ගනිමින් පැවැත්වූ මෙම දහම් කතිකාවේ අන්තර්ගතය මෙලෙස කැටිකොට දක්වමු.

2012 අගෝස්තු මස 20 වන දින පෙ.ව. 8.00 ට සලාපුර රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස්, මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු, බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු සහ සලාපුර පදවි පරිපාලක හා අනුනායක පියතුමාගේ ප්‍රධානත්වයෙන් ගිහි පැවිදි පූජක 600 කට වැඩි පිරිකගේ සහභාගිත්වයෙන් පැවති දිව්‍ය පූජා යාගයෙන් මෙම දහම් කතිකාවේ සමාරම්භය සිදුවිය. සැසිවාර 11 කින් සමන්විතවු මෙම කතිකාවේ සෑම සැසිවාරයක් ආරම්භයේදීම කෙටි දේශනයක්, මුලසුන ගැනීමක් හා සෑම අයෙකුටම විනාඩි දෙකක අදහස් දැක්වීමක් ඇතුළත් විය. සැසිවාරයන්හිදී සාකච්ඡාවට බඳුන්වූ කරුණු මෙසේය.

**2012.08.20**

**01 සැසිවාරය 'ජනවන්දනාව'**

මෙහිදී දිව්‍ය සත්ප්‍රසාදය තුළ වැඩවසන ජේසුතුමන්ට මහත් ගෞරවයක් හා භක්තියක් දැක්විය යුතු බව ප්‍රධාන ලෙස අවධානයට යොමු කරන ලදී. ඒ අනුව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගැනීමේදී දණ නමා එය ලබා ගත යුතු බවත්, චාම් ඇඳුම් දෙව් මැඳුරට භාවිත කිරිම යෝග්‍ය බවත්, විශේෂයෙන් කාන්තා පක්ෂය වේලය පැළඳීම යෝග්‍ය බවත් මෙම සැසිවාරය තුළදී නිර්දේශ විය.

**02. සැසිවාරය 'කිතුනු පවුල'**

කිතුනු පවුල් ජීවිතයේ ශුද්ධවන්ත බව, කිතුනු පවුල් මුහුණ දෙන ප්‍රශ්න හා අභියෝග, ගබ්සාව හා දික්කසාදය යන ගැටලු පිළිබඳව මෙම සැසිවාරය තුළදී සාකච්ඡාවට බඳුන් විය.

**03 සැසිවාරය 'ජන සන්නිවේදනය'**

ජන සන්නිවේදනය සභාවට බලපාන ආකාරය හා එය සභාවේ ප්‍රගතිය සඳහා යොදාගත හැකි ආකාරය පිළිබඳව මෙහිදී මූලික වශයෙන් අදහස් පළ කරන ලදී.

**04 සැසිවාරය 'සමාජ සාධාරණය, සාමය හා මානව සංවර්ධනය'**

මෙලෙස කතිකාවතේ පළමු දිනය පැවති සැසිවාර 04 කින් අනතුරුව දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවෙන් නිමාවට පත්විය.

**2012.08.21**

සිරිත් පරිදි දිව්‍ය පූජා යාගයෙන් ඇරඹි දෙවන දිනයේ පැවති සැසිවාරයන් මෙසේය.

**05. සැසිවාරය 'අධ්‍යාපනය'**

කතෝලික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පැන නැගී ඇති ගැටලු හා ඒවාට ගත යුතු පියවර, උසස් අධ්‍යාපන ආයතන හා තවත් පාසලක අවශ්‍යතාවය පිළිබඳව මෙහිදී අවධානය යොමු කෙරිණි.

**06 සැසිවාරය: 'බයිබල් අපෝස්තලික සේවාව හා ධර්මෝපදේශය'**

දරුවන්ගේ ආත්මික පෝෂණය, දහම් පාසල් අධ්‍යාපනය හා මූලධර්මවාදීන්ගෙන් සභාවට එල්ලවන අභියෝග පිළිබඳව මෙහිදී අදහස් පළ කෙරිණි.

**07 සැසිවාරය: 'සභාවේ පූජක පැවිදි දූත සේවාව'**

මෙහිදී විශේෂ කොටම සිංහල පූජක පැවිදි වරුන් දමිල බස උගෙන දමිළ ජනතාවට කරන්නාවූ උදාර දූත මෙහෙවර ගිහි ජනතාවගේ ප්‍රසාදයට ලක්විය.

**08. සැසිවාරය: 'තරුණ පරපුර හා තරුණ සේවාව'**

මෙහිදී විශේෂ කොටම වැඩිදුර අධ්‍යාපනයක් නොලද තරුණ තරුණියන් සඳහා කාර්මික පුහුණු ආයතනයක් ආරම්භ කිරීමට අවධානය යොමු වූ අතර ඒ සඳහා සැලේසියාන නිකායට ආරාධනයක් කරන ලදී.

**09 සැසිවාරය: 'ගිහි ආධ්‍යාත්මිකත්වය සහ යැදුම් දිවිය'**

**10. සැසිවාරය: 'ආගමික සුභදතාවය'**

මෙම සැසිවාරයන්ගෙන් අනතුරුව සලාපුර රදගුරු හිම්පාණන් තම පදවියේ පූජාප්‍රසාදි තුමන්ලා සමඟින් පැවැත්වූ සාකච්ඡා මණ්ඩපයෙන් එදින කටයුතු නිමාවිය.

**2012.08.22**

කතිකාවතේ අවසන් දිනය වූ මෙදින දිව්‍ය පූජා යාගයෙන් සැසිවාර ආරම්භ කෙරිණි.

**11 සැසිවාරය 'ධර්මදානය හා පදවි දූත සේවාව'**

මෙහිදී ගිහි දූත සේවාව වෙත විශේෂ අවධානයක් යොමුවිය.

මෙම සැසිවාර 11 න් අනතුරුව ඉදිරිපත්වූ අදහස් ඇසුරින් සකස් කරන ලද කෙටුම්පත් සලාපුර රදගුරු හිම්පාණන් විසින් පූජක පැවිදි ගිහි ජනතාව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ ඇසුරින් අවසාන නිගමන හා තීරණ වලට එළඹෙන ලදී. ගිහි ජනතාව විසින් කරන ලද ඉල්ලීමකට අනුව සලාපුර රදගුරු හිම්පාණන් විසින් ගිහි සැදැහැවතුන් සමඟ විවෘත සාකච්ඡා මණ්ඩපයක්ද මෙහිදී පැවැත්විය. ඔවුන්ගේ බලවත් ඉල්ලීම පරිදි අවම වශයෙන් වසර 05 කට වරක්වත් මෙවැනි දහම් කතිකාවතක් පැවැත්වීමට තීරණය කර ගන්නා ලදී. එදින සවස 4.00 ට පැවති තුති ප්‍රශංසා දේව මෙහෙයෙන් අනතුරුව 2012 සලාපුර පදවි දහම් කතිකාව නිමාවට පත්විය.

මෙම දහම් කතිකාව සාර්ථක කරගැනීම සඳහා කොළඹ විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිම්පාණන්ද, වත්මන් සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිම්පාණන්ද, ලංකාව පුරා විසිරී සිටින සෑම නිකායකම ශ්‍රේෂ්ඨ පියතුමන්ලාද, පැවිදි සොයුරියන්ද, වෙනත් පදවි වල අනුනායක පියවරුන් හා පූජකතුමන්ලාද සහභාගි වී සිටීම විශේෂත්වයකි.

බෝලවත්ත දිසානායක හා ගෝනවිල මීසම් සේවක
**ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමා**

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



# අධ්‍යාත්මික ගුණ වගාව උදෙසා වැය වන්න

## කාදිනල් හිමිපාණෝ ඉල්ලා සිටිති

**ජනතාව තුළ අධ්‍යාත්මික ගුණ වගාව වර්ධනය කළ යුතු බවට වැඩිපුර කතාබහ සිදුවන මෙවැනි යුගයක, පාසල් දරුවන් තුළ සිය ඇතුලාන්ත ශක්තිය හා අධ්‍යාත්මික පැවැත්ම ඇති කිරීම සඳහා අධ්‍යාපනය මගින් නිවැරදි මඟ පෙන්වීමක් කළ යුතුව ඇතැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කළහ.**

කාදිනල් හිමිපාණන් මේ අදහස් පළ කළේ පන්නිපිටිය ක්‍රිස්තු රාජ විදුහලේ නවීකරනය කරන ලද ක්‍රීඩාංගනය විවෘත කර ආසිරි ගැන්වීම වෙනුවෙන් පැවති උත්සවයේදීය. කෙටි යැදුම් මෙහෙයකින් අනතුරුව සමරු ඵලකය නිරාවරණය කොට කාදිනල් හිමිපාණන් අතින් නව ක්‍රීඩාංගනය විවෘත විය.

උත්සවයට එක් වූ කම්කරු සම්බන්ධතා හා නිපුණතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා කාදිනල් හිමිපාණන්ගේ පැමිණීම ප්‍රදේශයට ගෞරවයක් බවත්, ක්‍රිස්තු රාජ විදුහලේ සේවාව තමා හැමවිටම අගයන බවත් පැවසීය.

විදුහල්පතිනි ගරු ප්‍රියන්තා ප්‍රනාන්දු සොයුරියද මෙහිදි කථා කළ අතර දකුණු කොළඹ කලාපීය නාහිමි අතිගරු ඇන්තනි ප්‍රනාන්දු පුල්ලේ පියතුමා කතෝලික පාසල් සාමාන්‍යාධිකාරි ගරු රංජිත් මදුරාවල පියතුමා පැවදි සොහොයුරියන් ඇතුලු විශාල පිරිසක් උත්සවයට සහභාගි වූහ.

ක්‍රිස්ටෝපර් රණසිංහ



පසුගියදා බලංගොඩ තන්ජන්තැන්න ස්වර්ගාරෝපිත දේවමාතා සිද්ධස්ථාන පරිශ්‍රය එළිපහලි කිරීමේ ශ්‍රමදානයක් මිසම් සංඝයේ සැදැහැවතුන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරින. මෙම අවස්ථාවට සහභාගි වූ සිද්ධස්ථානයේ ගරු ඇලන් නිර්මලදාස් හා ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු යන ජපමාල නිකයික පියවරුන් ඡායාරූපයේ දිස්වෙන අතර එය ප්‍රදීප නෙතට හසුවූ අයුරු.

තියබෝල්ඩ් සමරතුංග

## දහමට බොරු කළ නොහැක

නූතන සමාජය ගුණධර්ම - ඇවතුම් පැවතුම් පිරිහී අසංවර සෙයක් පෙනේ. මෙවන් විෂමාචාරයකට හේතු පාදක වී ඇත්තේ බොරුවට දහමකුත්, දහමට බොරුවකුත් නොමැති බව නොදන්නා මිත්‍යා දෘෂ්ටිකයින් නිසා යැයි ගරු එම්මානුවල් ජාන්ස (දො.බො.නි) පියතුමා සිහිපත් කළේය.

එතුමා එසේ පැවසුවේ වැල්ලපල්ලිය කාර්මේල් දේවස්ථානයේ 170 වැනි වාර්ෂික මංගල දිව්‍ය යාගයේදීය.

මංගල කටයුතු මීසම් සේවක ගරු ෆීලික්ස් මැල්ලව ආරච්චි (දො.බො.නි) පියතුමා සංවිධානය කළ අතර මීසමට අනුයුක්ත සමිති සමාගම් මෙම කටයුතු සපුරා ගැනීමට දායක වූහ.

ඒ. ඩී. සුනිල්

## බලගල ලේ හා ඇස් දන්දීමේ කඳවුරක්!

බලගල දීපාලෝක සුබසාධක සංගමයේ මෙහෙයවීමෙන් ලේ සහ ඇස් දන්දීමේ කඳවුරක් සැප්තැම්බර් 08 සෙනසුරාදා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා බලගල සදාසරණ දෙව්මැඳුරේ දී මීසම් සේවක ගරු ජූඩ්රාජ් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.



මීගමුව සා. පීතර දේවස්ථානයේ සා. විසෙන්තිද පාවුලා සමිතිය මගින් වාර්ෂිකව මීසමේ අඩු ආදායම් ලාභී පවුල් සඳහා රු. 1000 කට වැඩි වටිනාකමක් ඇති හාල්, පිටි ඇතුළත් වියලි ආහාර අඩංගු පාර්සලය බැගින් බෙදා දෙනු ලැබේ. වියලි ආහාර ලබාගත් අය මීසම් සේවක ගරු ලියෝ කැමිලස් හෙට්ටිආරච්චි පියතුමා සමඟ සිටි අවස්ථාව.

රේමන් අපෝන්සු

## විශ්වාසයේ තහවුරුව සිටින්නැයි පියතුමාගෙන් සැදැහැවතුනට ආරාධනා!

තමා පිළිකා රෝගයට ගොදුරුව ඉතා අසාධ්‍යව ජීවිතයත් මරණයත් අතර නිරන්තර සටනක යෙදී සිටි බවත්, එහෙත් සමිඳුන් කෙරේ වූ අචල විශ්වාසය තුළ සමිඳුන්ගේ මධ්‍යස්ථ භාවයෙන් දේව සේවයේ යෙදෙන්නට වරම් ඉල්ලු බවත් මගේ විශ්වාසය මා සුවපත් කොට ඔබ හමුවේ දිව්‍ය පූජා යාගය ඔප්පු කරන්නට ලැබීම භාග්‍යයක් බවත් ඔබද විශ්වාසයේ තහවුරුව සිටින්න ඔබේ ජීවිත සඵලවෙනවාට කිසිම සැකයක් නැතැයි අඟුණවිල මීසමේ හිටපු මීසම් සේවක ගරු වසන්ත තිසේරා පියතුමා ප්‍රකාශ කළේය.

එතුමා මෙසේ ප්‍රකාශ කර සිටියේ එතුමන්ට සුවය පතා අඟුණවිල වන්නිමඩු මාතා දෙව්මැඳුරේ පැවති දෙවිඳුන්ට තුති පිදීමේ දේව මෙහෙයේදීය. මීසම් සේවක ගරු අනුර ගම්ලත් පියතුමාගේ මෙහෙයවීමෙන් බැතිමතුන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් මෙහෙය පැවැත්වින.

පීටර් කැමිලස් සුබසිංහ

## මෝරුක්කුලිය ස්වාමින් වහන්සේගේ අන්‍යරූප විලාශවීමේ දෙව් මැඳුර



පුදබිමක අසිරිය

ගොඩැල්ල මීසම ආරම්භයේ දෙව් මැඳුරු දෙකකින් සමන්විත විය. (තඹරවිල හා ගොඩැල්ල) මෝරුක්කුලිය ග්‍රාමයද ගොඩැල්ල සභාවට අයත් විය. 1962 මීසම් සේවක ගරු ජූලියන් ප්‍රනාන්දු පියතුමා ගොඩැල්ල ජොෂ්ඨ කාන්තා මරිය හමුදා ප්‍රසීඩියම ආරම්භ කර ග්‍රාමයේ ළමුන්ට ආගම ඉගැන්වීම සඳහා යොමු කළ අතර බෙනඩික් ප්‍රනාන්දු පුල්ලේ මහතාගේ ඉඩමේ කොස් ගහ යට උපදේශ පංති පැවැත්විය.

1968-1969 ගොඩැල්ල මීසම් සේවක ගරු බෙනඩික් ප්‍රනාන්දු පියතුමාට සිසිලියා ප්‍රනාන්දු මනුවෙල් පුල්ලේ හා ජාකොබ් ප්‍රනාන්දු නිකුලස් පුල්ලේ යුවළ සතු ඉඩම උපදේශ පන්ති පැවැත්වීම සඳහා පරිත්‍යාග කරන ලදි. පොල් අතු මඩුවක් සාදා උපදේශ පන්ති එම ඉඩමේ ආරම්භ කළ අතර දිව්‍ය පූජාව මෙහි තබා ඇත. ගරු පියතුමාට විදේශීය සංචාරයකදී ලද ජේසුන් වහන්සේගේ අන්‍යරූප විලාශවීමේ ප්‍රතිමාව පොල් අතු මඩුවේ තබා දෙව් මැඳුර ඊට කැපකළේය. පසුව මීසම් සේවක වූ ගරු ටෙරන්ස් ප්‍රනාන්දු පියතුමා පොල් අතු පල්ලිය වෙනුවට ස්ථිර ගොඩනැගිල්ලක් සඳහා මුල් ගල් තැබීය.

ගරු සෙබස්තියන් පියතුමාගේ සේවා කාලයේ දී (1974-1976) දෙව් මැඳුරේ ලිඳ සෑදු අතර, එම ලිඳේ ප්‍රධාන ජල උල්පත දෙව්මැඳුරේ ප්‍රධාන කුරුස ප්‍රතිමාව දෙසින් ගලන නිසා, එම ජලය ජේසුව ස්නානය කළ ජලය ලෙස පාවිච්චි කරන්නයැයි උපදෙස් ලැබිණ. ගරු බීඩ් ප්‍රනාන්දු පිය සමයේ දෙව් මැඳුරට හා ගමටම විදුලිය ලබා ගැනීමට හැකි විය. 1981 ගොඩැල්ලේ සිරිල් පෙරේරාගේ මඟපෙන්වීම හා සංවිධානයෙන් මරිය හමුදා ප්‍රසීඩියම් තුනක් ආරම්භ කැරිණ.

මෝරුක්කුලිය දෙව් මැඳුරේ කතෝලික පවුල් සංඛ්‍යාව 383 කි. දහම් පාසල සඳහා ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක් සෑදීම ආරම්භ කර ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රී නිරෝෂන් පෙරේරා මැතිතුමාගේ මූලිකත්වයෙන් දෙව් මැඳුරට ජල පහසුකම් ලබාදුන් අතර දෙව්මැඳුරේ ශ්‍රී හෘදය සමිතිය, පූජා උදවු සමිතිය, ගායනා කණ්ඩායම, තරුණ සමිතිය ක්‍රියාත්මක වේ. නව මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් ප්‍රියකාන්ත පියතුමා සහ සහයක ගරු දිනේෂ් දුමින්ද පියතුමා ජනතාවගේ ආත්මික කටයුතු වර්ධනය කිරීම සඳහා කටයුතු කරමින් සිටියි. දෙව් මැඳුරේ අතීත තොරතුරු සොයා යෑමේ දී දොමිනික් ඩෙන්සිල් මහතාගෙන් ලැබූ සහයෝගයට ස්තුතියි.

එච්. ඒ. සිරිල් පෙරේරා

## මාතලේ මංගල උලෙළ

මාතලේ සා. තෝමස් දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය ඉකුත් දා පැවැත්වුනි. සන්ධ්‍යා මෙහෙය අම්පිටිය ජාතික දෙවිසත්හලේ අධ්‍යක්ෂ ගරු එල්මෝ ඩයස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මංගල මෙහෙය මහනුවර රදගුරු අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන් විසින් සිදුකරන ලදී. පෙරහර මාතලේ නගරය පුරා වීදි සංචාරය කළේ බැතිමතුන් රැසකගේ සහභාගිත්වයෙනි.

මාතලේ මීසම් සේවක හා දිසානායක ගරු ඩිලාන් ප්‍රනාන්දු දිසනි හා සහයක පියතුමන්ගේ සහභාගිත්වයෙන් කටයුතු සංවිධානය කරන ලදි.

ඒ. ආර්. එන්. මඩසේකර



කුඩා පයාගල පරලෝකරාජේශ්වරි දෙව්මැඳුරේ 137 වන වාර්ෂික මංගල සන්ධ්‍යා මෙහෙය දකුණු කොළඹ කලාපීය නාහිමි අතිගරු ආචාර්ය ඇන්තනි ප්‍රනාන්දු පුල්ලේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකැරිණ. මංගල දිව්‍ය යාගය කළුතර සිරිකුරුස විදුහලේ අධ්‍යක්ෂ මීසම් පුත් ගරු ආචාර්ය කැමිලස් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. මීසම් සේවක ගරු නිලන්ත උඩුවක පියතුමාගේ මඟපෙන්වීම යටතේ මෙම මංගල්‍යය වෙනුවෙන් ජනතාවගේ අධ්‍යාත්මික වර්ධනය සඳහා වැඩ සටහන් කීපයක් ක්‍රියාත්මක විය. මංගල පෙරහර ගමන් ගත් අයුරු.

ජේ. නිහාල් ප්‍රනාන්දු



කණුවන මීසමේ 'සුරැකි පිය නිවසේ' පැවති තුඩැල්ල දිසාවේ දහම් ගුරු පෝය දින හමුවේදි 'ජාතින්ගේ ආලෝකය නමැති වතිකාන ප්‍රකාශනය ගැන වියත් දේශක කඩවත මීසම් සේවක ගරු සුනිල් කුමාර පීරිස් පියතුමා දෙසුමක් පැවැත්වූ අයුරු.

ෂර්ලි පෙරේරා

## ස්නායු රෝගය සුවවූ බවට මවක් සාක්ෂි දරයි

ස්නායු රෝගීන්ට සහනය දෙන සා. ඩිප්නා මුනී මංගල්‍ය මහත් ජනකායක් මැද පසුගියදා අත්තන්ගනයේදී රාජකදළුව මීසම් සේවක ගරු ප්‍රසාද් චමින්ද පියතුමාගේ ආරාධනාවෙන් හලාවත පදවි වින්සන් ද පාවුලා අධ්‍යක්ෂ ගරු ක්වින්ටස් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකැරිණ. ගරු සීමන් ප්‍රැක්සිඩ් පියතුමාද සහය විය.

ස්නායු රෝගයකින් තම දරුවා සුවවීමෙ ප්‍රාතිහාර්ය ගැන මවක් මංගල්‍යය අවස්ථාවේදී සාක්ෂි දැරූ අතර විවිධ ආබාධ වලින් පෙලෙන්නන් සිය ගණනක් සුවය පතා දුර බැහැර පළාත් වලින් පැමිණ සිටියහ. මංගල්‍යය මහා පූජාව අවසානයේ සැදැහැවත් ජනතාව සඳහා දානයක්ද පිරිනමන ලදී.

ක්‍රිස්ටෝපර් ජාන්ස

# මැයි භක්ති අභ්‍යාසයෙන් ආරම්භ වන මරිය බැතිය



**වසන්ත සෘතුව සමඟ එන වෙසක් මාසය මරිමව්ට ප්‍රිය වූ මාසයකි. මරියතුමිය කිතුනු ජන වන්දනාවේ අද්විතීය තැනක් ලබන්නාවූ තැනැත්තියයි.**

වසරේ සෑම සෙනසුරාදාවක්ම ඇයට කැපවී තිබෙන අතර, ඇගේ කුමක් හෝ මංගලෝත්සවයක් නැති මාසයක් නැති ගානයි. වෙසක් සහ වප් මාස මරිය බැතියටම සුවිශේෂ වූ දෙමසකි. එහෙත් මැයි භක්ති අභ්‍යාසයන්හි සුල මුල මුල් කිතුනු යුගය දක්වා දිග හැරෙන්නකි. මරිය තුමිය ක්‍රිස්තු භක්තිකයන්ගේ භක්ත්‍යාදරයට පාත්‍ර වූයේ කිනම් යුගයක දැයි විමසනු වටී. රෝමානු ප්‍රජාව කිතු දහම ඇදහීමට පටන් ගත් යුගයේම මරිය තුමියට ලොල් වූ ජනතාවක් ඇතිවූවාට සැක නැත. කිතුදහම වැළඳගත් රෝමානුවෝ, පැරණි ගතානුගතික අදේවවාදී ඇදහිලි මිශ්‍ර කළෝ ය. ජේසු ඇදහීමට අමතරව ඔවුන් රෝමානු දෙව් දුවක් වූ වීනස් දේවතාවිය ද ඇදහූහ. මෙය නොරිස්සූ පාප් තුමා වීනස් වන්දනාවට දේව මාතා භක්තිය ආදේශ කළ සේක.

මේ කාල වකවානුව, මරිය භක්තියේ මූලාරම්භය ලෙස ගිනිය හැකිය. එහෙත් මරි මව් බැතිය වර්ධනය වූයේ ක්‍රි.ව. 13 වැනි සියවසේ බව සහා ඉතිහාසය හැදෑරීමෙන් පෙනේ. එහෙත් මරිය බැතිය ආරම්භ වූයේ වසන්ත සෘතුව එළඹීමක්. මල් පිපීමක් නිසා ඇති වූ පැරණි අදේවවාදී උලෙළක් හරහා බව සිතිය හැකිය. වසන්තයේ මල් පිපීම "ෆ්ලොරලියා" දේවතාව විසින් කරන ලද්දක් යැයි පැරණි රෝමානුවෝ සිතූහ. මේ සමය ක්‍රි. පූ. 250 පමණ විය. ජර්මානුවරුන් ද මල් දෙව්දුව පිදූහ. මෙය 13 ශත වසර වෙද්දී යුරෝපාකරයේ සෑම රටකට පාහේ පැතිරිණි. එහෙත් යුරෝපා කිතුනු ප්‍රජාව මෙය මරිය බැති උලෙළකට පරිවර්තනය කළෝ ය. ඉතාලිය, ස්පාඤ්ඤය, එංගලන්තය, ෆ්ලොරලියා මංගල්‍යය මරිමව් මංගල්‍යයකට වෙනස් කළෝ ය. ආරම්භයේ දී මේ බැතිය ගෘහ වලට පමණක් සීමා වූ බවක් පෙනේ.

කාලයාගේ ඇවෑමෙන් එවකට සුදු සබය හෙබවූ අති උතුම් හත්වෙනි පියුස් සුදු පියාගේ අවධානයට ලක් වූහ. උන්වහන්සේ ස්වකීය 1815.03.21 දාතම දරණ චක්‍රලේඛයෙන් මරිය බැතිය අනුමත කරමින් පරිපූර්ණ එල එම අභ්‍යාසයන්ට දානය කළ සේක. ආචාර්ය ජෙන්ටිල් නමැත්තා එය ඉතාලියේ ප්‍රචලිත කළ අතර, 18 වෙනි ශත වසරදී තවත් ඉතාලි ජාතිකයෙක් මරිය බැතිය රටපුරා ව්‍යාප්ත කළේ ය. ඔහු හනිබාල් දියෝනිස් නමැත්තෙකි. මේ කාල පරාසය තුළ වෙසක් බැතිය, බෙල්ජියම, ඔස්ට්‍රියාව හා ස්විට්සර්ලන්තයට ද පැතිරී තිබුණි. ආරම්භයේ ගෘහස්ථ අභ්‍යාසයක් ලෙස කරළියට ආ මැයි මරිය බැතිය පසුව තාපසාරාම හරහා පදවි හරහා විශ්වය සිසාරා පැතිර ගියේ ලැව්ගින්නක් මෙනි.

මැයි බැතිය ක්‍රි.පූ. යුගයේ මල් මංගල්‍යයක් ලෙස ආරම්භ විය. රෝම පුරවරයෙන් උපත ලබා, යථා කාලයේ දී ප්‍රංශය, ජර්මනිය, එංගලන්තය ඇතුළු යුරෝපාකරයට පොදුවූ උලෙලක්ව තිබිණි. මැයි මාසය පුරා උත්සව පැවැත්වුණු අතර, මංගල්‍යයේ කේන්ද්‍රීය ස්ථානය යෞවන යෞවනියන්ට හිමිවිය. උත්සවයේ උත්කෘෂ්ඨතම අංගය වූයේ මැයි කුමරා හා මැයි කුමරිය තේරීමේ තරගයයි. රට රටවල එම උලෙළ විවිධාකාර නම් වලින් හැඳින්විණි. විචිත්‍ර මල් කලඹ සෑදීම, මේපෝල් නම් මල් ගස සාදා එය සැරසීම විශේෂිත වූ අංගයන් ය.

☛ 15 පිටුවට

✍ ලෙනාඩ් ර. මහආරච්චි
මොරටුව

## දිව්‍ය ගැලවුම්කරුවාණන් වහන්සේ මෙලොවට බිහි කළා වූ උත්තරීතර මාතාව, එනම් දේව මවගේ උපන් දිනය සමරන්නට සාන්ත සභා මාතාව සූදානම් වන සැප්තැම්බර් අටවන දිනයේ එතුමිය පසසන්නට මෙවදන් වැල උපහාරයක් වේවා!

# මරියතුමියගේ උපත හා ශුද්ධවූ ජපමාලය



දෙවියන් වහන්සේ ආදම් සහ ඒව මවා ස්වල්ප කාලයකට පසුව ඒ දෙදෙනා දෙව් අණ කඩ කළා. ඉන්පසු ඒ දෙදෙනාගේ පෙළපත ක්‍රමයෙන් වැඩි වර්ධනය වනුයේ දාවිත් රජ පරපුර දක්වා වර්ධනය වෙමින් පැවැතියේය. දාවිත්ගේ ගෝත්‍රයෙන් ඥානා ප්‍රදීප දෙකක් පහළ විය. ඒ ප්‍රදීප නම් ශුද්ධවූ ජුවකීනු සහ ශුද්ධවූ ආනා තුමිය වේ. නියම කාලයේ දී ගාබ්‍රියෙල් නම් අග්‍රදූතයා දර්ශනය වී ජුවකීනු තුමා හා විවාහ වීම දේව අභිමතය යැයි ප්‍රකාශ කළේය. එතෙකින් නොනැවතී ජුවකීනු තුමාට දර්ශනය වී "නුඹ ආනාතුමිය විවාහ කර ගැනීම දේව අභිප්‍රාය වන්නේ යයි කීය. මේ දෙදෙනා ඊට කීකරුව විවාහ වූ නමුත් විසි වසක් ගතවන තුරු දරු ඵලක් නොලද්දේ ය.

එවකට පැවැති සිරිත් ලෙස දරුඵල නොලැබ සිටීම මහත් නින්දාවකි. නමුත් දෙවියන් වහන්සේගේ නියම කාලය සපැමිණියෙන් ආනාතුමියගේ වඳ කාලය අහෝසි විය. ජුවකීනු තුමාට 66 වසක් ද, ආනා තුමියට 44 වසක් ද, සම්පූර්ණ වූ කල දෙව් පියාණන් වහන්සේ ආනාතුමියගේ ගර්භයේ මේ මෝක්ෂ රාජේශ්වරිය වූ අතිශය රූප ශෝභාවෙන් සපිරි පරිශුද්ධ කන්‍යා මරියෝත්තමාවන් පිළිසිඳවීමට සැලැස්වූ සේක.

දිව්‍ය වරප්‍රසාදයෙන් අලංකෘත කරනු ලැබ, විශ්වාසයේ ස්ථිර කරනු ලැබ, අචල පර්වතයක් මෙන් නොසැලී සිටි ආනා තුමිය දෙව් මහෝත්තමයාණන් වහන්සේට තුති දීමෙන් නියම කාලය සම්පූර්ණ වූ පසු දෙවියන් වහන්සේගේ මහත් කරුණාවෙන් ඒ පාරිශුද්ධ ළදැරිය මෙලොවට බිහි වූවාය. දිනය සැප්තැම්බර් අටවන දා ය. දෙවියන් වහන්සේ එතුමිය තමන් සකල මැවිල්ලේම රාජේශ්වරියකොට වැඩ සිටීමට සැලැස්වූ සේක. "ඕ තුමිය "මරියා" යයි නාමයෙන් නම් කරනු ලැබුවාය. එතුමිය මයීහදාව, බැහැපත්කම, කීකරුකම ඇතිව වැඩෙන්නට විය.

මරියතුමියට වයස දොළොසක් වූ කාලයේ දී තම පෙම්බර මැණියන්ගේ මරණ ප්‍රාප්තිය සමීප බව දැනගත්තාය. ආනා තුමිය ද තම දියණිය මෙසියස් තුමාට මව් වන බව දැන සිටි නමුත්, ඒ ගැන කිසිත් නොකීවාය. යුදා ගෝත්‍රයේ දවිඳු රාජ වංශවතකු සමඟ විවාහ වීමට දෙවියන් වහන්සේ කැමැති සේක් නම් එසේ විවාහ වන්නට ප්‍රාර්ථනා කරමින් පනස් හය වර්ෂයක් ආයු වැළඳී ඕ තොමෝ කාල ක්‍රියා කළාය.

එකල මහගුරු ප්‍රසාදි වූ සිමියොන් නමැත්තෙක් ජෙරුසලමේ විසීය. දෙවියන් වහන්සේගෙන් ලැබුණු වරයක් මෙන් මරියතුමියට ස්වාමිපුරුෂයකු සොයන ලෙස ඔහුට නියම විය. ජෙරුසලෙම් නගරයේ වසන දවිඳු ගෝත්‍රයෙන් උපන් අවිවාහක තරුණයන් සියලු දෙනාටම දෙව්මැඳුරට රැස්වන ලෙසට නියෝග කෙරුණි. කන්‍යා මරිය තුමියට දස සතර වසක් සම්පූර්ණ වන අන්තිම දින දී මෙය සිදු විය. නියමිත දින දවිඳු රාජ වංශයේ උපන් සියලු තරුණයෝ දෙව්මැඳුරට රැස්වූහ. ඔවුන් අතරෙන් නාසරෙත් ග්‍රාමයේ ඉපිද, ජෙරුසෙලෙම් නුවර විසූ ජුසේ තුමාත් එක්කෙනෙකි. ඒ කාලයේ දී එතුමාට වයස අවුරුදු තිස්තුනක් විය. දෙව් පිහිටෙන් සියල්ල සිදු කරන්නට අදහස් කොට දෙවියන් වහන්සේගේ උදව්, සහය ඉල්ලා යාච්ඤා කරන්නට වන් කෙණෙහිම උන්වහන්සේ සිමියොන් තුමාට මෙසේ නියෝග කළ සේක.

තරුණයන් සියලු දෙනාම තම හස්තවල වියළි අත් දඬුව බැගින් ඇතිව ස්වාමින් වහන්සේගේ කැමැත්ත සිදුවනු සඳහා යාච්ඤා කරන්නට අණ කළ සේක. මෙයාකාරයෙන් සියලු දෙනා යාච්ඤා කරන්නට පටන් ගත් කල ජුසේ තුමාගේ දණ්ඩෙහි මල් පිපුනත් හැර එතුමාගේ හිස සිසාරා සුදු පරෙවියෙක් පියාසර කරන්නට ද වන.

දේවාභිමතයට එකඟව මරියතුමන් ජුසේ තුමාට විවාහ කර දුන්නාය. එවිට මරියතුමියට දස සතර අවුරුද්දක් ද, ජුසේ තුමාට තිස්තුන් අවුරුද්දක් ද වයස් විය. කන්‍යා මරිය තොමෝ සිමියොන් තුමා හා දිවැසිවරිය වූ අන්නා තුමියගේ හස්ත සිපාචාර කොට ජුසේ තුමාත් සමඟ දෙව් මැඳුරෙන් පිටව නාසරෙත් ග්‍රාමයට ගමන් ගත්තීය.

දේව කැමැත්තට හිස නැමූ මොහොතේ සිටම සියලුම ජීවිත අභියෝගයන්ට මුහුණ දෙමින්, සියල්ල සිත්හි නිදන් කරගෙන ජීවත් වූ එතුමිය සාන්ත සභාවේ මූලාරම්භයේ සිටම සමස්ත ලෝක වාසීන්ගේ ගෞරවාදරයට පාත්‍ර වෙමින් වැඩ සිටින්නීය. කුරුසිය පාමුල සිටි එතුමියට "මෙන්න ඔබේ මැණියෝ" කියා ජේසු සමිඳුන් ජුවාම් තුමාට තම මැණියන් භාර කළ මොහොතේ සිට ඇය අපගේත් මැණියෝ ය. එතුමිය පීඩිතයින් යහපත් දෙයින් සතපන, සූරාකන ධනවතුන් හිස් අතින් හරින, මහ නරපතින් සිහසුනින් පහත හෙළන, දේව රාජ්‍යයේ අණ පතුරවන්නිය ද වේ.

එලෙසම දේව වචනය අකුරටම පිළිපැදීමට කැප වූ ස්ත්‍රීත්වයේ ප්‍රතිමූර්තියයි. දේව රාජ්‍ය ගොඩනැඟීම සඳහා ලේ ධාරාවන් සිඳ හෙළු තම පුතු සමඟ කුරුස පාමුල දක්වා ගමන් කළ ලෝ වැසි දිරිය මාතාවයි. සෑම දෙයක්ම ඉවසීමෙන් දරා ගැනීමේ අයෝමය ශක්තියකින් එතුමිය පූර්ණ වූවාය.

☛ 15 පිටුවට

✍ අයිරින් පෙරේරා
තුඩැල්ල

## සභා පියවරු 42 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

## බයිබලීය අර්ථකථන සම්ප්‍රදාය සහ සභා පිය ප්‍රඥාව - 7

**දේව වචනය මඟින් අපගේ ජීවිතයේ අර්ථය ගැඹුරු කරවයි. එමෙන්ම අපගේ ජීවිතයේ ගුණාත්මකභාවය විසින් ද දේව වචනය තේරුම් ගැනීමේ ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි.**

මගේ ආධ්‍යාත්මිකව වර්ධනය වීමේ ක්‍රියාවලිය තුළ මට දේව වචනය වඩාත් අව්‍යාජව, වඩාත් නිවැරදිව අර්ථකථනය කළ හැකිය. අව්‍යාජ පුද්ගලයකුගේ බයිබලීය අර්ථ කථනය ද අව්‍යාජ වීමට ඇති ඉඩ කඩ බොහෝ ය.

අව්‍යාජ, සත්‍යවාදී පුද්ගලයකුට සැඟවුණු න්‍යාය පත්‍රයක් නොමැත. පටු පරමාර්ථයක් නොමැත. ඔහුගේ හෝ ඇයගේ එකම අරමුණ සත්‍යය ගවේෂණය කිරීමයි. එසේ ගවේෂණය කොට සත්‍යයට සාක්ෂි දැරීමයි.

බයිබලය අර්ථ කථනය කිරීම සඳහා ඇති හොඳම ක්‍රම වේදය නම් අර්ථ කථනය කරන්නාගේ ආධ්‍යාත්මික වර්ධනයයි. එම ආධ්‍යාත්මික වර්ධනය පෝෂණය කරගැනීමට කතෝලික සම්ප්‍රදායේ මඟ පෙන්වීම අත්‍යවශ්‍ය දෙයකි. සම්ප්‍රදායේ ආලෝකය සහ මඟ පෙන්වීම යටතේ අපගේ දෛනිකව සිදුවිය යුතු ආධ්‍යාත්මික වර්ධනය පිරිසිදු කරගත යුතුයි. එමෙන්ම අධ්‍යාත්මිකව වර්ධනය වන පුද්ගලයන් විසින් කතෝලික සම්ප්‍රදාය ද පිරිසිදු කරනු ලබයි. සම්ප්‍රදාය ජීවමාන යථාර්ථයක් බවට පත්වන්නේ එවිටය.

එමෙන්ම ජීවමාන සම්ප්‍රදායයක් විසින් අපව ද ජීවමාන කරවනු ලබයි. සම්ප්‍රදාය යනු දෙවියන් වහන්සේගේ මඟ පෙන්වීම යටතේ කිතුනුවන් විසින් උකහාගන්නා ලද සාමුහික ප්‍රඥාවයි. අපට වඩා බයිබලය ගැඹුරට හැදෑරුවන්, බයිබලයට අනුව ජීවත් වූවන්, බයිබලීය සත්‍යයන් ක්‍රියාවට නැංවූවන් ඉතිහාසය පුරා ජීවත්වී ඇත. එවැනි පුද්ගලයන්ගෙන් ඉගෙන ගැනීම, ඔවුන්ගේ අඩි පාරේ ගමන් කිරීම සැබෑ ප්‍රඥාවන්තයකුගේ ලක්ෂණයකි.

තමන් තරම් බයිබලය ගැන දන්නා පුද්ගලයෙක් ඉතිහාසයේ නොසිටියේය යයි සිතීම මූලධර්මවාදියකුගේ ලක්ෂණයකි. අවුරුදු දෙදහකට පසුව බයිබලය නිවැරදි ලෙස තේරුම් ගන්නා ලද්දේ තමන් යයි සිතීම ඉතා භයානක සිතුවිල්ලකි. එවැනි ආකල්පයකින් ඇති විය හැකි හානි ය, අන්ධකාරය, සහ බුද්ධිමය වල්මත් වීම ඉතා විශාලය.

මූලධර්මවාදය යනු එක පරම්පරාවක අඥානකම තවත් පරම්පරාවකට උරුමකර දීමයි. මූලධර්මවාදියා ආධ්‍යාත්මික මන්ද පෝෂණයෙන් පෙළෙන්නෙකි. මූලධර්මවාදියා තම අනුවණ කම ගැන පුරසාරම් දොඩන, තම බයිබලීය අඥානකම ගැන උවමනාවටත් වඩා උඩඟු වන පුද්ගලයෙකි. සැබෑ කිතුනුවා බුද්ධිමය වශයෙන් ඉතා නිහතමානී පුද්ගලයෙකි. බුද්ධිමය වශයෙන් ඉතා විවෘත පුද්ගලයෙකි. ආධ්‍යාත්මික පෝෂණය සඳහා දෛනිකව සූදානමකින් සිටින පුද්ගලයෙකි.

දේව වචනය අර්ථ කථනය කළ යුත්තේ පටු දෘෂ්ඨි කෝණයකින් නොව, ඉතා පළල් දෘෂ්ඨි කෝණයකින් ය. බයිබලීය ප්‍රඥාව යනු එක තැන පල් වන දෙයක් නොව, දිනපතාම වැඩි වර්ධනය විය යුතු දෙයකි. අප වයසින් මුහුකුරා යන ප්‍රමාණයට සාපේක්ෂව අපගේ බයිබලීය ප්‍රඥාව ද ගැඹුරු විය යුතු වේ. එය එසේ නොවේ නම්, අපගේ ආධ්‍යාත්මික ජීවිතය අඩපණ වේ.

මූලධර්මවාදය ආධ්‍යාත්මික වර්ධනයට ඇති ප්‍රධාන බාධකයකි, අවහිරයකි. සභා පියවරුන් බැලූ ආකාරයට දේව වචනය දෙස බැලීම ඒ අනුව දේව වචනය අර්ථකථනය කිරීම සැබෑ ආත්මීය පෝෂණය සඳහා ඇති එකම මාර්ගයයි.

කතෝලික සම්ප්‍රදායේ ආලෝකය තුළ බයිබලය තේරුම් ගැනීමට ප්‍රයත්න දැරීම බයිබලයෙන් උපරිම අන්දමින් පෝෂණය ලැබීමේ හොඳම මාර්ගයයි. කතෝලික දැක්ම යනු බයිබලය පිළිබඳ විශ්වාන්තර දැක්මයි. විශ්වයීය දෘෂ්ටි කෝණයයි. බයිබලයේ සැබෑ වටිනාකම ඉස්මතු වන්නේ, බයිබලය බයිබලය බවට පත් වන්නේ එවිටය.

බයිබලය විශ්වාන්තර දැක්මකින් තේරුම් නොගැනීම, කතෝලික දෘෂ්ටි කෝණයකින් අර්ථ කථනය නොකිරීම, දෙවියන් වහන්සේට කරන අගෞරවයකි. උන්වහන්සේව සැහැල්ලු කිරීමකි.

ලබන සතියට...

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## පළමු සතිය සිකුරාදා උදා යාම යැදුම

### 51 වැනි ගීය

පසුගිය සතිය හා සබැඳේ

මග පහදා දෙමි :
ධර්මදූතික ආකල්පය එවැනි ධනාත්මක ප්‍රතිඵලයක් වන අතර ගීතාවලියෙහි විවිධ අවස්ථාවල එය ඉස්මතු කොට දැක්වේ. (ගීතා 22:22).

ඔබේ දැහැමි ක්‍රියා :
දැහැමි බව නොහොත් "සාධාරණ බව" (හෙබ්‍රෙව් පිටපතේ, සද්දික්) දෙවි සමිඳාණන් වහන්සේගේ ගුණාංගයක් සේ ශු. ලියැවිල්ල පෙන්නුම් කරයි. සැදැහැවතකුට දෙවියන් වහන්සේ හා සම්බන්ධ විය හැක්කේ දැහැමි බවට තම දිවිය විවෘත කළ විට පමණක් බව ජනවන්දනාත්මක පසුබිමින් ශුද්ධ ලියැවිල්ල පැහැදිලි කරයි (ගීතා 50:23, ආමොස් 5:21-24)

වගන්ති 19 :
එහි ඔබේ පුදසුන මත :
මින් පෙන්නුම් කෙරෙන්නේ පසුකාලීනව, එනම් විප්‍රවාසයෙන් පසුව ජෙරුසලම් දෙව් මැඳුර ප්‍රතිසංස්කරණය වී යළිත් දේව ජනතාවගේ ආධ්‍යාත්මික ජීවිතය පුනර්ජීවනයක් ලැබීමයි (නෙහෙමියා 2:17-20, ගීතා. 14:7, 53:6)

#### යැදුම

දෙව්පියාණන් වහන්ස, ඔබවහන්සේගේ අපරිමිත දයා කරුණාව දුර්වල මිනිස් අපගේ ශක්ති උල්පත වන්නේ ය. ඔබවහන්සේ සමාවේ දිය දහරින් පවිටු අපගේ ජීවිත වෙනස් කරමින් නව ජීවනයකට යොමු කිරීම වෙනුවෙන් ඔබවහන්සේ නිරතුරු තුති ප්‍රශංසා කරමු. මෙලොව අයහපත් බලවේග මැද ඔබගේ අභිමතයට අනුකූලව ජීවත්වීම සඳහා අප සැමව ඔබගේ වරප්‍රසාදයෙන් ශක්තිමත් කර වදාළ මැනව.

## පළමු සතිය සිකුරාදා උදා යැදුම

### 100 වැනි ගීය

ගී වර්ගීකරණයට අනුව මෙය ප්‍රශංසා ගීයක් ලෙස ගැනේ. දේව ජනතාව ගෝත්‍ර වශයෙන් එක්ව ජෙරුසලෙම් දේව මන්දිරයේ දේව වන්දනා පිළිවෙත් සඳහා ඇතුළුවීමේ ගීයක් වශයෙන් මෙය භාවිත කළ බව පෙන්වා දිය හැකිය. මෙහි සැකැස්මෙහි අති ද්විත්ව හැඳින්වීම්වල දැක්වෙන ඇරයුම - අරමුණ" ලේඛන විලාශය ජෙරුසලම් දෙව් මැඳුරේ දේව වන්දනාත්මක දැක්ම විදහා පෙන්වයි. දෙවියන් වහන්සේගේ අපරිමිත යහපත් කමත් උන්වහන්සේගේ විශ්ව දයා කරුණාව වෙත යොමුවන මිනිස් හදවතේ පැසසුම් ප්‍රතිචාරය මේ ගීයෙන් ප්‍රබලව දැක්වේ.

ලේඛන සැලැස්ම :
වගන්ති 1 - 2 : දෙවියන් වහන්සේ නැමදීම සඳහා සියලු ජාතීන් වෙත ඇරයුම

වගන්ති 3: දේව ප්‍රශංසාවේ අරමුණු

වගන්ති 4 : දෙවියන්වහන්සේ නැමදීම සඳහා ඇරියුම.

වගන්ති 6 - 5 : දෙවි සමිඳාණන් නැමදීමේ අරමුණු

ගීතාවලිය



ශුද්ධ ලියැවිලි වසර

(25)

ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා

### විග්‍රහය සහ අරුත :

(අ) වගන්ති 1- 2 : මේ මුල් කොටසින් ගැඹුරු ලෙස මතුකොට දැක්වෙන්නේ සැබෑ ආනන්දයේ නැතහොත් සංතුෂ්ටියේ අරමුණයි. ඒ සඳහා මූලික සාධකය වන්නේ දේව ජනතාවගේ ධාර්මික ජීවිත පැවැත්මට පදනම වන ගිවිසුම් ජීවන රටාවයි. දෙවියන් වහන්සේ ජනතාවගේ ආදරණීය දෙවි සමිඳාණන් වන අතර, ජනතාව උන්වහන්සේගේ ආදර කරුණාවට උරුමකම් දරන තෝරාගත් ජනතාව වන්නේය.

ප්‍රීති ඝෝෂා පවත්වන්න:
සාමූහික යැදුම සඳහා ඇරියුමක් ලෙස යෙදෙන මේ යැදුම් වැකි ඇමතුම ගීතාවලියේ ගී වල දක්නට ලැබෙන ලක්ෂණයකි. (ගීතා 66:1, 94:4). එය දේව වන්දනා පසුබිම නැංවීමට දායක වේ.

වැඳ පුදා :
හෙබ්‍රෙව් පිටපතෙහි ඇති "අබාද්" වදනින් දෙවි සමිඳුන් හට "මෙහෙ කරන්න", "සේවය කරන්න" යන අරුත දැක්වේ. දේව වන්දනාවේ මුඛ්‍ය අරමුණත්, විවිධ වත් පිළිවෙත්වල අරුතත් වන්නේ "සමිඳු මෙහෙවරයි."

ඉදිරියට පැමිණෙන්න :
මෙයින් නිරූපණය වන්නේ දේව වන්දනා වත් පිළිවෙතේ විශේෂ මොහොතකි. සියලුම සැදැහැවතුන් ඇදහිල්ලේ ජනතාවක් ලෙස දෙව්මැඳුර ඇතුළට පිවිස දෙවි සමිඳාණන් වහන්සේ අබිමුව සිටීමේ යථාර්ථය සහ අවශ්‍යතාව ඉන් පෙන්නුම් කෙරේ (නික්ම. 34:34, ගීතා. 95:6, යෙසායා 1:12)

(ආ) වගන්ති 3:
මේ වැකියෙන් සංක්ෂිප්ත කොට දැක්වෙන්නේ දෙව්මැඳුර කේන්ද්‍රීයව සිදුකෙරෙන දේව වන්දනා වත් පිළිවෙත්හි අරමුණුය.

සමිඳාණන් දෙවිඳාණන් බව :
මෙය පුරාණ ගිවිසුමෙහි අවධාරණාත්මකව දැක්වෙන විශ්වාසය ප්‍රකාශ කිරීමේ මූලික කරුණය (ද්. නී. සං. 6:4-9). මේ ප්‍රකාශනය තුළින් එක් අතකට දෙවියන් වහන්සේ මැවුම්කාරයාණන් ලෙස දැක්වෙන අතර, අනෙක් අතට ඊශ්‍රායෙල් ජනතාව දේව ජනතාව ලෙස තෝරා ගැනීම හඟවයි (ගීතා 95:6).

ලබන සතියට

ගරු හෙන්රි සිල්වා පියතුමා 50

# පුරාණ ගිවිසුම තුළ දිවැසිවරු




පසුගිය සතිය හා සබැඳේ..

එම රූපක මෙසේය.
අඹු සැමි
සබඳතාවය (ජෙරමි. 31:32, එසකි. 16)
පිය පුත් සබඳතාවය (යෙසා. 1/2, හොෂියා 11/1-4)

එඬේරා සහ බැටළු රැළ (යෙසා. 40/10-11, එසකියෙල් 34)
මිදිවත්ත සහ එහි අයිතිකරු (යෙසා. 5/1-7)

"ඔවුන් සමඟ මා කළ ගිවිසුම ඔවුහු කඩ කළෝය."

සීනායි ගිවිසුම ද්විපාර්ශ්වික වන බැවින් ඉශ්‍රායෙල් ජනතාව විසින් එය කඩවීමට ඉඩකඩ ඇති නිසා කඩකළ නොහැකි නව ගිවිසුමක අවශ්‍යතාවය මතුව ඇත. මෙහිදී අපේක්ෂිත ගිවිසුම ඒක පාර්ශ්වික ගිවිසුමක් වෙයි. මන්දයත් දෙවියන් වහන්සේ ගිවිසුම රක්ෂා කිරීමේ වගකීම තමන් වහන්සේ වෙත පවරා ගන්නා බැවිනි. එය, දෙවියන් වහන්සේගේ පැත්තෙන් දෙනු ලබන පොරොන්දුවක් සහිත පොරොන්දුවේ ගිවිසුමකි.

**33 වන වගන්ති. -**
" මම මාගේ අණ පණත් ඔවුන් තුළ පිහිටුවා එය ඔවුන්ගේ සිත් වල ලියන්නෙමි." මෙම වගන්තිය, සීනායි ගිවිසුම හා නව ගිවිසුම අතර වෙනස මතු කර දක්වයි. සීනායි හී ගිවිසුම් නීති ගල් පවුරු දෙකක් මත ලියැවුන අතර, නව ගිවිසුම ලියැවෙන්නේ මිනිස් හදවත් මතය. එනම් එය ඇතුලාන්ත ගත කර ඇත. මෙයින් අදහස් වන්නේ ගිවිසුම තුළ ප්‍රකාශ වන දේව නීතිය, මිනිසාගේ හෘදය සාක්ෂිය හා සම්බන්ධ ලෙස පෙනෙන බවයි. හේබ්‍රෙව් මනසට අනුව "හදවත" (ලේබ්), මිනිසා තුළ සිදුවන සියලු ක්‍රියාකාරිත්වයන්ගේ කේන්ද්‍රස්ථානය ලෙස සැලකිනි.

"මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි. ඔවුහු මාගේ සෙනඟ වන්නෝය."

මෙය, දෙවියන් වහන්සේ හා ඔවුන් වහන්සේගේ ජනතාව අතර සබඳතාවය පෙන්නුම් කෙරෙන ගිවිසුම් ව්‍යවහාරය වෙයි. විශාරද අධ්‍යයනයන්ට අනුව මෙම ව්‍යවහාරය, "මම ඔබට ස්වාමිපුරුෂයකු වන්නෙමි. නුඹ මට භාර්යාවක වන්නෙහිය." යන පුරාතන විවාහ ගිවිසුම් ප්‍රකාශය ආශ්‍රයෙන් ගොඩ නැගී ඇති බව පෙනේ.

**34 වන වගන්තිය -**
"සමිඳාණන් වහන්සේ හඳුනා ගන්න කියා එකිනෙකා තම තමාගේ අසල්වැසියාටද, සහෝදරයාටද උගන්වන්නට වුවමනා වන්නේ නැත. මන්ද, ඔවුන්ගෙන් කුඩා අය පටන් ලොකු අය දක්වා සියල්ලන්ම මා හැඳින ගනු ඇත."
සභාව සතු ඉගැන්වීමේ අධිකාරී බලය (ගුරු බලය) අභියෝගයට ලක් කිරීම සඳහා පුනරුදයෙන් පසුව දීර්ඝ කාලයක් මෙම කොටස වැරදි ලෙස අර්ථ කථනය කර ඇති බව පෙනේ. මෙම වචන පසුපස ඇති ප්‍රධාන අදහස් වනුයේ මෙම ගිවිසුම හේතුකොට ගෙන කෙනෙකු තම ඇතුලාන්තයේ ගැඹුරින් දෙවිඳුන් අත්දැකීමය. මෙය කෙනකුගේ අභ්‍යන්තරයේ ඇතිවන ගැඹුරු අත්දැකීමක් නිසා එය බාහිරයෙන් තවත් අයකු වෙත සම්ප්‍රේෂණය කළ නොහැකි වෙයි.

"මම ඔවුන්ගේ අපරාධ කමා කරන්නෙමි". මෙම ගිවිසුමෙහි විශේෂත්වය වනුයේ, නිරතුරුව සමාව දීම පිළිබඳව දෙවියන් වහන්සේගේ සහතිකයයි. එබැවින් එය, ගිවිසුම් සබඳතාවය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන බෙහෙවින් වැදගත් කොන්දේසියක් බවට පත්වෙයි. එනම් පාපයෙහි එල්බ ගෙන සිටින පවුකරුවාට දෙවියන් වහන්සේ හා සමඟ වන මෙම සබඳතාවය ඉදිරියට ගෙන යා නොහැකිය. එලෙස, දෙවියන් වහන්සේගේ පැත්තෙන් සමාව දීම, ගිවිසුම ආරක්ෂා කිරීම සඳහා මිනිසාට උපකාරී වන අනිවාර්ය කොන්දේසියක් බවට පත් වෙයි.

මෙම ජේදය කුම්රාන්හිදී (මළමුහුද ආශ්‍රිත ලේඛන වල) පසුකාලීනව සැලකිල්ලට ගෙන ඒ සඳහා පටු මතවාදී අර්ථ කථනයක් දීම සිදුවිය. කුම්රාන්හි පටු මත ධාරීහු තමන් හඳුන්වා ගත්තේ නව ගිවිසුම් සංඝය ලෙසය. මෝසෙස්ගේ නීතිය පිළිබඳව වෙනස් අර්ථ කථනයක් ඔවුන් සතු විය. පසුව, නව ගිවිසුම පිළිබඳ මෙම සංකල්පය යළි අවධානයට ලක් කිරීම නව ගිවිසුම මගින් සිදුවෙයි. ප්‍රථමයෙන්ම 1 කොරි. 11/23-26 ජේදයෙහි අපි එය දකිමු. (මේ කුසලාන මාගේ රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුමය). මෙම ඉදිරිපත් කිරීම ජෙරමියා ඉදිරිපත් කරන නව ගිවිසුමට වඩා වෙනස් බව පෙනේ. එයට හේතුව ජෙරමියා නව ගිවිසුම ආශ්‍රිතව රුධිරය පිළිබඳව කථා නොකිරීමය.

මෙම ජේදයෙහි දැක්වෙන්නේ, නව ගිවිසුම නික්මයාම හා සම්බන්ධ කර ඇති බවකි. (නික්ම. 24/1-8) එලෙස නව ගිවිසුම පිළිබඳ ජෙරමියාගේ අදහස, රුධිරයෙන් ස්ථිර කරන ලද සීනායිහි ගිවිසුම හා බද්ධ කෙරේ. එනිසා, එක් අතෙකින්, නව ගිවිසුම හා සීනායි හි ගිවිසුම අතර සබඳතාවයක් ඇතත්, අනෙක් අතට ඒවා අතර පැහැදිලි වෙනසක් ද වෙයි. එනම්, නව ගිවිසුම ස්ථිර කෙරෙනු ලබන්නේ, සීනායිහි ගිවිසුම මෙන් සතුන්ගේ ලෙයින් නොව කුරුසිය මත ජේසුස් වහන්සේගේ රුධිරයෙන් වන බැවිනි. ලූක් 22/19-20 හිද එය එලෙස දැකිය හැකිය.

නව ගිවිසුම පිළිබඳ වෙනත් සඳහන් කිරීම් සඳහා නව ගිවිසුම් ජේද 2 කොරි. 3/4-11, ගලාති 4/21-26, හෙබ්‍රෙ. 8/7-13; 9/15-17; 10/15-18 හා 12/22-24 බලන්න.

ලබන සතියට....




# "ඔබේ පැණවත්කම හා නැණවත්කම කැපී පෙනෙනු ඇත"

## සැප්තැම්බර් 02 - සාමාන්‍ය සමයේ විසි දෙවන ඉරුදින

*දෙවියන් වහන්සේ මිනිසාට අති මහත් කරුණාවකින් ආදරය කළ සේක. සියලු ආකාරයේ පාපයෙන් හා සාපයෙන් මුදා ගැනීමේ පවුරක් සේ ව්‍යවස්ථාවලියක් ප්‍රදානය කළ සේක. නමුත් මිනිසාගේ දුර්වල හා ආත්මාර්ථකාමිත්වය නිසා එම ආශිර්වාදය උන්වහන්සේගෙන් මිනිසාව ඈත් කරන්නට යොදා ගනු ලැබීය. එමෙන්ම බාහිර පිරිසිදුබව හා අභ්‍යන්තර පිරිසිදු බව අතර ලොකු වෙනසක් මතු කළේය. ජේසුස් වහන්සේ මෙම කිළුටු බවේ සාපයෙන් මුදා ගන්නට පාපයේ ආරම්භය වෙත අපගේ සිත් අවදි කරන්නට උත්සාහ දරයි.*

**සම්පූර්ණ පිරිසිඳුකම හා කිළුටු වීම :**
සම්පූර්ණ පිරිසිඳුකම මෙලොව දි මිනිසාට මිරිඟුවක් විය හැකිය. දුර්වල මිනිස් ස්වභාවය තුළ නිතර නිතර ශරීරය අපවිත්‍ර වේ, ලෙඩ වේ. එපමණක් ද නොව අයහපත් මිනිස් සිතුවිලි කෙළවරක් නැතිව අප හදවත් අපිරිසිදු කරන්නේ ය. මෙය පාලනය කරන්නට හැකියාව ඇත්තේ කවරෙකුට ද? මින් කියැවෙන මිනිසාගේ සැබෑ තත්ත්වය කෙසේ තේරුම් ගනිමුද? මිනිසා තුළ කෲරකම් අසංවර ගති පැවතුම් අසාධාරණය සාහසික දේ පවා නිතැතින්ම උපදින්නේ ය. මේවාට ඉඩ දුන හොත් තමාගේත් අන් අයගේත් ජීවිත වලට ප්‍රබල හානි සිදුවේ. මිනිස් ජීවිතය වඩ වඩාත් කෙටි වේ. මිනිසා ඉතා ගැඹුරු ප්‍රපාතයකට ඇද වැටී නහී. පතුලක් නොපෙනෙන එහි හිර වූ විට ඉහළින් පැමිණෙන ආලෝකයක් දකින්නට පටන් ගනී. නමුත් සිය උත්සාහයෙන් එළියට පැමිණිය නොහැකිය. කඹයක් දමා උඩට අදිනු ලබන්නට සිදුවන අතර එසේ උඩට එන විට පස් කඳුවල ගල් පරවල හැපී තුවාල විය හැකිය. බර වැඩි නම් නැවත නැවත පතුළටම කඩාගෙන වැටේ. අත පය කැඩේ. මෙසේ පාපයේ වහල්කම් වලින් පීඩා විඳින මිනිසාට ඉන් ගැළවෙන්නට මාර්ගයක් ඇත් ද?

**පැණවත් හා නැණවත් ජාතියක් :**
ව්‍යවස්ථාව මඟින් දේව ජනතාව "නැණවත් හා පැණවත්" ජාතියක් බව විජාතීන්ට ප්‍රකාශ වන බව ද ඔවුන් ඉන් පුදුම වන බව ද අද පළමු කියවීමේ සඳහන් වේ. ගිවිසුම් සම්බන්ධතාවයකට ඇතුළු වන දේව ජනතාව සියල්ලට ප්‍රථමයෙන් දේව ගිවිසුමට කීකරු විය යුතුවේ. ඒ කීකරු බව තුළ දේව ආරක්ෂාව ඔවුන්ට හිමි වේ. ඔවුන් විමුක්තිය ලැබුවේ ඔවුන්ගේ සුදුසුකමක් හෝ හැකියාවක් නිසා නොවන බව අමතක කළ යුතු නොවේ. නීති නියෝග ආරක්ෂා කිරීම දෙවියන් වහන්සේට ළංව සිටීමට හේතු වන බව අද පළමු කියවීම පැහැදිලි කරයි. "දෙවියන් වහන්සේට ළංව සිටීම" යනු කිසිදු පාපයකින් අපවිත්‍ර නොවීමය. උන්වහන්සේගේ මැඳුරෙහි විසීමයි. එසේ කළ හැකි අය පිළිබඳ විස්තරයක් අද පිළිතුරු ගීයෙහි හමුවේ. දැහැමි ලෙස දිවිගෙවන, නිදොස් ලෙස කල් ගෙවන, ගතු කේලම් නොකියන, මිතුරාට නපුර නොකරන, අවංක වදන් පවසන සැමට සමිඳු අභියස රැඳී සිටිය හැකිය.

**සමිඳුනි ඔබේ දෙව් මැඳුරෙහි කවරකුට සිටිය හැක්කේ ද?**
මෙම ගීතිකාව ලියන ගීතිකාකරු දෙව් මැඳුරේ පූජකයා හරහා දෙවියන් වහන්සේගෙන් අපූරු ප්‍රශ්නයක් අසන්නේ ය. දෙව් මැඳුරේ රැඳී සිටීමට නම් නියමිත පිළිවෙත් ඉටු කිරීම අනිවාර්ය බව ඔහු දන්නේ ය. එසේ තිබියදීත් මෙම ප්‍රශ්නය ඇසීමෙන් වඩා ගැඹුරු ආධ්‍යාත්මිකත්වයක් වෙත සිය සිත ඔසවන බව පෙනේ. දෙව්මැඳුරෙහි සිටින්නට කළයුතු හොඳම දේ තම හෘද සාක්ෂිය මඟින් මිනිසා දැන ගත හැකිවන්නේ ය. විශේෂයෙන් තම අසල්වැසියා වෙනුවෙන් කරනා වටිනා සේවාව මෙහිදී උලුප්පා දක්වන්නේ ය. මිනිසෙක් දෙවිඳුන්ට සමීප වන්නට නම් මුලින්ම ඔහු සිය අසල්වැසියාගේ අවශ්‍යතාවයනට සමීප විය යුතු අතර දැහැමි බව එදිනෙදා ජීවිතයෙන් පෙන්නුම් කළ යුතු වන්නේ ය. මෙය කිසිම පිළිවෙතකට හෝ ආගමික චාරිත්‍රයකට දෙවැනි නොවන බව පැහැදිලිය.

**අත් නොසෝදා :** මිනිසා අපිරිසිදු වන්නේ දූවිලි කැලි කසල විෂබීජ වලින් පමණක් බව සිතූ පරිසිවරු ජේසුස් වහන්සේට අභියෝග කරන්නෝ ය. ඔවුන්ගේ මනසට ඇතුළු නොවූ බොහෝ දේ තිබුණේ ඔවුන්ගේ පුහුමාන්නය හා උඩඟුව නිසාය. බාහිර පිරිසිදුකම අභ්‍යන්තර පිරිසිදුකම හා පටලවාගත් ඔවුන්ට උන්වහන්සේ මතක් කරන්නේ යෙසායා දිවැසිවරයාගේ ඉගැන්වීමකි. මුවින් ගරු කරතත් සිතින් ඈත්ව සිටී. දේව ආඥාව නොව මිනිස් සම්ප්‍රදායන් පිළිපදින්නෝය කියමින් ඔවුන්ගේ මහන්තත්වය බිඳ දමන්නේ ය. බාහිර හා අභ්‍යන්තර පිරිසිදුකමත් මිනිස් සම්ප්‍රදායන් හා දේව නියමයන් අතර පරස්පරභාවය පෙන්වා දෙන්නේය.
මේ බව තවත් විස්තර කරමින් මිනිසාව දූෂණය කරන්නේ මිනිසා තුළ ඇති පාපිෂ්ඨ ස්වභාවය මගින් මිස බාහිර දෙයින් නොවේ.

**සමාජයට:**
අප සමාජයේ සිදුවන අසංවර හා අශිෂ්ට ක්‍රියාදාමයන් ඉදිරියේ කිතු සමිඳාණන් අනුව යමින් අපට කළ හැකි දේ මොනවාද කියා බලන්නට අද අපට ආරාධනා කෙරේ. එක් පුද්ගලයෙක්ගේ ක්‍රියා කලාපය මුළු සමාජයකටම විනා කරන සුළු විය හැකිය. එක විෂබීජයකින් බොහෝ දෙනෙක් රෝගී විය හැකි බව අප නොදන්නවාද? තමාව පමණක් ආරක්ෂා කරගැනීමේ ආත්මාර්ථකාමී පිළිවෙතින් බැහැර වී සිතිය යුතුවේ. ක්‍රියා කළ යුතුවේ.

ගරු උපුල් සිල්වා පියතුමා

# රැකගනිමු ඉදිරියට යමු කතෝලික මාධ්‍ය පෙරටුකරගෙන

**කතුතුමනි,**

කතෝලික අපගේ නැණ පහන් දල්වන 'ඥානාර්ථ ප්‍රදීපය' මේ තරම් කාලයක් ජනතාව අතරට රැගෙන යාමට වරම් වරප්‍රසාද දානය කළාවූ දෙව්මහෝත්තමයාණන්ට සදා ප්‍රශංසා වේවා! දිනෙන් දින වේගයෙන් ඉදිරියට යන ලෝකයේ සෑම දෙයක්ම ඒ හා සමානව වෙනස් වෙමින් කාලයට ගැලපෙන අයුරින් ගොඩනැංවිය යුතුය. පෙර අප දුටු ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතට වඩා අප වර්තමානයේ දකින පුවත්පත පිළිබඳව අප අතිශයින් සන්තෝෂ වන අතර ඥානාර්ථ ප්‍රදීපයේ ප්‍රගමනය හා උන්නතිය සඳහා මේ දක්වා සහයෝගය දක්වන ගරු පියවරුන් හා සියලුම කම්කරුවාගෙ සිටම ප්‍රදීපයේ ඔබ සැමට ප්‍රශංසාව හා ස්තූතිය පුද කළ යුතුව ඇත.

අපගේ අවධානය යොමු කළ යුතු වනුයේ අපගේ නැණ පහන සැබවින්ම ජනතාවට, ජනතාවගේ දහම් දැනුම මෙන්ම, ජනතාව අතරට පැමිණ තිබේද යන්නයි. සැබවින්ම මාගේ දැනුම පරිදි විවිධ මීසම් වල අති විශාල පවුල් සංඛ්‍යාවක් පවතී. එම පවුල්වලින් 3 න් 1 ක් පමණ පිරිසක් පමණක් ප්‍රදීපයෙහි පාඨක පිරිස වෙති. එම පිරිසව සැබවින්ම අගය කළ යුතුව ඇත.

විශේෂයෙන් ප්‍රදීපය පුවත්පත රට වටා ජනතාව අතරට නැවත ගෙන යා යුතුව ඇත. එය පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීමට කාලය එළඹී ඇත. ජංගම දුරකථනය, වෙබ් අඩවි වැනි දෑ ද රූපවාහිනිය, CD පට, චිත්‍රපට වැනි මාධ්‍ය කෙරෙහි ජනතාව නිතර නිතර ඇදී යන ප්‍රමාණය වැඩිය. නමුදු පුවත් පත් වලින් දුරස්වන ජනතාවද වැඩි බව මා හැඟීමයි. මෙම වටිනා සම්පත විනාශ වීමට ඉඩ දිය නොහැක.

අප රටේ කතෝලික අපට ඇති එකම මාධ්‍ය පුවත්පත් මාධ්‍ය පමණි. වෙනස් වෙන ලෝකයත් සමඟ අපද වෙනස් විය යුතු නොවන්නේද? අප වෙනස් වීමට උත්සාහ දරන අතර අපගේ ප්‍රදීපය රැකගනිමු යන මාගේ හැඟීමයි.

මීසම් තුළ ප්‍රදීපය පාඨක පිරිස වැඩිකර ලීම සඳහා විවිධ මීසම් වල ප්‍රදීපය අලෙවි කරන කණ්ඩායම් සඳහා දිරි දිය යුතුව ඇත. ඔවුන් කරන සේවය අගය කරන අතර කරන්නන් වාලේ නොකර එය නිසි ලෙස කිරීමට ද වග බලා ගත යුතුව ඇත.

විශේෂයෙන් අප මීසමක ඇති පවුල් ප්‍රමාණය අනුව බෙදා ඇති ඒකක මූලිකයන් හරහා ද මෙම සේවය සඳහා ක්‍රමවත් වැඩසටහනක් යෝජනා කරමි. එවිට එම නුවාන ඒකක මූලිකයින් තම තමාගේ ඒකකයන් හි පවුල්වලට තවත් සමීප වේ. ඒ මගින් ද ප්‍රදීපය ප්‍රචලිත වීම කිසිවකුට වැලැක්විය නොහැක. මෙය සාර්ථක වනු ඇති බව නොරහසකි.

තවද පාඨක පිරිසට (කතෝලික) අමතරව වෙනත් පාඨක පිරිසක් සඳහා මෙම පුවත්පත පුස්තකාලයන් සඳහා සුදුසු නොවන්නේ මන්ද? අප රටේ ප්‍රධාන ගම්, නගර, පාසල්, ආයතනවල පුස්තකාලයන්, විවේකාගාරයන් නියත වශයෙන්ම ඇත. ප්‍රදීපය එම ස්ථාන සඳහා යොමුකළ හැකිනම් අතිශයින්ම අගය කළ යුතුව ඇත. පුස්තකාල භාර සැමගෙන්. ආයතන ප්‍රධානීන් හා අදාල අංශ වෙත මෙම කරුණු ගෙන හැර දක්වමි.

මීසම්, සහ දිසා මට්ටමින් විවිධ අවස්ථා සඳහා ප්‍රදීපය ප්‍රචාරය කිරීමට කණ්ඩායමක් පත්කර ජංගම ප්‍රදර්ශන පැවැත්වීමට හැකිනම් අගනේය. මෙයට මීසම් සේවක මෙන්ම දිසා භාර පියවරුන්ගේ ද ඒ ඒ ප්‍රදේශවල ලේඛකයින්, ස්වෙච්ඡා සමිති සමාගම් දායක කරගෙන කළ හැකිනම් ප්‍රදීපයේ ඔබ නිරතුරු මග පෙන්වනු නොවේ ද? ප්‍රදීපය ප්‍රචලිත කිරීම හුදෙක් ප්‍රදීපයේ කාර්ය මණ්ඩලයේ පමණක් නොව එය අප අපේම හැඟීමෙන් සැවොම එක්ව කළයුත්තේ අපගේ ඇති එකම මාධ්‍ය මෙය නිසාවෙනි. (විවිධ මීසම් වල අන්තර්ජාල පහසුකම් සහිතව වෙබ් අඩවි පවත්වා ගෙන යයි. එය ප්‍රසිද්ධ වුවද සැමට පහසුකම් නොමැත). ජනතාව අතරට යන ප්‍රබල මාධ්‍ය අතුරින් පුවත්පත, රූපවාහිනිය. ගුවන් විදුලිය සෑම විටම ජනතාව අතරය, නමුදු අපට ඇත්තේ නැණපහන් දල්වන පෑනේ අවිය පමණි. රූපවාහිනිය වැනි අංශයන් කෙරෙහි යොමු වීමට තව කල් ගත යුතු ද? අප සැමට ඇති අයිතින් ලෙස අපේ කමට ගරු කරමින් මාධ්‍ය කතෝලික කම් තුළ අනාගතයට පිවිසීමට තවත් කල් මැරිය යුතුද? රූපවාහිනිය, ගුවන් විදුලිය වැනි අපගේ සිහිනයන් කාලයත් සමඟ වැළලී යාමට ඉඩ දිය යුතුද? නැණ පහනින්, නැණ නුවණ දැක දෙනෙතින්, දෙසවනින් විඳීමට අපේ ප්‍රබල කතෝලික කම් පෙරට ආ යුතුව ඇත.

**එච්. ඉයන් රෝෂේන්ද්‍ර ප්‍රනාන්දු**
තරාල

# ලෝක අවසානය ගැන බිය විය යුතු ද ?

**කතුතුමනි,**

ප්‍රදීපය කතු වැකියෙන් ලෝක අවසානය පිළිබඳව වත්මනේ පැතිරී යන විවිධ මතවාද සම්බන්ධයෙන් පෙන්වා දී ඇති කරුණු කාරණා ඉතා වැදගත්ය. මේ මතයන් හා කිතුනු විශ්වාසය උරගා බැලීම ගැන කතු තුමා වැදගත් කාරණා රාශියක් කතු වැකිය තුළින් ප්‍රකාශ කර විශ්වාසයේ ජනතාවගේ අධ්‍යාත්මය අවදි කර ඇත. ලෝකයේ වඳ වී ගිය මානව ශිෂ්ටාචාරයක් වූ 'මායා වරුන්ගෙ' දින දර්ශනයේ අඩංගු දින වකවානු අල්ලා ගෙන 2012 දෙසැම්බර් 23 න් පසු ලෝක අවසානය සිදු වෙතැයි මෑතක ඇති වූ මතයකි. ඇමරිකාවේ විද්‍යාඥයන් ද මෙයට සමානවම මතයක් ඉදිරිපත් කරමින් 2012 දෙසැම්බර් 23-25 යන කාල පරාසය තුළ පෘතුවියේ ගමන් කිරීමේ වෙනසක් හරහා ලෝකය නව වෙනසකට මුල පුරන බව අන්තර් ජාලයේ සඳහන් කරයි.

එහෙත් මේ සියලු මතයන් කිතුනු දහමට පටහැනිය. විද්‍යාවට හෝ ජ්‍යොතිෂය තුළින් හෝ වෙන කිසියම් ආකාරයකින් හෝ ලෝකයේ අවසානය අහවල් දවසේ සිදුවෙතැයි මිනිස් ඥානයෙන් කිසිවකුට කිව නොහැක. ලෝක අන්තිමය කවදා කුමන මොහොතක සිදුවනවාද කියා තමන් වහන්සේ පවා නොදන්නා බවත්, එය දන්නේ ස්ර්වබලධාරී දෙව්පියාණන් වහන්සේ පමණක් බවත් ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ ශුද්ධ ලියැවිල්ල තුළ පැහැදිලිව ප්‍රකාශ සේක. ලෝක අවසානය කුමන මොහොතක සිදු වුවත් සත්‍ය විශ්වාසයේ කිතුනු ජනතාවක් වන අප මඳ කුදු බිය විය යුතු නැත. එහෙත් අප එකිනෙකා මෙලොව ජීවිතය අවසන් කරන මොහොතේ දෙවියන් වහන්සේ සමඟ කිසියම් ගනු දෙනුවක් ඇති බැවින් ජේසුස් වහන්සේ අපට පෙන්වා දෙන 'දේව රාජ්‍යයෙ' සැබෑ වටිනාකම් මේ පාපිෂ්ඨ ලෝක සමාජය තුළ ජීවත් කරවීම අද දවසේ අප සැමගේ වගකීම වන්නේය.

**ලූෂන් ෂර්ලි එඩ්වඩ්**
ගෝනවල

# ස්වදේශීය සේවයට ආසිරි මල්

**කතුතුමනි,**

අගෝස්තු මස 15 වැනි දින පැවැත්වූ ජපමාල අප රාජේශ්වරියගේ මරද මඩු දේව මාතා සිද්ධස්ථානයේ වාර්ෂික මංගලෝත්සවයේ මහා පූජා යාගය එදින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ සජීවිව විසුරුවා හැරිම ගැන කිතුනු ජනතාවගේ ප්‍රණාමය එම කාර්ය මණ්ඩලයට හිමිවිය යුතුවේ. තවද එම දිව්‍ය පූජා යාගයට පෙර පැය බාගයක කාලයක් මරි මව් බැති ගී වෙනුවෙන් වෙන් කිරීමද අතිශයින්ම අගය කළ යුතු වන්නකි.

**නිහාල් සී. පෙරේරා**
කෙරවලපිටිය

# කතෝලිකයන්ට ගරහන අන්තවාදීන් සහ සත්‍යය

**කතුතුමනි,**

පසුගියදා රාගම තේවත්ත බැසිලිකාවේ රෝගීන් සුව කිරීමේ මෙහෙය පිළිබඳව යම් කිසි අන්තවාදි පිරිසක් විසින් විද්‍යුත් මාධ්‍ය භාවිත කරමින් අපහාස කරන තත්ත්වයට පැමිණ ඇති බව වාර්තා වේ. මේ රටේ යම් යම් අන්තවාදීන් කතෝලික සභාව ද අනෙක් මූලධර්මවාදීන්ගේ මට්ටමට දමා සැලකීම කණගාටුවට කරුණකි. මක්නිසාදයත් මෙරට මූලධර්මවාදීන්ගේ ග්‍රහණයට වැඩියෙන්ම හසුවන්නේ කතෝලිකයන් වීම නිසාය.

බොහෝ රටවල විවිධ බලවේග ක්‍රිස්තියානින් දෙස බලන්නේ වපර ඇසිනි. ඒ අනුව ඔවුන්ගේ උත්සාහය වන්නේ කිතු සමිඳුන් පසු පස යන අයව මානසිකව ඇද වට්ටන්නටය. ඔවුන්ගේ ගමන වලක්වන්නටය. වරක් වාර්තා වූයේ සෑම විනාඩි 5 කට වරක් කොතැනක හෝ ක්‍රිස්තියානිකරුවකු මරා දමන බවය. මෙම තත්ත්වය මෙරටට ද එසේමය. යමකු නැගී සිටින විට බලාසිටීමට බැරි වැඩ බැරි ටාසන්ලා කරන්නේ මොකක් හෝ ගුලියක් අඹරා වැඩ කරන සත්‍යවාදීන් බිම හෙලන්නට ක්‍රියා කිරීමයි. එය මේ සමාජයේ සෑම ක්ෂේත්‍රයකම සිදුවන දෙයකි. යම් යම් කාර්යාල වල කතෝලිකයන්ට ද මෙම තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන බව නොරහසකි.

බොහෝ උගතුන් බුද්ධිමතුන් මේ මුලාවන්ට, අසත්‍යයට ගොදුරු කර ගත නොහැකි අවස්ථා ඇත. එයට පසුගියදා සිදුවුණු එක් වැදගත් අවස්ථාවක් සක්ෂි දරයි.

එක්තරා පෞද්ගලික නාලිකාවක රාත්‍රි 10.00 සිට පැවති වැදගත් දේශපාලන ආගමික කතිකාවකදී. මහාචාර්ය සරත් වීජේසූරිය මේ රටම බලා සිටියදී කියා සිටියේ විශ්ව විද්‍යාල සිසුන්ගේ අශෝභන නවක වදය වැනි සමාජ අසම්මත විනය ක්‍රියාවලියට කිසිදු කතෝලිකයකු/ක්‍රිස්තියානි විශ්ව විද්‍යාල ශිෂ්‍යයකු හසු වී නොමැති බවයි. එම සත්‍යය බෞද්ධ මහාචාර්ය වරයකුගේ මුවින් පිට වීම කොතරම් ගෞරවනීයද? සත්‍යය නම් මෙයයි.

එසේම එතුමා එහිදී ප්‍රකාශ කළ තවත් සත්‍යයක් නම්, කතෝලික පාසලක විදුහල්පතිවරයකු හමුවන්නට ගිය විට ඉතා විනීතව සංවර ලෙස එසේ ගිය අමුත්තා පිළිගන්නා බවයි. කන්‍යාරාමයක මව්තුමියත් ද එසේ ම බව එතුමා පවසා සිටියේය. ආගම් වාදයෙන් ඊර්ෂ්‍යාවෙන් උන්මත්තකයින් නොවී මෙසේ ඇත්ත ඇති සැටියෙන් විවෘතවම රටටම ඇසෙන්නට කළ මෙම බෞද්ධ උගත් බුද්ධිමත් මහාචාර්ය වරයාගේ ප්‍රකාශය බෙහෙවින් අගය කළ යුතුය.

එතුමා දෙන පණිවිඩය නම් 'මම ඔබ සමඟ වෙමි. ධර්මය තුළ හැසිරෙන්න, මම ඔබ රකිමි.' එම නිසා කරදර ඇරඹෙන්නේ අද ඊයේ නොව අප ධර්මයේ ආරම්භයේ සිට එයට මුහුණ දුන්නේ අන් අයට පෙර අප ශාස්තෘන්වහන්සේමය. උන්වහන්සේට එසේ නම් අපට කොහොම වේද? එහෙත් කිතු තුමන් තුළ රැඳෙන්නා උතුරත්, දකුණත්, ඉහළින් පහළින් වමත් දකුණත් එතුමා රකිනු ඇත.

**පී. පැඩ්ඩිලියන්**

# අයවැය ලේඛනයට යෝජනාවක්!

**කතුතුමනි,**

වසරක් පාසා අප රට පාලක ආණ්ඩු පක්ෂය, රට හදන තැන (පාර්ලිමේන්තුව) තුළ සිට එළැඹෙන වර්ෂය සඳහා කරන්නට යෙදෙන විය පැහැදම් කෙබඳු ආකාරයෙන් සකස් කර ඇති දැයි රට වැසියනට අනාවරණය කිරීම අය - වැය ලේඛනයේ පරමාර්ථයයි.

වර්තමානයේ අප රටේ පවතින ණය බර පිළිබඳව කිසිදු සඳහනක් නොකෙරේ. එය කොළේ වසා ගැසීමකි. ඊට හේතුව රටවැසියා බලාපොරොත්තු වනුයේ, කීගුණයකින් වැටුප් වැඩිකර ඇත්ද? බඩුවල මිල අඩුකරලාද? වැඩිකරලාද? ජනතාවට ලබාදී ඇති සහන මොනවාද? යන්නය.

ඇතැමෙක් දේශපාලන වාසි තකා එක් රට වැසියෙක් රුපියල් ලක්ෂ ගණනින් උකස්කොට ඇතැයි පවසති. තව සමහර දෙනා උපදින්නට මගබලා සිටින අය වෙනුවෙනුත් ණය වී ඇති බව කියති. සමහර විට දේශපාලනික වාසි තකා අනවබෝධයෙන් යුතුව. අතිශෝක්තියෙන් ගණන් හිලව් ඇදබාති. අන් සමහර දෙනා රට එතරම් ණය බරින් මිරිකී නොමැති බව කියති. සමහරුන් එසේ පවසනුයේ සත්‍ය පිළිගැනීමට ඇති නොකැමැත්ත නිසාම බව පිළිගැනුමට සිදුව ඇත.

මීට හේතු සාධක වී ඇත්තේ, නිසි බලධාරීන් සත්‍යය හෙළි නොකිරීමවේ. එබැවින් කවුරු හරි වූවත්, වැරදි වූවත්, සියල්ල දන්නා මහා භාණ්ඩාගාරය නිසොල්මනේය. අප රටේ එක් පුද්ගල ආදායම ඩොලර් වලින් පෙන්නුම් කරයි. අය - වැය ලේඛනය රටට ඉදිරිපත් කිරීමේදී රටේ සමස්ත ණය ප්‍රමාණය පළමුවෙන් රටට ඉදිරිපත් කළ යුතුය. එවිට දුර්මත පහවේ. ඉන් අනතුරුව, දියත් කරන්නට අපේක්ෂා කරන වැඩපිළිවෙල කුමන ආකාරයෙන් දැයි හෙළි පෙහෙළි කිරීම උචිතවන්නේය.

එදා ජපානය, චීනය, සිංගප්පූරුව වැනි රටවල ආර්ථික පසු බෑමට ලක්වූ පසු ඔවුන් ඉන් මිදීම සඳහා එකාවන්ව ක්‍රියා කළ ආකාරය ගුරු කොටගත යුතුවේ. ඔවුනගේ කැපවීම තුළින් අද ලෝකයේ අභිමානයට ඔවුන් පත්වී හමාරය. මේ සියල්ලටම මුල්වූයේ ඔවුන් සතුවූ අවංක භාවයයි. කැපවීමයි, ඒකරාශීවීමයි. එබැවින් සත්‍යයට ගරු කරමින්. ඉතාමත් සුපරීක්ෂාවෙන් යුතුව පොදු ජනතාව ඒකරාශි කරගනිමින්, ආර්ථික ප්‍රපාතයෙන් ගොඩඒම සඳහා උත්සුක වන ලෙසට රටකරවන අයගෙන් ආරම්භ කොට, නිදහස් නිවහල් රටක් ජනිත කරන්නට වැර වීරිය ගනිමු.

**එල්. එස්. නෙල්සන් ප්‍රනාන්දු**
ජාඇල



# සෙනෙහසේ උල්පත වූ මාතර අපේ අම්මා



නීල වර්ණයෙන් හෙබි සප්ත මහා සාගරයේ බිඳෙමින් නැගෙන රළ ගෙඩි වලට නිනව්වක් නොමැති සේම, ඓතිහාසික රුහුණු පුරවරයේ සත් සමුදුර අභියස පිහිටි, “මාතර අප මෑණියන්” ගේ සිද්ධස්ථානයේ දුවා දරුවන්ට ද මේ එළඹ ඇත්තේ නිමක් නොමැති කාර්යයන් ගෙන් සමන්විත වසන්ත සමයකි. ඒ අන් කිසිවක් නිසා නොව අප ආදර දේවමාතාවන්ගේ උපන් මංගල්‍යය නිමිති කොට පැවැත්වෙන මාතර අප මෑණියන් ගේ සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය සැප්තැම්බර් මස එළඹෙන හෙයිනි.

වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම සෙනෙහෙවන්ත මවක් වූ මාතර අප මෑණියන් ගෙන් අප ලැබූ එමෙන් ම ලබන්නාවූ තිළිණයන් මෙතෙකැ”යි කියන්නට බැරි තරම්ය. එතුමියගේ මව් සෙනෙහස වඩ වඩාත් අත් විඳිමින් ද එතුමියගේ මධ්‍යස්ථකම යදිමින් ද රුහුණු පුරවරයේ හැදී වැඩුණු, එමෙන් ම නන් දෙසින් සපැමිණි දුවා දරුවන් වෙත ජාති, ආගම්, වර්ණ, කුලභේද නොසලකමින් නිරන්තරයෙන් ස්වකීය කුළුණු බර දෙනෙත් යොමු කළහ. ඔවුන්ගේ දුක සතුට හමුවේ එතුමිය ද සංවේදී වූහ. ඔවුනට යා යුතු නිසි මං පෙන්වමින් ආත්මික මෙන් ම ලෞකික සැපත අත්විඳින්නට නොමසුරුව සහය දුන්හ.

තමන් ලද තිළිණයන් හට හැකි ශක්ති ප්‍රමාණයෙන් කෘතවේදී වන්නට ද, තම අත්දැකීම් අන් අය හා බෙදා ගන්නට ද, ඔවුහු වර්ෂයක් වර්ෂයක් පාසා බිනර මස එළඹෙත් ම මාතර අප මාතාවන්ගේ මහ ගෙදරට පිය නඟන්නේ ඒ නිසා ම ය. එපමණක් නොව අන්තර්ජාලය ඔස්සේ ද එතුමියගේ මාතෘක රූකවරණය පතමින් එතුමිය වඩා ඒකරාශී වන සැදැහැවතුන් තුළින් ද දිස්වනුයේ එතුමියගේ සෙනෙහෙවන්ත භාවය නොවේද?

දිනෙන් දින තම මාතෘක රූකවරණය පතමින් ඒකරාශී වන දරුවන් දකිත් ම විකසිත වන එතුමියගේ මුව කමලේ අපූර්වත්‍ය, “වෙනදාට වඩා මෑණියන් ගේ මූණ හරි ලස්සනයි. අමුතු එළියක් පේනවා” වැනි වදන් වලට පෙරළෙන්නේ නිතැතින් ම ය.

එතුමියගේ මධ්‍යස්ථභාවය මිනිස් ජීවිත වලට පමණක් සීමා වූවක් නොවන බව දිනෙන් දින අභිනවයෙන් ඉදිවන මුළු මහත් දක්ෂිණ පුරවරය තුළින්ම විද්‍යමාන වේ. පසුගිය වසර වලට සාපේක්ෂව බලන විට උතුරේ පේදුරුතුඩුවේ සිට දකුණේ දෙවුන්දර තුඩුව දක්වා මංමාවත්, දුම්රිය මාර්ග පිළිසකර වී අධිවේගී මාර්ග ද ඉදි වී පවතී. මේ සියල්ල පවතින සියලු අභියෝග පසෙක ලා තම මාතෘක රූකවරණය තුළ ජීවිතය නිවැරදි මඟ ගෙන යන්නට සුව හසක් දරුවනට මාතර අප අම්මා කරනා ඇරියුමක් බඳුය.

“තවත් එක් මංගල්‍යයකට සහභාගි වනවා” යන චේතනාවෙන් තොරව “දක්ෂිණ අඹරේ දිදුලන තරුවක්” වූ මාතර අප අම්මාගේ ආශිර්වාදය ලබන්න වර්ෂ 2012 ක් වූ සැප්තැම්බර් මස 08, 09 දිනයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයට ඔබත් සැදැහැ සිතින් මේ පුදබිමේ රොද බඳින්න ආරාධනා සිද්ධස්ථාන පාලක ගරු ඩේමියන් අර්සකුලරත්න පියතුමාගෙනි.

**ඈන් නිශාන්ති රත්නසිංහ**
මාතර මීසම

# සයුරෙන් මතු වූ ස... මාතර අප ස්වාමිදුවගේ ...



රුහුණු පුරවරයේ මහා සමුදුරට මුහුණලා පිහිටි රෝමානු කතෝලික දෙව්මැඳුර මාතර අප ස්වාමිදුවට කැප කර ඇති අතර, මෙහි ඇති ආශ්චර්යමත් ප්‍රතිමාව දෙව් මවුන් බිළිඳු ජේසුතුමා සමඟ සිටින ප්‍රතිමාවකි. මෙම ප්‍රතිමාව ලීයෙන් නිම වූ ප්‍රතිමාවක් වන අතර වසර 100 ක් මුළුල්ලේ මෙම දේවස්ථානයේ තිබිණි. ප්‍රතිමාවටම සම්බන්ධ මුහුදු රළ තුනක් පෙන්නුම් කරයි. මෙම ප්‍රතිමාව තුන් වතාවක්ම මුහුදු රළ පහරට හසු වී එම තුන් වතාවේදීම නැවත එම දේවස්ථාන භූමිය වෙතම ලැබී ඇත. අවසන් වර එම ප්‍රතිමාව සුනාමි රළ පහරට හසු වී ගසාගෙන ගොස් නැවත දින තුනකට පසු එම දේවස්ථානයටම ලැබී ඇත.

### සයුරෙන් මතු වූ කුමරිය : ප්‍රථම වතාවට හමු වූ ආකාරය

17 වන ශත වර්ෂයේ පෘතුගාලයට අයත් ප්‍රතිමාවක් වන මෙම ප්‍රතිමාව කවුරුන් විසින් ශ්‍රී ලංකාවට රැගෙන ආවා ද කියන වග ප්‍රහේලිකාවක් වුවත් පෘතුගීසි පාලන සමය තුළ එම ප්‍රතිමාව ශ්‍රී ලංකාවේ තිබිණි.

එම සිදුවීම මෙසේය, 17 වන සියවසේ දකුණු ලක වැලිගම ප්‍රදේශය ධීවරයන් පිරිසකට ලීයෙන් නිම වූ ලොකු මංජුසාවක් මුහුදු තීරයෙන් හමුවූහ. මෙම මංජුසාව විවර කිරීමේ දී එම මංජුසාව තුළ මෙම ප්‍රතිමාව තැන්පත් කර තිබූ අතර, මුහුදු වතුරෙන් එම මංජුසාව පෙඟී තිබුණි. ප්‍රතිමාවට මුහුදු වතුර බිඳක් වත් මුසු වී නොතිබුණු අතර, ධීවරයන් විසින් ප්‍රතිමාව එකල මීසම් භාර පියතුමාට භාර දී, වර්තමාන දේවස්ථානයේ ම එම ප්‍රතිමාව තැන්පත් කරන ලදි. ප්‍රථම වතාවට මෙම ප්‍රතිමාව දේවස්ථානයට වැඩියේ ඒ ආකාරයෙනි.



රුදුරු සුනාමියටද නොසැළුණු මාතර අප ස්වාමි දූ දේවස්ථානය

### සයුරෙන් මතු වූ කුමරිය :- 2 වන අවස්ථාවේ දේවස්ථානයට හමුවීම

මාතර දේවස්ථානයේ තැන්පත් කර තිබූ මෙම ප්‍රතිමාව ජනතාවගේ භක්ති ආදරයට පාත්‍ර වූහ. 1900 දී ගාලු පදවිය භාර රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා විසින් මෙම ප්‍රතිමාව අලුත් වැඩියා කටයුතු සඳහා යුරෝපයට යැවීමට කටයුතු සලසා නැව් ගත කරන ලදි. එම අවස්ථාවේ දී ප්‍රතිමාව රැගත් නැව කුණාටුවකට හසු වී ඇති අතර, නැව තුළ තිබූ සියලුම දෑ මුහුදු බත් විය.

කෙසේ වුවද නැව නැවත කොළඹ වරා... ප්‍රතිමාව නොමැතිව ළඟා විය. ගාලු පදවිය ... රාජගුරු ප්‍රසාදීන් වහන්සේ එම අවස්ථාවේ ... බෙල්ජියමේ විසූ තම මිත්‍රයකුට මෙම මිල ක... නොහැකි ප්‍රතිමාව භාර ගැනීමට හා අළුත්ව... කිරීමට කටයුතු සලසා තිබිණි. එම ප්‍රතිමාව ... ලබා ගත් වෙනත් පුද්ගලයකු එම ප්‍රතිමාව භ... ගැනීමට පැමිණි පුද්ගලයාගෙන් මුදල් ඉල්ලා... අතර එම ඉල්ලීම ප්‍රතිමාව භාර ගැනීමට පැ... පුද්ගලයා ප්‍රතික්ෂේප කළ නිසා ප්‍රතිමාවේ මු...

## සැප් 08 වැනිදාට යෙදෙන දේවමාතා වහන්සේ උ...

### සුබ උපන් දිනක් වේ නමෝ මරියනි

ජන්ම දෝෂයෙන් නිදොස් වූ මරියනි
ස්ත්‍රීන් අතුරින් උතුම් වූ මව් මරියනි
දෙව් පුතු ජේසුට “අම්මා” වූ මරියනි
සුබ උපන් දිනක් වේ ඔබට නමෝ මරියනි

පාපි මිනිස් අපේ යැදුමට නිති සවන් දෙන්නී
දෙව් පිය ඉදිරියේ අප නිසා නිති මැදිහත් වන්නී
සුරලොව අග රැජින කිරුළ ද ඔබ දරන්නී
සුබ උපන් දිනක් වේ ඔබට නමෝ මරියනි

දෙව් පිය අණට නිති අවනත වූ දාසිනී
බැගෑ සිතින් දෙව් සරණෙ නිති යදින්නී
පැමිනි සැප දුක් සතුටු සිතින් නිති දරන්නී
සුබ උපන් දිනක් වේ ඔබට නමෝ මරියනි

සවන් දෙන කුළුණෙනි, දයාවෙ මාතෘනී
කිතුනුවන්ගෙ පිහිටෙනි, සුව දෙන මාතෘනී
ජපමාලයෙන් නිති දින අප රකින මාතෘනී
සුබ උපන් දිනක් වේ ඔබට නමෝ මරියනි

**ඩබ්. තිලක් ප්‍රනාන්දු - කොරළවැල්ල - මොරටුව**



නමෝ න...
ත්‍රිලෝ ...
දේව පුතු...
සරණයි ...

දුසිරිත් ම...
මව්පිය ද...
දෙව් පෙ...
රැගෙන ...
මව්නි ස...

මව් නැති...
දරුනට ...
ඔබෙ දෝ...

# මරිය
# දව් මැඳුරේ





ප්‍රදේශයට හානි සිදු කර ප්‍රතිමාව මුහුදට විසි කළ අතර, "සීනස්" යන නම් දැරූ පින්තාරුකරු විසින් අලුත්වැඩියා කර ඇත. බොහෝ අපහසුවෙන් නැවත අලුත්වැඩියා කළ ප්‍රතිමාව බෙල්ජියමේ සංචාරයක යෙදුනු ගාලු පදවිය භාර රාජගුරු ප්‍රසාදින් වහන්සේ භාර ගන්නා ලදුව නැවත කොළඹට ගෙන එන ලදි. දින තුනකට පසුව සොරෝලෙන් මාතර පුරවරයට ප්‍රතිමාව වැඩම කරවන ලදි. දෙවන වතාවටත් මෙම ප්‍රතිමාව මාතර දේවස්ථානයේ තැන්පත් කරන ලදි.

### සයුරෙන් මතු වූ කුමරිය :- තුන්වන වතාවට දේවස්ථානයට වැඩම කරවීම

පැහැබර ඉරුදිනක් වූ එය 2004 දෙසැම්බර් 26 වැනිදා ය. එනම් ශුද්ධවූ පවුලේ ඉරුදින පෙ.ව. 9.10 ට මාතර දේවස්ථානය තුළ දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත සිදුවෙමින් පවතින අවස්ථාව විය. නත්තල් දිනට පසු දින වූ බැවින් එදින දිව්‍ය පූජාවට සහභාගි වූයේ සැදැහැවතුන්ගෙන් සුළු පිරිසකි.

එක්වරම මීසම් භූමිය තුළට හා දේවස්ථානය තුළට මහා ජල ස්කන්ධයක් ගලා ආවෝය. මෙම අවස්ථාවේ දී මීසම් සේවක පියතුමා වන ගරු චාල්ස් හේවාවසම් පියතුමා වහා ක්‍රියාත්මක වී ආරක්ෂිත ස්ථාන වෙත යන මෙන් සැදැහැවතුන්ට දන්වන ලද අතර, එතුමා ද ආරක්ෂිත ස්ථානයක් වෙත ගොස් පසුව හදිසියේම දේවස්ථානය තුළ වැඩම කර තිබූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හා දේවමාතා ප්‍රතිමාව රැගෙන ඒම පිණිස නැවත දේවස්ථානයට ගිය අතර පියතුමාට දක්නට ලැබුණේ එම සියල්ලක්ම රුදුරු සුනාමි රළ පහරට ගොදුරු වී අස්ථාන ගත වී ඇති ආකාරයයි.

ඒ සමගම විශාල රළ පහරක් ඉතා වේගයෙන් පැමිණ දේවස්ථානයටත්, ශාන්ත සර්වේසස් විදුහල් භූමියටත් හානි සිදුකර මින් මුළු පළාතටම පැතිර ගොස් ඇති අතර, ඉතාමත් අසීරුවෙන් දේවස්ථාන භූමියේ එවකට ඉදිවෙමින් පැවති නව ගොඩනැගිල්ල වෙත යමින් පියතුමා තම දිවි ගලවා ගත්තේ ය.

මෙම සුනාමියෙන් 1918 සිට ප්‍රතිමාවට පළඳවන ලද වටිනා ස්වර්ණාභරණ ද අතුරුදන් වී තිබිණි. ජල කඳ බැස ගිය පසු පියතුමා මීසම් වාසින් කිහිප දෙනෙක් සමඟ ප්‍රධාන මාර්ගය වෙත යන ගමනේ දී එක්තරා පුද්ගලයෙක් බාල්දියක් අතැතිව යනු දුටු අතර, එය මීසම් පඬුරු එකතු කිරීමට භාවිත වන බාල්දිය බව දැක ඒ පිළිබඳ විමසීමේ දී එහි සඟවා තිබූ සියලුම ස්වර්ණාභරණ නැවත දේවස්ථානයටම ලබා ගැනීමට හැකි විය.

සුනාමියෙන් පසු දවස පුරාම මීසම් සේවක පියතුමා හා මීසම් වාසීන් එක්ව යාච්ඤාවේ නිරත වෙමින් මේ ආශ්චර්යමත් ප්‍රතිමාව නැවත ලබාදෙන මෙන් දෙවිඳුන් යැදූහ. ඉන් දින 3 කට පසු දේවස්ථානය අසළ පදිංචි මිල්ටන් මහතා මීසම් සේවක පියතුමා වෙත ගෙන ආවේ සුභාරංචියකි. එනම් ඒ මහතාගේ ගෙවත්තේ කෙසෙල් පඳුරක් අසළ දේවමාතා ප්‍රතිමාව රැඳී තිබී නැවත ගෙන ආ බවය. දෙවිඳුන්ට ප්‍රශංසා කළ පියතුමා වහා මිල්ටන් මහතාගෙන් ප්‍රතිමාව ලබා ගත්තේ කඳුළු පිරි දෙනෙතිනි. මෙය තුන්වන අවස්ථාවේදීත් සයුරට ගොස් නැවත දේවස්ථානයට පැමිණි ආශ්චර්යමත් දේවමාතා ප්‍රතිමාව දේවස්ථානයට ලැබුණි.

**එම්. ෆීලික්ස් වී කුරේ**

## ත්පත්ති මංගල්‍යය නිමිත්තෙනි

### දෙව් මව් සරණ යමු

මෝ මරියනි
ද්ව රැජිණෙනි
ගෙ මාතෘනි
අපහට නිති

ග යන අපේ
රු සිත් ඉරා
ම තුළ යහමඟකට
නු මැනේ.....
රණ වෙනු මැනේ

දරු දුක නසා
අම්මා වෙලා
තින් වඩවාගෙන
සනසවනු මැනේ ......
මව්නි සරණ වෙනු මැනේ

දරු සම්පත් නැති අපේ
දූවරු වෙත පෙම් වඩා
උන් කුස තුළ දරු යහනා
තනා දුන මැනේ....
මව්නි සරණ වෙනු මැනේ

අගහිඟකම් මැද නිතී
දිවි මඟ යන වුන් බලා
දෙවිඳුන් යැද එම ජීවිත
සුසරු කළ මැනේ....
මව්නි සරණ වෙනු මැනේ

ඔබෙ සුදු දරු පවුල සේ
සැම පවුලම පුබුදුවා
දෙවිඳුන් තුළ වැජඹෙන්නට
වරම් දුන මැනේ ......
මව්නි, සරණ වෙනු මැනේ


සාම කුමරු ලොව තැනූ
සාමයෙ මල් මාවතේ
අප සැම අත් වැල් බැඳගෙන
රැගෙන යනු මැනේ......
මව්නි, සරණ වෙනු මැනේ

**ඩබ්. ඇන්ටනි පීටර් ප්‍රනාන්දු**
**කටුනේරිය**

# ශ්‍රී ලංකාවේ පළමු පූජක සිසු හල

පෘතුගීසි සමය තුළ මෙන් ම ඕලන්ද පීඩන සමය තුළ ද මේ රටේ කිතු දහම වැළඳගත් විශාල පිරිසක් සිටියත් දේශීය පූජකතුමන්ලා සිටියේ නැත. මුළු පෘතුගීසි සමය තුළ ම මෙහි සේවා කළෝ යුරෝපීය පූජාප්‍රසාදීන් වහන්සේලා ම ය. ඕලන්ද සමය තුළ පූජක සේවාව ඉටු කරන ලද්දේ ඉන්දියාවෙන් පැමිණි ඉන්දියානු ජාතික පූජාප්‍රසාදින් වහන්සේලා විසින්ම ය.

පෘතුගීසි සමය තුළ ෆ්‍රැන්සිස්කාන, ජේසු නිකායික, දොමිනිකාන සහ ඔගස්ටීනියාන නිකායික පියවරුන් මෙහි දිගු කලක් රැඳී සිටියත් ඒ කිසි නිකායක දේශීය පූජකවරුන් පුහුණු කරනු ලැබුවේ නැත. මෙහි අවාසනාවන්ත ප්‍රතිඵලය වූයේ දරුණු ඕලන්ද පීඩනය ඇති වූ කාලයේ තිස් වසරකට අධික කාලයක් තුළ එක ම පූජකතුමකුවත් නැතිව ආධ්‍යාත්මික සේවාවන්ගෙන් තොරව, දහම රැකගෙන ජීවත් වීමට අප ගේ ගිහි ජනතාවට සිදුවීමයි. එම එක නිකායක පියවරුන්වත් තම "වසන්ත කාලය" හෙවත් පෘතුගීසි සමය විගස නිමාවනු ඇතැයි සිතුවේ නැත. මේ නිසා යුරෝපයෙන් ම පූජාප්‍රසාදීන් වහන්සේ ලබා ගැනීමේ සිහින මවාගෙන එතුමෝ ජීවත් වූහ.



**යටගිය දවස**

**විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**121**

මෙ රටට ඉන්දියාවෙන් පැමිණි ඔරතෝරියාන නිකාය පිළිබඳව ද සිදුවූයේ එය මැ යි. ඉන්දීය දේශිකයන් එහි සේවා කළ යුරෝපීය නිකායන් තුළට බඳවා ගනු නොලබන නිසා ආරම්භ කරන ලද ඉන්දියාවේ ම දේශීය ඔරතෝරියාන නිකායටත් හෙළ පුතුන් බඳවා ගෙන පුහුණු කළේ නැත.

මේ සඳහා වඩාත් ම හේතු වූයේ ඔරතෝරියාන පියවරුන් සේවා කළ කාලය තුළ පැවැති දේශපාලන වාතාවරණය යි. මෙය ඕලන්ද පීඩන සමය විය. ජුසේ වාස් පියතුමා ප්‍රමුඛ මෙම පියවරුන් එකල මෙහි සේවා කළේ ජීවිතය පරදුවට තබා ගෙන යි. එම නිසා දිවයින තුළ දෙව් සත් හලක් පැවැත්වීම සිතාගත හැකි දෙයක්වත් නො වීය. කළ හැකි යමක් වූයේ නම් ඒ සුදුස්සන් තෝරා ගෝවේට යැවීම යි. එය ද දුෂ්කර කරුණක් වූයේ එකල ඒ සඳහා දහම් පෝෂණය ලැබූ තරුණයන් නො සිටීම මෙන් ම එවැන්නන් සිටියත් ඕලන්ද තහංචි මැද ඔවුන් ඉන්දියාවට යැවීමත් ය.

ක්‍රි.ව. 1833 දී පෘතුගාලයේ ඇති වූ දේශපාලන අරගලයක් නිසා එහි පැවදි නිකායන් සියල්ල තහනම් කරන ලදි. ඒ අනුව පෘතුගාලයේ යටත් විජිත පුරයක් වූ ගෝවේ පදනම් කොටගෙන පිහිටි ඔරතෝරියාන නිකාය වෙත ද තහංචි පැවරිණි.

මේ හේතුවෙන් දිවයිනට එවන ලද ඉන්දීය පියවරු ද නතර වූහ. මේ සියල්ල කුමක් වුවත් දිවයින තුළ දේශීය පූජකවරුන් බිහිකිරීම අතිශයින් පමා විය. මෙසේ ක්‍රි.ව. 1806 මෙ රට කතෝලික පිරිසට ආගමික නිදහස ලැබුණ නමුත් මෙහි සේවා කරනු වස් එක ම දේශීය පූජක තුමෙක්වත් නො වීය. වසර තුන් සියයකටත් වැඩි කාලයක් තුළ ඇඩි පීඩන මැද වුවත් සංවිධානාත්මක දහම් ප්‍රචාරයක් ගෙන ගිය කතෝලික ප්‍රජාව තුළින් (රජ කුමරුන් දෙතුන් දෙනකු හැර) සාමාන්‍ය ජන කොටස්වලින් පූජකවරුන් බිහි නො වීම අභාග්‍යයක් ම නොවූවේ ද? මෙ වැනි තත්ත්වයක පැවැති දිවයිනේ සභාව වෙත නෙත් යොමු කළ ශුද්ධාසනයේ වැයම වූයේ ප්‍රථමයෙන් යුරෝපීය පූජකවරුන් සොයා මෙහි එවීම යි. දෙ වැනිව දේශීය පූජක පිරිසක් බිහි කිරීම යි. මේ අනුව ක්‍රි.ව. 1869 දී දේශීය පූජකතුමන් පුහුණු කරනු වස් පියවර ගන්නා ලෙස රෝමයේ දහම් ප්‍රචාරක කාර්යංශය නිර්දේශ කළේ ය.

මේ වන විට දිවයින අනු පදවි දෙකක් කොට පිහිටුවා පාලනය කරනු ලැබුවේ ය. උතුරු අනු පදවියේ රදගුරු අති උතුම් ක්‍රිස්ටෝෆර් බොන්ජින් හිමිපාණන් මේ වන විටත්, ඉමහත් දුරදැක්මෙන් යුතුව, මේ ඔස්සේ සැලැසුම් පිළියෙල කැර තිබුණේ ය. එතුමෝ එම සැලැසුම් ක්‍රි.ව. 1869 දී ම ක්‍රියාත්මක කළෝ ය.

පූජක සිසු හලක් මෙන් ම දෙව් සත් හලක් ද සැටියට නිමල මරිය නිකායේ පියවරුන් සහ පදවි පූජකවරුන් ද පුහුණු කිරීම සඳහා යාපනයේ ශු. මාටින් දෙව්සත්හල ආරම්භ කරන ලදි. නිල වශයෙන් මෙය නම් කරන ලද්දේ ක්‍රි.ව. 1874 දී ය. මෙහි අරක්ගත් මුනිවර ප්‍රංසයේ ටුවර්ස් නගරයේ මාටින් මුනිවරයා රදගුරුතුමකු මෙන් ම සිව් වැනි සත වසරේ ප්‍රංසය තුළ ආශ්‍රමස්ථ පැවදි ජීවිතය ආරම්භ කොට බෙහෙවින් ව්‍යාප්ත කළ උත්තමයෙකි.

අති උතුම් බොන්ජින් රදගුරු හිමිපාණන් ක්‍රි.ව. 1874 මාර්තු 5 වැනි දා නිකුත් කළ චක්‍ර ලේඛයක් අනුව මෙම දෙව් සත් හලේ පූජක සිසුන් 17 දෙනෙකු සහ දේව ධර්මය හදාරන සිසුන් 7 දෙනෙකු සිටිනා බව වාර්තා ගත යි. මෙම පසුව සඳහන් කළ හත් දෙනා අතර එක් තේවාචාර්ය තුමකු ද සිටින වග සඳහන් ය.

ආරම්භයේ දී සිසුන් සියලු දෙනා නේවාසිකව රැඳී සිටියේ රදගුරු නිවෙසේ මැ යි. එහෙත් 1878 දී ඒ අවට තිබී ලබා ගත් විශාල බිම් කොටසක පිහිටි පැරැණි ගොඩනැගිල්ලක් වෙත ඔවුන් ගෙන යන ලදි. මෙහි ප්‍රථමවර අධ්‍යක්ෂ ධුරය දැරුවේ ගරු සී. මැසියේ පියතුමා ය.

නොබෝ කලකින් හෙවත් 1884 දී, මෙම පැරැණි ගොඩනැගිලි ඉවත් කැර දමන ලදි. ඒ වෙනුවට වඩාත් ඉඩ කඩ ඇති විශාල ගොඩනැගිලි සඳහා ක්‍රි.ව. 1889 දී ඉදිකිරීම් ආරම්භකොට නිම කරන ලදි. මෙම මහඟු කාර්යය බාරව සිටියේ ගරු ජේ. බී. මියරි පියතුමා ය. මෙ තුමා ක්‍රි.ව. 1901 සිට 1924 දක්වා කොළඹ කොටහේනේ සාන්ත ලුසියා ආසන දෙව්මැඳුර බාරව සිටි අතර එම දෙව්මැඳුර අද තත්ත්වයට අලංකාර කරන ලද්දේ ද එතුමන් විසිනි.

යාපනේ දෙව් සත් හලේ පුහුණුව ලබා පූජකවරයට ඇතුළු කරන ලද ප්‍රථම පුද්ගලයා ගරු සවරිමුත්තු සන්ද්‍රසාගර පියතුමා ය. එතුමන් පූජක වරම් ලද්දේ 1876 දෙසැම්බර මස 29 වැනි දා ය. කොළඹ අගරදගුරු වසමේ සේවා කළ ගරු ජෝන් පහමුණේ පියතුමා ද පූජක පුහුණුව ලැබුවේ එම දෙව් සත් හලෙන් ය.

ගරු පහමුණේ පියතුමා පසු කල "ද කැතලික් මැසෙන්ජර්" පුවත්පතේ ද , 1912 නොවැම්බර මස 28 වැනි දා සිට "ඥානාර්ථ ප්‍රදීපය" පුවත් පතේ ද සංස්කාරක සැටියට සේවා කැර ඇත. පහමුණේ පියතුමා අති පූජ්‍ය පහමුණේ ශ්‍රී සරණංකර සුමංගල මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ එක් කුසේ උපන් සොහොයුරෙකි. මෙම නාහිමිපාණෝ මල් වතු පාර්ශ්වයේ මහානායක තනතුරට පත් වූයේ ක්‍රි.ව. 1927 දෙසැම්බර මස 9 වැනි දා ය.

පැදි නදිය

## පැදිනදියට නිර්මාණ එවන ඔබටයි!

**පැදි නදිය සඳහා නිර්මාණ එවීමේදී කරුණාකර තමන්ගේ නිර්මාණ පමණක් එවන්න. සෑම නිර්මාණයක් සමඟම නම, ලිපිනය, දුරකතන අංකය ලියා එය තමන්ගේම නිර්මාණයක් බවට සහතික කර එවිය යුතුය. විශේෂයෙන් අන්‍යයන්ගේ නිර්මාණ උපුටාගෙන හෝ සොරකම් කරගෙන තමන්ගේ නමින් එවීමෙන් නිර්මාණ හැකියාව වැඩි දියුණු කර ගත නොහැකි අතර අන්‍යයන්ගේ නිර්මාණ තමන්ගේ නමින් පළකර ගැනීමට යෑමෙන් වංචාකාරයකු/ වංචාකාරියක යන අවමානය මිස කිසිදු සෙතක් අත් නොවන බැව් කරුණාවෙන් සලකන්න.**





## නව ජීවිත ගමනට......!

| | |
|---|---|
| ඇරදෙන දොරටු යුග ජීවිත ගමන් | මගේ |
| පියවර තබන වරලැබ දෙවිඳුගෙන් | සගේ |
| යන්නට පෙරට අදරැති මව්පියන් | වගේ |
| අතුරමි ශ්‍රීමනී දුව සුබ පැතුම් | මගේ |
| | |
| පවුලේ සුසුදු ආදර්ශය නොමඳ | ගෙන |
| දුක සැප දෙකට එකලෙසටම මුහුණ | දෙන |
| දිවියක් ගෙවන්නට අදරින් | සබැඳෙමින |
| ආසිරි පතමි ඔබ දෙපලට | සොම්නසින |

**පස්කල් ජයමාන්න** - උස්වැටකෙයියාව



## දයාබර අම්මේ

| | |
|---|---|
| දියණියන් පස් දෙනෙකු මෙලොවට බිහිකළ | අම්මේ |
| ජීවිතයම දරුවන් වෙනුවෙන් කැප කළ | අම්මේ |
| දහදුක් විඳිමින් අප ලොකු මහත් කළ | අම්මේ |
| අප අතහැර ඔබ දෙවිඳුන් වෙත ගියා | අම්මේ |
| | |
| එක බත් පිඟානක් අනා අප වටකර කැවූ | අම්මේ |
| එක විධියට අන්දවා අපෙ හැඩ බැලූ | අම්මේ |
| එක මග යමින් අප සුරැකුම වූ | අම්මේ |
| අද ඔබ තනිව කොහිදැයි නොදනිමි | අම්මේ |

**ලිලන්ති පීරිස්** - කොරළවැල්ල



## ඉන්ද්‍ර නීල මාණික්‍යය

| | |
|---|---|
| සදා සරණ දෙව් උල්පත කිතු දනහට | ලොවේ |
| ජම්ම දෝෂයෙන් නිදොස්වූ පිවිතුරු දෙව් | මවේ |
| දේව වන්දනාවෙන් දෙන ආත්මීක | සුවේ |
| සිරස ප්‍රණාමෙන් වඳිනෙමි ඔබහට මරි | මවේ |
| | |
| මර්යදාවයේ කැඩපත දෙව් මවු ලෝ | රැජිණ |
| මධුර මනෝහර ගී පද ඔබ පසසා | ගෙතුණ |
| දෙව් මෙහෙයෙදි ගායන බිඟු කැල රිද්මෙට | ගයන |
| බැතිමල් පුදති හදවිල මරිය මවුට | පිදෙන |

**නුංගමුගොඩ විල්සන් රුද්‍රිගු**

## පුදම් උපන් දිනේ - මලින් ඔබේ ගෙලේ


| | |
|---|---|
| දෙව් මව් පදවිය දෙන්නට දෙවිඳුන් තෝරා ගත් ළඳ | මරියේ |
| සෝදා පව් සැම උපදින්නට පෙර පිරිසිදු වූ ඔබ | මරියේ |
| වනිතා උත්තම සිරුල දරන්නට ලොවට උපන් ඔබ | මරියේ |
| මල් දම් පලදමු බෙර හඬ නංවමු ජේසුගෙ මව වූ | මරියේ |
| | |
| කුස ගවහල කොට දෙවිඳු මහිමය ලොවට සියු ළඳ | මරියේ |
| ජේසුට ඔවදන් දෙමින් පෙමින් කල් යැවූ මවයි ඔබ | මරියේ |
| ලොව පව් සෝදා ගලවා ගන්නට ජේසුට මඟ වූ මව් | මරියේ |
| ඔබ ඉපදුන දා දෙවිඳුගෙ ආදර කතාව පැවසු ඔබ | මරියේ |

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පෑ.තු.නි සොයුරු**

## නමදිමි ඔබෙ දෙපා සමිඳේ!

| | |
|---|---|
| මා ඔත්පලව මඟ වැටුණු කල පිහිටට සිටි | සමිඳේ |
| අතැඟිලි අල්ලා නැගිටින්ට වෙර දුන් ආදර | සමිඳේ |
| මරණය අභියස කඳුළු හෙලද්දී දෑස පිසදැමු | සමිඳේ |
| ජීවයේ අරුත රහසේ කොඳුරා සවනට කී | සමිඳේ |
| | |
| අපිරිමිත සෙනෙහෙන් ගතසිත සැනහු පෙම්බර | සමිඳේ |
| උත්තරීතර ආදරය මාහට දුන්නේ ඔබමය | සමිඳේ |
| ලෝසත හට ගැලවුම දෙන්නට ශ්‍රී රුධිරය වැගිරූ | සමිඳේ |
| කුරුසිය පාමුල මා නිරතුරුවම ඔබ දෙපා නමදිමි | සමිඳේ |

**දීපානි රේණුකා**
කුරණ



## මගේ තාත්තා

අහසට හිරු සඳ වාගේ
වැජඹුන මගේ තාත්තා
ගුණැති සුවඳ පිරුණ මලක්
සිහිවේ මගේ තාත්තා

අත්දෙක වැඳගෙන සැමදා
දෙවිඳු වැන්ද තාත්තා
බාලවියේදිම තනිකර මා
සුරලොව ගිය තාත්තා

**සෙලීන් ෆොන්සේකා**
බෙල්ලන්විල

## අළුත් ලොවකට ඇරියුමක්

දෙව් පුතුගෙ මව්නේ
සිහි කරමි නිරතුරේ
ගුණ මහිම අගය කර
පසසමී ගයනෙමී

කරුණාව ආදරය
සෙනෙහසේ ඉවසීම
මුව මඬල ඉතිරිලා
කා තුළත් සමානව
මිහිතලය බබලවන
මෑණියනි ඔබ සුවඳ
පතුරලා වපුරලා

කිලිටි වූ සිත් සතන්
ඉරිතැලූ මහ පොළොව
සෝදලා ඔබෙ ගුණෙන්
පොද වැස්ස වස්වලා
නැවුම් මල් පූදන්න

**අජිත් කමල්ප්‍රිය ජයලත්**
බොල්ලත

## උසස් පෙළට පයින් ගසයි

උසස් පෙළට දරුවෝ ඉඳලා
මහ මෙරකට වඩා උඩින්
බලා සිටියා ප්‍රතිඵල ගැන

මහ එවුන්ගේ නොසැලකිල්ල
ආයෙත් බලපෑවා රටට
එක යුගයක අනාගතය
අඳුරු වෙනවා වගේ වුනා

රැයක් දවාලක් නොමැතිව
නිදි මරලා මහන්සි වී
විභාගයේ අභාග්‍යය
හිතට දැනෙන්නට අරගෙන

නගරයේ ටියුෂන් කඩේට
මාස් පතා ගෙව්ව මුදල්
අම්මා අප්පා හොයලා දුන්නු
හැටි සිහිවෙද්දී මගේ
දෙනෙත් පුරා කඳුළු පිරෙයි

මමයි ගෙදර පළමු පුතා
තියෙනවා යුතුකම් හරියට
විභාගයේ ලකුණු බලලා
හිතුවා කරන්නට රැකියා

කාලය යයි පියාඹලා
තාරුණ්‍යය ගෙවන යුගයේ
රළ පිට රළ බිඳෙනා සේ
එක පිට එක සුන්වීලා
බලාපොරොත්තුත් බිඳ යයි

මෙහෙම උනොත් ටික කලකින්
තාරුණ්‍යයේ අසහනයට
වගකිව යුත්තේ කවුරුද
කියන පැනේ රටේ තිබේ

නොතේරෙනා සූත්තරෙන්
විභාගයේ ලකුණු දමා
සුනාමියක් සේ කැලඹී
ලකුණු දැක්ක තරුණ දරුවෝ
බොර කර ගනී ජීවිත විල

**ගරු හැරල්ඩ් මැක්සිමස් රුද්‍රිගුපුල්ලේ පියතුමා**
අවිස්සාවේල්ල

## නොදැනීමේ තරම

දන්නා අප තරම
ගසක අත මිට
කඩා ගත් ප්‍රමාණික
කොල ටික පමණි
එම ගසේ කොලද
වනයේම නෙක ගස්වල
කොලවල තරමට
අප නොදන්නා
සිතන්නට ඇති
දෙය අප්‍රමාණිකය

**ඒ. ඩී. සුනිල්**
හේකිත්ත



## අඳුර

ලයිට් ගියාම පේන්නේ නෑනේ
ඊත් ආවාම පේනවා!
ඊත් ඒ දෙපාරම, මම
ඇස් ඇරගෙනයි හිටියේ......


**ඒ. වියානි ඔගස්ටස් ගුණවර්ධන**
ගුරුගල්ල

## සිපිරිගෙයි අඳෝනාව!

අධර්මයේ ගංදැල
හද නිවූ අතීතය........!
පාපයේ මායාව,
මා සෙවූ අතීතය.............!
අහෝ! යටගියාව බිය කරුය
විශ්වයේ මහිමයට
කෙළි කවට කළ දවස..........!
මනුෂ්‍ය ලෝකයට.
තිරිසනෙක් වූ දවස.........!
ජූරියේ තීන්දුවට,
මිනීමරු වූ දවස ...............!
තවම මතකය,
සිත හැරිණි, පව්දුටිමි,
වැළපුනෙමි
නිදහස අහිමිය
නමුදු හදේ පැතුමකි..........!
සිපිරිගෙයි අඳෝනාව
අසන්නෝ කවරහුද?
යදිනු මැන සමිඳුන්ට
ප්‍රේමයේ මහිමයෙන්
සග අගුළු හරින ලෙස
පව්කාර මා වෙතට.......

**මීරියම් රුවන්ති තිසේරා**
බ/ කොළින්ජාඩිය

## සිතමු ටිකක්



| | |
|---|---|
| *තණමත රැඳි පිනිබිඳු නැතිවන* | *විලසේ* |
| *සොයනා සියළු සම්පත් වියැකෙයි* | *එලෙසේ* |
| *නැතිවන එවැනි දේවල් ගැන අපි* | *මෙලෙසේ* |
| *හඹා නොගොස් යමු සග දිවි ලබනා* | *විලසේ* |
| | |
| *වෛරය මෙන්ම ක්‍රෝධය යන නපුරු* | *නිවා* |
| *සොහොයුරු පෙමින් පුරවමු සිත් සතන්* | *පවා* |
| *ගෙන යමු දිවිය මිනිසත්කම හදෙහි* | *දවා* |
| *එකමුතු කම ගොඩ නංවමු ඉසුර* | *නිවා* |
| | |
| *මිනිසත්කම ලැබ ඉපදුන අපි* | *සැවොම* |
| *ජීවත් වෙද්දි හමුවෙයි දුක සැප* | *දෙකම* |
| *පීඩන මැඩගන්න හමුවන* | *එ මොහොතෙදිම* |
| *උපදෙස් දහමෙ ඇත පිළිපදිනව නම්* | *සැවොම* |

**සිරිල් අමරතුංග**
බෝලවලාන

## මීගමු වැල්ලේ නූතන සිවු පද

| | |
|---|---|
| *කලපුව උඩින් ඇති පාලම බලං* | *යාළු* |
| *පාලම යටින් පීනා ගෙන යති* | *මාළු* |
| *පාලම උඩට මහ ලෙල්ලම දිස්* | *වේලු* |
| *කෑකෝ ගසන දන එහි දුරලති* | *පාලු* |
| | |
| *පාලු වෙරළ රෑ නිහඬව නිදන* | *වලු* |
| *මාළු අරන් උදයට ඇහැ ඇරෙන* | *වලු* |
| *වීළු නොවෙයි මෙය කව්රුත් කියන* | *වලු* |
| *යාළු වුනත් මස් දුටු ඇස් වැහෙන* | *වලු* |
| | |
| *මීගමු වැල්ලෙ නව වෙළඳම් පොළ* | *මාළු* |
| *මුළු පරිසරය ලස්සන කර දෙන* | *වාලු* |
| *පියකරු බව්න් සුදිළෙන මල ලෙස* | *ඕලු* |
| *පේදුරු තුමාගේ පිළිරුව දිස්* | *වේලු* |

**දළුපත පිලීෂියන්**

## කවදාද


**මිනිස් දැතින්
තැනු
දේව රූප
තැන තැන
දෙපස
මං මාවතේ......
එනමුත්
මිනිස් වර්ගයා
තවම
තිරිසන් ගමනේ....
කවදා දේව
ශ්‍රද්ධාව උපදිද ?**

**අනුර ශාන්ත පීරිස්**
හලාවත



බැසිල් ෆොන්සේකා විසිනි

# ගබ්සාවට එරෙහි සංවිධාන 100 ක් වීදි බසිති




ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නගරයේ 100 කට අධික සංවිධානයන් එක්ව ගබ්සාවට එරෙහිව වීථි බසී. ලබන මාසයේ පැවැත්වීමට නියමිත මෙම ජාත්‍යන්තර උද්ඝෝෂනයට ලෝකයේ බොහෝ රටවල් සහභාගි වීමට බලාපොරොත්තු වේ.

ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නගරය සහ තවත් නගර 60 ක පමණ ජනතාව මේ වසරේ ඔක්තෝබර් මාසයේදී ජාත්‍යන්තර රැස්වීමක් කැඳවමින් ගබ්සාවට විපක්ෂව රජය හා අන් රජයන් විසින් ගෙන ඇති තීරණ හකුලා ගන්නා ලෙසට බලකර සිටීමට සූදානම් වෙයි. ඔවුන්ගේ සටන් පාඨය වනුයේ "ජීවිතයට බලයයි - ගබ්සාවට බිංදුවයි" යනුයි. මරණීය දණ්ඩනයට විරුද්ධව කෙරෙන උද්ඝෝෂණයන් ද ඊට සමගාමීව කෙරෙයි. දවසේ දවල් 12 ට ඇරැඹීමට නියමිත මේ දැවැන්ත පෙළපාලිය ස්පාඤ්ඤයේ තානාපති කාර්යාල හරහා ද යමින් ලෝ වටා ව්‍යාප්ත කිරීමට ද නියමිතය. මීට සහභාගිවන රටවල් අතර ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, කැනඩාව, මහා බ්‍රිතාන්‍ය, රුසියාව, නෝර්වේ ප්‍රමුඛ ස්ථානයක් ගනී. මීට අමතරව ජාත්‍යන්තර ජනගහන පර්යේෂණ ආයතනය ද ලෝක පවුල් සංවිධානය ද යුරෝපා ක්‍රිස්ටීනා ඩෙපරේෂන් ආදී ජගත් සංවිධාන ද සහයෝගය දක්වනු ලැබේ.

# ගබ්සාවට එරෙහි සටන් වැදි ලෝ ප්‍රථම කාන්තාව 86 වැනි වියේදී දිවියෙන් සමුගනී

ඇමෙරිකාවේ වොෂින්ටන් නගරයේ ඒ 1973 දී ගබ්සාවට අවසර දෙමින් ප්‍රකාශ කළ සුප්‍රිමාධිකරණ තීන්දුවට එරෙහිව සටන් වැදි ලොව ප්‍රථම කාන්තාව වන නෙලී ග්‍රේ මහත්මිය පසුගිය අගෝස්තු මස 13 වෙනිදා 86 වෙනි වියේදී දිවියෙන් සමු ගත්තාය.

වොෂින්ටන් නගරයේ කපිටෝල් හිල්" හී පිහිටි ඇගේ නිවසේදී ඇය ස්වභාවික හේතූන් මත ජීවිතයෙන් සමුගත් බව වාර්තා කර තිබුණේ ප්‍රජනනය අළලා ඇගේ සුවිසල් මෙහෙවර ලෝක ජනතාවගේ ගෞරවයට පාත්‍ර කරවමිනි. ටෙක්සාස් හී උපත ලද ඇය 1974 දී "මාර්ච් ෆෝ ලයිෆ්" යන සංවිධානය ඈ විසින්ම පිහිටුවා ගන්නා ලදී. ඇගේ මුළු ජීවිතය ප්‍රජනන ක්‍රියාවලියන් වෙනුවෙන් කැපකළ අතර ලෝකයේ බොහෝ රටවලද සංවිධාන හා ජනතාවෝ ජීවිත සුරැකීමේ මෙහෙවර සඳහා ඈ හා එක්ව සිටියහ.

ග්‍රේ මහත්මිය වොෂින්ටන් හී සාන්ත මරියා දේවස්ථානයේ ඇදැහිළිවන්තියක් වූ අතර කාන්තා බලකායේ කොපරල් වරියක ලෙසද සේවය කර ඇත. ඈ නීතිඥ වරියක වශයෙන් ද කටයුතු කළේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ කරුණු කාරනා වලදී ජනතාවගේ පැත්ත ගනිමිනි. නෙලී ග්‍රේ උත්පත්තියෙන් කතෝලික නොවූවත් පසුකාලයේදී කතෝලික ධර්මය වැළැඳගෙන කතෝලික උගැන්වීම් අනුව ජීවිත වෙමින් ජීවිත ජීවත් කරවීම වෙනුවෙන් මුළු ජීවිතයම කැපකොට "ජාත්‍යන්තර අම්මා" යන විරුදාවලිය ලබන්ට තරම් භාග්‍යවන්ත වූවාය.




# රන් පදක්කම් ලාභී බ්‍රසීලියානු ක්‍රීඩිකාවෝ දෙවිඳුන් පසසති

බ්‍රසීලයේ අත්පන්දු ක්‍රීඩිකාවෝ ඇමෙරිකා එක්සත් ජනපදයේ කණ්ඩායම පරදවා, ඔලිම්පික් අවසන් තරගයෙන් ජයග්‍රහණය කොට රන් පදක්කම දිනා ගත්තෝය. ඔවුන්ගේ ප්‍රීතිය නිම්හිම් ගියද, නිමේෂයකින් සිය පුහුණුකරුවන් සමග පොළවේ දණ ගසා පරමණ්ඩල ආරාධනාව හඬ නගා එක්ව උච්චාරණය කළෝය.

ඔවුන්ගේ ප්‍රීති භාවනාවට ස්වර්ගයේ දූතිකාවන් ද එක්වන්නට ඇතැයි කිතුනු පුවත් වාර්තා කරයි. ජෝර්ජ් රොබෙර්තො 'බ්‍රසීලියානු අත්පන්දු ක්‍රීඩිකාවන්ගේ පුහුණුකරු වේ. ඔහු විසින් මාධ්‍යයට පවසනු ලැබුවේ, තමා ස්පාඤ්ඤය කරා ආපසු ගියගමන්මැ සිය බිරිඳ සමග තමන් අයත් සාන්ත ජේම්ස් දෙව් මැඳුරට ගොස් ස්තුතිවතාවත් පවත්වන බවයි. තවද එංගලන්තයට පැමිණීමට ප්‍රථම සමිඳුන් හමුවේ ප්‍රතිඥා දුන් පරිදි සිය බිරිඳ කැටිව පාදනමස්කාරයේ නිරත වන බව ද ඔහු විසින් මාධ්‍යයට ප්‍රකාශ කරනු ලැබ ඇත. "අප ක්‍රීඩාවට සහභාගි වීම සඳහා සූදානම් කාලය පුරාම මාගේ ආදරණීය බිරිඳ යාච්ඤාවේ යෙදී සිටියාය. අපේ කණ්ඩායම ක්‍රීඩාවේ යෙදුනු කාල පරාසය තුළද මම ඔවුන් සමග දේවාභිමුවෙහි සිටියෙමු. මෙම දේව හස්තයේ අපූරු සත්‍ය කථාව යම් කිසිවකු විසින් කලා මාධ්‍යයෙන් ප්‍රකාශ කරනු ලැබේ නම් අපි අතිශය සතුටට පත්වෙමු." ජෝර්ජ්



රොබෙර්තෝ මෙලෙසින් අවධාරණය කරනු ලැබුවේ සිය කණ්ඩායමේ අදැහිල්ලේ සාක්ෂිය හුවා දක්වමිනි.

# පිලිපීන ප්‍රත්‍යුත්පාදක පනතට රදගුරු හිමියෝ විරෝධය පාති

"ප්‍රත්‍යුත්පාදක සෞඛ්‍ය ප්‍රවර්ධනය" යනුවෙන් නම් කරැති උපත් පාලනය කිරීමේ ක්‍රමවේදයන් අන්තර්ගත පනත සංශෝධන සහිතව අනුමත කිරීමට නියමිතය. කාලයක් පුරා පිලිපීන රදගුරු මණ්ඩලය විසින් කතෝලික ජනතාව ද සමඟ ඉදිරිපත් කරනු ලැබූ සියළු විරෝධතාවයන් පසෙකලා එම පනත සම්මත කරනු ලැබීමට නියමිතයි.

මෙම පනතේ විදි විධාන මඟින් ලෝ පුරා පවත්නා උපත් පාලන ක්‍රම වේදයන් උපයෝගි කර ගැන්මද පස්වැනි ශ්‍රේණියේ සිට පාසල් දරුවන්ට ලිංගික අධ්‍යාපනය ලබාදීම ද සම්මත උපත් පාලන ක්‍රියාදාමයන්ට එරෙහි වන්නාවූ ජනතාවට නීති මගින් දඬුවම් පැමිණවීම ද සේව්‍යයන් විසින් සේවකයන්ට උපත් පාලනයන් සඳහා ආධාර උපකාර ලබාදීම ද ආදි නීති රැසක් අදාල පනතේ අඩංගු බැව් පිලිපීන රදගුරු මණ්ඩලය විසින් ප්‍රකාශයට පමුණුවා ඇත. උදාවී ඇති බරපතළ තත්ත්වය හමුවේ පිලිපීන දේශයේ බලධාරීන් හට දේවානුකම්පාව ලැබේවායි රදගුරු හිමිවරු ප්‍රාර්ථනා කරති.

කාලයක් පුරා පැවැති විරෝධතාවයන් තවදුරටත් පවත්වාගෙන යා යුතු යයි රදගුරු හිමියෝ උපදෙස් දෙති. පසුගිය සතියේදී තරුණ තරුණියන් දහදහකට වැඩි සංඛ්‍යාවක් සහභාගි වූ විරෝධතා රැළියක් පැවැති අතර රැළිය අවසානයේදී ගෙබ්‍රියෙල් රායෙස් රදගුරු තුමන් විසින් දිව්‍ය යාගයද සිදු කරනු ලැබීය. විශ්‍රාමික රදගුරු නියන්දොරෝ ඔනෙත් උතුමාණන් විසින් සිය අනුශාසනාවේදී දක්වනු ලැබුවේ එම දීනහීන පනත අකිනෝ ජනපතිගේ හිතුවක්කාර තීරණයක් බවයි.

# 2012 'පැක්ස් ක්‍රිස්ටි' සාම ත්‍යාගය රදගුරු නමකට



අප්‍රිකා දේශයේ මෙන්මැ තමන් උපන් රටවන නයිජීරියාවේ ද, සමොයාන්තර කතිකාව මගින්, ආගමික නිදහස තහවුරු කරවීමට කැපවී කටයුතු කරනු ලබන අබුජා හී අගරදගුරු අති උතුම් ජෝන් ඔනයියෙකාන් හිමිපාණන් 2012 වසරේ සාම ලාභියා වශයෙන් 'පක්ෂ් ක්‍රිස්ටි' කතෝලික සංවිධානය විසින් නම් කර ඇත.

එතුමා වෙත එම සාම ත්‍යාගය පුද දෙනු ලැබ ඇත්තේ, වර්තමානයේදී නයිජීරියාවේ පවත්නා කිතුනු තාඩන පීඩන හමුවේය. මෙම වසර ආරම්භයේ සිට මෙතෙක් නයිජීරියාවේ 'බිකෝ හරාම්' නමැති ඉස්ලාමීය ත්‍රස්ත කණ්ඩායම් විසින් කිතුනුවන් විශාල සංඛ්‍යාවක් මරා දමා ඇත. එහෙත් පවත්නා විවිධාකාර පීඩා වාතාවරණය යටතේ වුවද සාමය සාධාරණය හා ආගමික සංහිඳියාව පිළිබඳව ඔනෙයියෙකාන් රදගුරු හිමිපාණන් විසින් ගෙනයනු ලබන ක්‍රියාදාමය අප්‍රිකානු දේශය පුරා අභියෝගාත්මක එකක් බවට පත්ව ඇත. මේ අනුව 2012 'පක්ෂ් ක්‍රිස්ටි' ජාත්‍යන්තර සාම ත්‍යාගය එතුමන් වෙත ප්‍රදානය කරනු ලැබීම සැමගේ ප්‍රශංසාවට ලක්වී ඇත. ගරු ඔනෙයියෙකාන් අගරදගුරු හිමිපාණෝ 'සාමය උදෙසා ආගම්' යන සංවිධානයේද නයිජීරියාවේ සමයාන්තර ආගමික සංසදයේ ද පක්ෂ් ක්‍රිස්ටි සංවිධානයේ ද සම සභාපති වරයකු වශයෙන් ක්‍රියා කරති. 'පක්ෂ් ක්‍රිස්ටි' කතෝලික ආයතනය විසින් වසරක් පාසා මෙම සාම ත්‍යාගය පිදෙනු ලබන්නේ සාමය හා සාධාරණත්වය සඳහා කැපවූ පුද්ගලයකුටයි. 'පක්ෂ් ක්‍රිස්ටි' ආයතනය විසින් සාම වීර වරුන් වන මහත්මා ගන්ධි, මාර්ටින් ලූතර් කිං ආදී මහ පුරුෂයන් ද ගෞරවයට පමුණුවා ඇත.

## කුරුසිය වෙනුවට හෝ චි මිං පිළිරුව

පසුගිය සතියේ, ඉරුදිනැ යැදුම සිදුවෙද්දී, දක්ෂිණ වියට්නාමයේ එක් ගමක පිහිටි කුඩා දෙව් මැඳුරකට ඇතුළු වූ ආණ්ඩුවේ රාජ්‍ය බලධාරීහු පිරිසක් දෙව් මැඳුරේ කුඩා අල්තාරයත්, කුරුසයත්, දේවමාතා පිළිරුවත් ඉවත් කිරීමට අණ කළෝය. ඔවුන්ගේ අණ පිළිපැදීම මිස අන් කිසිවක් කළ නොහැකි වූ කතෝලික සුළු පිරිස විසින් එම ආගමික භාණ්ඩයන් ඉවත් කොට කණ්ඩායම් නායකයා වෙත බාර දෙන ලදී. එහි පැමිණි එක් කොමියුනිස්ට් බලධාරියෙක් කුරුසිය තුබු ස්ථානයේ ඔවුන්ගේ හෝ චි මිං නායකයාගේ පිළිරුවක් සවි කළේය. එම අවස්ථාවේදී කතෝලික පිරිස කඳුළු පිරි දෙනෙතින් හිස නමා සිටියෝය. බලධාරියෝ පසුදා පැමිණ දෙව් මැඳුරේ ඝංඨාරය ගළවා දැමුවෝය. කණ්ඩායම් නායකයා විසින් එම ඝංඨාරය ද සිය නිවස කරා ගෙනයන ලදී. තවද රාජ්‍ය නිළධාරීන් විසින් තරවටු කරනු ලැබුවේ, මින් ඉදිරියට එම ස්ථානය දෙව් මැඳුරක් ලෙසින් ප්‍රයෝජනයට ගැනීම තහනම් බවයි. එම ගොඩනැගිල්ල ගම්වාසීන් හමුවන ස්ථානයක් බවට පත් කරනා බැව් ද දන්වා ඇත. මෙම කුඩා දෙව් මැඳුර තනා ඇත්තේ 1999 වර්ෂයේදීය. ප්‍රදේශයේ ජීවත් වන සුළු ජන කොටස් සිය ආගමික කටයුතු කරගෙන ගෙස් ඇත්තේ මෙම දෙව් මැඳුර තුළය. එමෙන්මැ එම ප්‍රදේශයේ එකට ජීවත්වන ලාදුරු රෝගීන් පිරිසක් ද එම දෙව් මැඳුරට පැමිණ කතෝලිකයන්ගේ ආධාර උපකාර ලබා ගැනීමට පුරුදුව සිටියහ. වසරේ අවස්ථාවන් එක දෙකකදී පමණක් පූජකවරයකුගේ සහාය ඔවුන්ට ලැබෙන බවද වාර්තා වේ. අදාළ සිද්ධිය ආරංචි වීමෙන් ප්‍රදේශයේ මයිකල් හොආන් දුඕ නම් රදගුරු හිමිපාණෝ එහි පැමිණ කතෝලික පිරිස අස්වසාලමින් ඇදැහිල්ල තුළ ජීවත් වීම සඳහා ඔවුන් දිරිමත් කළෝය.

## ඉරානයේ කිතුනු පීඩනය දිගින් දිගට

ඉරානයේ පවත්නා කිතුනු පීඩනය කොතරම් දරුණු වූවත් එරටේ සුප්‍රකට ඉස්ලාම් බැතිමතකු වූ පාර්ෂිඩ් පාර්ති සිය උපන් ආගම අතහැර කිතුනුවකු වූයේ තම හෘද සාක්ෂිය අනුව යයි ඔහු විසින් පැවැසේ. තමාට අයිති නිවසක් ගෘහස්ත දෙව් මැඳුරක් බවට පත්කොට කිතු දහම අනුව ජීවත් වන්නට කැමති අයවලුන්ට එම ස්ථානයට පැමින දෙවිඳුන් අත්දැකීමේ වාතාවරණයක් ඔහු විසින් උදා කර දෙනු ලැබිණි. එහෙත් එම ක්‍රියාව කෙරෙහි බලධාරීහු ක්‍රෝධයට පත්ව ඔහු කෙරෙහි වෛරය බැඳ ගත්තෝය. එම නිසාවෙන් ජනතාව රැස් කිරීමෙන් රටේ ආරක්ෂාවට බාධා පමුණුවා ඇතැයි යන චෝදනාව මත ඔහු සිර භාරයට ගන්නා ලදි. ඔහු කෙරෙහි එල්ල වූ තවත් චෝදනාවක් වූයේ මුදල් ගෙවා ඉස්ලාම් බැතිමතුන් කිතු දහමට හරවා ගන්නා බවයි. ඔහු හිරභාරයට ගනු ලැබුවේ 2010 වර්ෂයේදීය. එසේ හිර බාරයේ සිටියදී පහල උසාවිය විසින් ඔහු හට හය වසරක හිර දඬුවමක් පනවන ලදී. මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියා කරුවන් විසින් එම තීරණය යළි සළකා බලන ලෙසට ඉහළ උසාවිය වෙත ඇපෑලක් ඉදිරිපත් කර තිබුණත් පසුගිය සතියේදී ඉහළ උසාවිය විසින් ද මුල් තීන්දුව සනාථ කරනු ලැබ ඇත. එම තීරණයට එරෙහිව ජාත්‍යන්තර මාධ්‍යයන් විසින් හඬක් නැඟුනත් ඉරාන බලවතුන් එවැනි හඬක් නැසුනාසේ නිහඬ වී සිටිනා බැව් ජාත්‍යන්තර පුවත් වාර්තා කරයි.

## උපත් පාලනයෙන් සිංගප්පූරු ජාතිය නැතිවේද?

සිංගප්පූරු වැසියන් ප්‍රජනනයෙන් වැළැකී සිටියහොත් සිංගප්පූරු ජාතිය ක්‍රමයෙන් වඳ වන්නට ඉඩ ඇතැයි හිටපු අගමැති ලීක්වාන් යු පවසයි. ජාතික උත්සව දිනැ රාත්‍රි භෝජනයෙන් පසුව, සිංගප්පූරු ජාතික උපත් සංඛ්‍යාව සීඝ්‍රයෙන් පහළ බසිමින් පවතින බව අවධාරණය කරමින් ඔහු මෙසේද කීය. "අපි මේ විදිහට ගියොත් රටේ බහුතරය සිංගප්පූරු ජාතිකයන්ගෙන් ගිලිහී යාමට ඉඩ තිබෙනවා. ඒ නිසාවෙන් නව පරපුරක් බිහිවන්නට නොහැකි වීමෙන් අපේ දේශීයත්වය, දේශානුරාගය, චාරිත්‍ර වාරිත්‍ර, අළුත් සම්බන්ධතා පවත්වා ගැනීම ක්‍රමයෙන් හීන වීමට ඉඩ ඇත." චීන ජාතිකයන්ගේ ප්‍රතිඋත්පාදන වේගය දැනට 1,08 ද, ඉන්දියානුවන්ගේ 1.09 සහ මැලේසියානුවන්ගේ 1,46 බව පෙන්වා දෙමින් මෙසේද කීය. "මගේ පණිවුඩය සරළ එකක් නොවේ. අපි මේ ප්‍රශ්නයට පිළිතුරු නොසොයා සිටියහොත් බැරෑරුම් තත්ත්වයකට අපට මුහුණ දීමට සිදුවෙනවා." පිටතින් රටට ඇතුළුවන ශ්‍රමිකයන් සිංගප්පූරුවේ නිත්‍ය පුරවැසිභාවය ලබා ගැනීම නිසා සිදුවනුයේ රටේ පුරවැසි ජනතාව ක්ෂය වී ප්‍රමුඛත්වය හීන වී යෑමට පත්විය හැකි බැව් ද ඔහු විසින් අවධාරනය කරන ලදි. විවාහ වීමේ හා දරුවන් ලබාගැනීම මගින් පවුලක් ඇති කිරීමේ ජාතික අවශ්‍යතාවයක් ඇති බවද ඔහු විසින් පෙන්වා දෙනු ලැබීය. අද ලෝකයේ බොහෝ රටවල පවත්නා මෙම විනාශකාරී තත්ත්වය පිළිබඳව ප්‍රජනනය අරභයා ජගත් හඬක් නංවන්නේ XVI වැනි බෙනඩික්ට් සුදොතුම් පියාණන් බවත් සියල්ලෝ දනිති.

සංවාද මණ්ඩපය

# ළමා අපචාර වැළැක්වීම : රජයට මෙන්ම වැඩිහිටියන්ට තිබෙන සමාජ වගකීමක්



රාගම වෛද්‍ය පීඨයේ ළමා රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ
ළමා ආරක්ෂක අධිකාරියේ ආරම්භක සභාපති
**මහාචාර්ය හරේන්ද්‍ර සිල්වා**

**ළමා අපචාර සම්බන්ධයෙන් කිසිවෙකුට අතහෝදා ගැනීමට හෝ ගැළවීමට හැකියාවක් නොවේ. ළමා අපරාධ දස දහස් ගණනින් හෝ සිය ගණනින් සිදුවුවද, ඒ සම්බන්ධයෙන් අප හැමෝටම වගකීමක් තිබේ.**

**ළමා අපචාර සම්බන්ධයෙන් මුල්ම වගකීම පැවරෙන්නේ රජයට ය. දෙවනුව සමාජයට හා තෙවනුව දෙමාපියන්ට ආදි වශයෙන් මෙහි වගකීම පැවරෙයි.**

**දස දහස් ගණනින් වන අපරාධ කෙසේ වෙතත් එක් අපරාධයක් හෝ අප සමාජයේ සිදුවේ නම් එය බැරෑරුම් ප්‍රශ්නයකි. රජය යම්කිසි කාල වකවානුවක සිට වාර්ෂිකව සිදුවී ඇති අපරාධ හා විශ්ලේෂණයක යෙදී ඊට සමගාමීව වර්තමානයේ අපරාධ සිදුවී නැති බව හෝ අඩුවෙන් සිදුවී ඇති බව ප්‍රකාශ කරයි නම් එය මුළු මහත් සමාජයටම බරපතළ ගැටලුවකි.**

**මේ සම්බන්ධයෙන් කතා බහ කිරීමට ප්‍රදීපයේ අප රාගම වෛද්‍ය පීඨයේ ළමා රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හා ළමා ආරක්ෂක අධිකාරියේ ආරම්භක සභාපති මහාචාර්ය හරේන්ද්‍ර ද සිල්වා මහතා හමුවීමු. එතුමන් සමග කළ කතා බහේ කෙටි සටහනක් පහතින් දක්වමු.**

## ළමා අයිතීන් හා මානව අයිතීන් දෙකක් නොව එකකි

මෙහි පැතිකඩ දෙකක් තිබේ. එක් කාරණයක් වන්නේ රජය පවසන ආකාරයට ළමා අපයෝජන සම්බන්ධව වැඩි වශයෙන් මාධ්‍ය මඟින් ප්‍රචාරය වන විට ඒවායේ වර්ධනයක් සිදුවන බවයි. එය සත්‍යයකි. ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය ආරම්භයේ දීම ළමා අපයෝජනයන් වලට එරෙහි වීම සම්බන්ධ වැඩි අවධානයක් යොමු කරනු ලැබීය.

ළමා අපයෝජන සම්බන්ධ අවධානය වැඩිකරන තරමට මාධ්‍ය මඟින් වාර්තාවන තත්ත්වය ද ක්‍රමයෙන් වැඩි විය. මාධ්‍ය මඟින් වාර්තා වන නිසා මෙම ගැටලුව විසඳිය හැකි විය යුතුයි. එසේ නම් ඒවාට එරෙහිව ක්‍රියාත්මක වී රජයක් ලෙසට සහ සමාජයක් ලෙසට මෙන්ම පොලීසියක් ලෙසට හා දෙමාපියන් ලෙසට ද අප ක්‍රියාත්මක විය යුතුයි. අපරාධ වර්ධනය වන ප්‍රමාණයට ඒවා මාධ්‍ය මඟින් වාර්තා වී විසඳුම් සොයා නැත්නම් පිළියම් සඳහා ක්‍රියාත්මක වී නැති බව හැඟවෙයි.

මෙහිදී මා මතුකරන අනෙක් කාරණය වන්නේ වර්තමානයේ සිදුවන ළමා හා කාන්තා අපයෝජනයන් සම්බන්ධයෙන් ආණ්ඩුවට එක්තරා බලපෑමක් සිදුවීමයි. සත්‍ය වශයෙන්ම ජාතික වශයෙන් හෝ දේශපාලනික වශයෙන් මේ සම්බන්ධයෙන් බලපෑමක් තිබේ. බලපෑමක් තිබුණත් නැතත් ප්‍රශ්නයක් තිබේ නම් බලපෑම් කිරීම සාධාරණ නොවේ ද?

ඊළඟ කාරණය ලෙස මා අවධාරණය කරන්නේ ළමයා, වැඩිහිටියා, සමාජය හා දේශපාලනය වෙන් කළ නොහැකි බව අමතක නොකළ යුතුයි. සමාජය ආගමික හා වෙනත් ස්ථරයන් වලට වෙන් කළ හැකියි. ළමා අයිතින් පිළිඳව කථා කළත් මානව හිමිකම් පිළිබඳව කතා කළත් මේවා ප්‍රශ්න දෙකක් නොව එක් ප්‍රශ්නයකි.

ළමයා ද මනුෂ්‍යයෙකි. ප්‍රමාණයෙන් කුඩා වීම නිසා කතා කිරීමේ හැකියාව නැතිවීම හා විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට නොහැකි වීම නිසා ළමයා වෙනුවෙන් වෙනත් වැඩිහිටියකුට කතා කිරීමට හෝ පෙනී සිටීමට හැකිය.

වැඩිහිටියෙක් නම් කතා කිරීමට හෝ විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට හැකියාව තිබුණත් ඔවුනට ද බලයක් හෝ හැකියාවක් නැතිනම් ඔවුන් වෙනුවෙන් මානව හිමිකම් ලෙස තවත් කොට්ඨාශයක් පෙනී සිටිය යුතුයි. එම නිසා අයිතිවාසිකම් කාරණය ද ළමයා හා වැඩිහිටියා වෙන්කර හඳුනා ගැනීම නොකළ යුතුයි. තවත් සමහරු ගැහැනු ළමයා හා පිරිමි ළමයා වශයෙන් වෙන් කිරීමට ද උත්සාහ කරති. එය ද වෙන් කළ නොහැක්කකි. මගේ දත්ත හැටියට ලංකාවේ පිරිමි දරුවන් ගැහැනු දරුවන්ට වඩා අපයෝජනයට ලක්වෙති. ගැහැනු දරුවාට සමාජයීය වශයෙන් අප මවාගත් "පතිවත" තිබේ" එය නිසා ගැහැනු දරුවා වැඩි වශයෙන් ආරක්ෂා වේ.

පිරිමි දරුවාට එවැනි සමාජයීය මතයක් නැත. පිරිමි දරුවා අපයෝජනයට ලක් වූවත් ගැබ් ගන්නේ ද නැතිය යන මතය සමාජයේ ගොඩ නැගී තිබේ. කෙසේ නමුත් කුඩා කල අපයෝජනයට ලක් වූ පිරිමි දරුවන් වැඩහිටි වියේ දී අපයෝජන කරන්නන් බවට පත් වන බව ද අප තරයේ මතක තබා ගත යුතු වෙයි. අපයෝජන කරන පුද්ගලයින්ගෙන් 70% ක් කුඩා කල අපයෝජනයට ලක් වී ඇති බව පරික්ෂණ වලින් හෙළි වී තිබේ. එසේ නම් පාරම්පරිකව ගත් කල අපයෝජනයට ලක්වන පුද්ගලයා හෙට දිනයේ අපයෝජන කරන්නෙක් බවට පත් වේ. මෙම කාරණය අප සමාජයට නොතේරෙයි.

ස්ත්‍රී අයිතිවාසිකම් ගැන කතා කරන කාන්තාවන් පිරිමි දරුවාගේ ආරක්ෂාව පිළිබඳව කතා නොකරති. ශාරීරික අපයෝජන, ලිංගික අපයෝජන හෝ මානසික අපයෝජන ගත්ත ද සමීක්ෂණ වලින් හෙළි වන්නේ අතීතයේ යම් දිනෙක අපයෝජනයට ලක් වූ පිරිමි දරුවකු වැඩිහිටියෙක් වශයෙන් අපයෝජන කරන්නකු බවට පත්වන බවයි. රටේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වේ නම් මානව අයිතීන් නිසි ලෙස ක්‍රියාත්මක නොවේ නම් එය වැඩිහිටියා, ළමයාට පමණක් නොව සෑම සියලු දෙනාටම පංති හෝ වයස් භේදයකින් තොරව බලපායි.

මානව හිමිකම් රටේ නීතියට සෘජු ලෙස බලපායි. නීතිය රැකේ නම් මානව හිමිකම් උල්ලංඝනය නොවේ.

නීතිය නිසි පරිදි රැකේ නම්, සැමටම එක ලෙස නීතිය ක්‍රියාත්මක වේ නම් ළමයින්ට හෝ වැඩිහිටියනට ද ප්‍රශ්න ඇති නොවේ. ළමයාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වනවාය යන්නෙන් අදහස් කරනුයේ ළමයා වැඩි වැඩියෙන් අපයෝජනය වනවාය යන අර්ථයයි. ළමා අපයෝජන 1995 දණ්ඩ නීති සංග්‍රහයේ 21 වැනි සංශෝධනය සිදුවූයේ වර්තමානයේ ආණ්ඩුවේ සිටින මහාචාර්ය ජී. එල්. පීරිස් අමාත්‍යවරයාගේ මෙහෙයවීමෙනි. මේ සම්බන්ධව මම දන්නේ නැති බව හෝ අප දන්නේ නැති බවක් කිසිවෙකුට කිව නොහැකියි.

දණ්ඩ නීති සංග්‍රහය යටතේ ළමා අපයෝජන ද එයි. මිනිමැරීම් සහ පැහැර ගැනීම් ආදිය ද දණ්ඩ නීති සංග්‍රහයට අයත් ය. මෙය දණ්ඩ නීති සංග්‍රහයට අයත් නම් දඬුවම ද ඉතාම බරපතළ වේ. දහස් ගණනින් අපරාධ සිදුවේ නම් කුඩා දරුවෙක් නිසා ඒවා දහයෙන් බෙදා වෙන් කළ හැකි ද? පුද්ගලයෙක් වයසින් කුඩාවන තරමටම මානසික බලපෑම ද වැඩිය. ඉදිරියේ දී එම පුද්ගලයා නොයෙක් ආකාර ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට හා අපයෝජනයන්ට සම්බන්ධ වීමට තිබෙන අවධානය ද වැඩිවෙයි.

අප කෙසේ හෝ මෙම විෂම චක්‍රය නැවැත්විය යුතුයි. ඊළඟ පරම්පරාවට සිදු වෙන්නට යන හානිය අප නැවැත්විය යුතුයි. යම් ප්‍රමාණයකින් හෝ නීති ක්‍රියාත්මක වුවහොත් ළමා අපයෝජකයින්ට හෝ ස්ත්‍රී දූෂකයින්ට ඒ කෙරෙහි බියක් ඇති වෙයි. වර්තමානයේ නීතියට ඇති ගරුත්වය හා බියක් මිනිසුන් අතර නැතිය.

## වැඩිහිටියන්ගේ නාමයෙන් වැඩිහිටියන්ගේ පැත්ත ගැනීම

වර්තමානයේ ළමා අපචාර හා ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් තිබෙන නීති ප්‍රමාණවත් වැඩිය. හිසරදයට කොට්ට මාරු කිරීම අවශ්‍ය නොවේ. ළමා හා කාන්තා අපචාර සම්බන්ධයෙන් අප රටේ ඉතාම ප්‍රබල නීති රීති තිබෙයි. ළමා අපචාරකරන්නවුන් සහ දූෂකයින් අසවල් දේශපාලනඥයා හඳුනන නිසාම කෙතරම් ප්‍රබල නීති රීති තිබුණත් එලක් නොවේ. අවම සිර දඬුවම තිබියදීත් එය ද නොදී නීතියේ සිදුරෙන් පැන යන්නට හැරීමට තරම් අපේ නඩුකාර හාමුදුරුවෝ ළදරු දූෂකයින් කෙරෙහි මහත් අනුකම්පාවක් ද දක්වති. විශේෂයෙන් අප රටේ වැඩිහිටියෝ දරුවන්ට මොනයම් ආකාරයේ දූෂණ හා අපචාර කළත් පොලීසියේ සිට උසාවිය දක්වාම අනුකම්පා කරනුයේ දූෂකයාට හෝ අපචාරයට ලක් වූ දරුවා කෙරෙහි නොව අපචාර කළ වැඩිහිටියාට ය.

එම නිසාම අවම සිර දඬුවමවත් නොදී අත් හිට වූ සිර දඬුවම දෙනු ලබයි.

පාසලක ගුරු මණ්ඩලයේ ළමුන්ට අපචාර කරන ගුරුවරයෙක් සිටී නම් විදුහල්පති වරයා වැඩියෙන්ම ආරක්ෂා කරන්නේ දරුවාව නොව අපචාර කළ ගුරුවරයාවය. විදුහල්පතිවරයා ළමා අපචාර කරන පුද්ගලයෙක් හෝ ළමා දූෂකයෙක් නොවුනත් වැඩිහිටියාගේ නාමයෙන් ගුරුවරයාව ආරක්ෂා කිරීමට ගුරුවරයාගේ පැත්ත ගනී. මෙවැනි කාරණා අපේ සමාජයේ අනන්ත අප්‍රමාණව සිදුවෙයි.

ළමා අපචාර කරන්නවුන්ට හා ස්ත්‍රී දූෂකයින්ට වසර 10 ක හෝ 15 ක සිර දඬුවම දෙනවා වෙනුවට අපේ නඩුකාර හාමුදුරුවෝ ද නීතියේ රැහැනින් ඔවුන් මුදවා වසර දෙකක තුනක අත්හිට වූ සිර දඬුවම් දෙන්නේ ද දරුවන්ට තිබෙන ආදරය නිසා නොව වැඩිහිටියන්ගේ නාමයෙන් වැඩිහිටියන්ගේ පැත්ත ගන්න නිසාය. මෙතරම් ළමා අපචාර සිදුකර කාන්තාවන් දූෂණයට ලක් කළ ද ඉතාම ලෙහෙසියෙන් සහ පහසුවෙන් නීතියේ රැහැනින් ගැලවී යා හැකි බව කාන්තා හා ළමා දූෂකයින් හොඳාකාරවම දනී. මක්නිසාද ඔවුන්ට ලැබෙන්නේ අත්හිට වූ සිර දඬුවමකි.

සරත් අඹේපිටිය මහතාගේ සමයේ අවුරුදු 30 - 40 අතර කාලය දක්වා සිරදඬුවම් දුනි. ඒ මහතාව ද ඝාතනයට ලක් කළෝ ය.

ලිංගික අපයෝජන හෝ ශාරීරික අපයෝජන 90%කට වඩා සිදුවන්නේ තම පවුල තුළ හෝ ළමයාගේ සමාජයේ අවට සිටින පුද්ගලයින් විසිනි.

මව, පියා, නැන්දා, මාමා, බාප්පා හෝ තම නිවස අවට පරිසරයේ සිටින අයගෙන් ද විය හැකියි. නැතහොත් ගුරුවරයෙක් හෝ ආගමික ආයතනයක පුද්ගලයෙකු ද විය හැකියි. අප විශ්වාස කරන, සමීපව වැඩකරන හා දන්නා හඳුනන අය අතරින් කෙනෙක් අපේ දරුවා ලිංගික හෝ ශාරීරික අපයෝජනයට ලක් කරති. එම නිසාම අපේ වැඩිහිටියන් ඉවසා දරාගෙන සිටිති. මෙය අපේ සමාජයේ ස්වභාවයයි.

දරුවකු ලිංගික සූරාකෑමට ලක්වීමේ දී සාපේක්ෂව දුප්පත් නම් තම අවශ්‍ය දේ ලබා ගැනීමට මුදල් නැත්නම් තම දරුවා අලෙවි කිරීමට ද පෙළඹේ. උදාහරණ ලෙසට සිගමන් අයදින බොහෝ දෙමාපියන් තම දරුවා කොහේ හෝ අස්සක මුල්ලක නින්දට දමා හිඟමනේ යති. සමහර වැඩිහිටියන් එම දරුවා ලිංගික ඇසුරට ලබා ගන්නේ සිඟමන් අයදින දෙමාපියන්ට සොච්චමක මුදලක් දීමෙනි. මෙය මීගමුව වැනි ප්‍රදේශවල ඉතාම බහුලව සිදුවේ. විදේශ සංචාරකයින් හට තම දරුවන් ලිංගික ඇසුරට ලබා දී මුදල් සොයා ගනිති.

එම නිසා අද දරුවන්ගේ එකම ආරක්ෂකයා දෙමාපියන් යන්න සිතීම ද අසීරුය. දෙමාපියන් දරුවන්ව අපයෝජනයට භාර දී නොසලකා හැරීම ද නීතිමය ක්‍රියාමාර්ග යට යා හැකිය. දරුවා වෙනුවෙන් සමාජයීය වශයෙන් තවත් කවුරුන් හෝ ඉදිරිපත් විය යුතු වෙයි. අපි අද ජීවත් වෙමින් සිටින්නේ ඉතාම අස්ථාවර සමාජයකය. හෙට කුමක්වේද යන්න අපි නොදනිමු. එම නිසා අපිට සමාජයේ හෝ අල්ලපු ගෙදර දරුවා අපයෝජනයට ලක් වෙනවාය හෝ තවත් ගෙදරක දැරියක් මෙහෙකාර සේවයේ සිටිනවාය යන්න විමසීමට නොහැකියි. අපි අපේ පාඩුවේ ජීවත් වෙමින් සිටිමු.

## සමාජ වගකීම

වෙනත් රටවල තම පැවැත්ම තහවුරු කර ගන්නේ සමාජයක් ලෙසට ය. සමාජයීය පැවැත්ම තිබේ නම් රටේ පැවැත්ම ද, පසුව තමන්ගේ පැවැත්ම ද ඇතිවන බව ඔවුහු විශ්වාස කරති. නමුත් අප වැනි දුප්පත් රටවල අස්ථිර භාවයක් තිබේ නම් නීතියද ක්‍රියාත්මක නොවේ නම් ස්ව කේන්ද්‍රීය වීමට උත්සාහ දරති. එම නිසා අප රට තුළ දූෂණය, භීෂණය හා ප්‍රචණ්ඩත්වය ඉහ වහා ගොසිනි.

අප ද ජීවත් විය යුතු නිසා දූෂණය කරමින් එවැනි ක්‍රියාවන්ට සම්බන්ධ වෙමින් හෝ දායකත්වය ද දක්වමින් ප්‍රචණ්ඩ වෙමින් ස්ව කේන්ද්‍රීය වීමට මාන බලති.

මෙම නරා වලෙන් අප රට ගොඩ ගැනීමට සමාජ විද්‍යාව දන්නා පුද්ගලයින්ගෙන් උපදෙස් ගෙන යහපත් මාවතකට රට හැරවිය යුතුයි. බොහෝ විට සමාජය වෙනුවෙන් යම් මෙහෙවරක් කාර්යයක් කිරීමට සිටින, ඒ සම්බන්ධව යමක් දන්නා පුද්ගලයින්ද ආණ්ඩුවට කඬේ යමින් සිටී. එය කරන්නේ ඔවුන්ගේ අස්ථිරභාවය නිසා ඔවුන්ගේ යහපත පිණිසය. ඔවුහු ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කිරීමට අකමැතිය.

ළමා හා කාන්තා අපචාර මෙන් ම දූෂණ රට තුළින් මුලිනුපුටා දැමීමට මාධ්‍ය ක්ෂේත්‍රයට ද විශාල කාර්යභාරයක් තිබේ. එපමණක් ද නොව මේ සඳහා මාධ්‍යවේදීන්ගේ පෞද්ගලික හැඟීම් ද බලපායි.

මාධ්‍ය ආයතන මෙම මාතෘකාව කතා කරන්නේ හෝ මාධ්‍යයේ පල කරන්නේ තම පුවත්පත අලෙවි කරගැනීමට නම් එය වැරදියි. අද අපේ රටේ බොහෝ පාඨකයින් පුවත්පත් මිලදී ගන්නේ අපරාධ හා දූෂණ සම්බන්ධ වාර්තා කියවීමට පමණි. මෙය වාණිජමය අවශ්‍යතාවයකි. විය යුත්තේ සමාජ අවශ්‍යතාවයක් බවට පත් කිරීමයි. මෙය ජනමාධ්‍ය මඟින් වාර්තා කර ජනතාව දැනුවත් වීම වැදගත්ය. වාර්තාවන තරමටම මේවා අවම කිරීමට හෝ දූෂකයින්ව අත්අඩංගුවට ගැනීමට ද අප පිළියම් යෙදිය යුතුවෙයි.

මේවාට පිළියම් යෙදීමට විශේෂයෙන් ළමා මනෝ විද්‍යාඥයන්ගේ දැනුම උපයෝගීකොට ගත යුතුයි.

ළමයෙක් අපයෝජනයට ලක් වූ විටෙක අපේ පරම වගකීම විය යුත්තේ අපයෝජනයට ලක් කළ පුද්ගලයා සිරගත කිරීම නොව, ළමයාගේ මනස පුනරුත්ථාපනය කිරීමයි. ඒ සඳහා අප රට තුළ තිබෙන වැඩපිළිවෙල කුමක් ද? ඒ සම්බන්ධයෙන් අප කරන කාර්යය කෙසේ වෙතත් එහි අවශ්‍යතාවයක් පිළිබඳ හැඟීමක් ද නැතිය. එම නිසා ළමයාගේ මනස පුනරුත්ථාපනය කිරීම අත්‍යවශ්‍යය.

සංවාද සටහන
**රුක්මාල් සිල්වා**

වෙහෙසෙන මිනිස්සු



මෙම පළාත් සභා තුන තුල සුලු ගැටලු සිදුවුවත් රජයට විරුද්ධව මුහුණ දීම විපක්ෂයට අසීරු කරුණක් වුවත් නැගෙනහිර පළාත පමණක් රජයට තරගකාරිත්වයක් දිස්වන සෙයක් දිස්වෙයි. කෙසේ වුවත් නිදහස් සාධාරණ මැතිවරණයක් තුළින් සාමකාමී කටයුතු කිරීම පක්ෂ විපක්ෂ දේශපාලන කණ්ඩායම්වල පරම යුතුකම වන්නේය.

# ජනමතය විමසන පළාත් සභා මැතිවරණය

ලබන සෙනසුරාදා හෙවත් 2012 සැප්තැම්බර් 8 වැනි දින සබරගමුව, රජරට, නැගෙනහිර කතෝලික ජනතාවට ජනමතය උරගා බලන පළාත් සභා මැතිවරණ තුනක් යොදා තිබීම නිසා යම් අපහසුතාවයකට ලක්වී ඇත්තේ සමස්ත වනිතා සංහතියේ මුදුන් මල් කඩක් ලෙස පිළි ගැනෙන අප දේව මාතාවන්ගේ උපන් දින මංගල්‍යය යෙදී තිබීම හේතුවෙනි. කවදත් විවිධ අභියෝගයනට මුහුණ දෙන කතෝලික ජනතාව පුරවැසි අයිතිවාසිකම් ඉටුකිරීමට එය බාධාවක් කර නොගැනීමද කැපී පෙනෙන්නකි.

ඉකුත් ජූලි 20 වන දින නිමාවට පත්වූ නාමයෝජනා බාර ගැනීමත් සමග මැතිවරණ කොමසාරිස් තුමා 2012 සැප්තැම්බර් මස අටවැනි දින සබරගමුව, උතුරු මැද හා නැගෙනහිර පළාත් සභාවල මැතිවරණය පැවැත්වෙන බව ප්‍රකාශ කෙළේය. ඒ අනුව මෙම පළාත් සභා තුන සඳහා මන්ත්‍රීවරුන් 108 ක් පත් කර ගැනීමට ඡන්දදායකයන් 33, 36, 415 ක් සුදුසුකම් ලැබ සිටිති. මෙම පළාත් තුන සඳහා දේශපාලන පක්ෂවලින් 1619 ක්ද, ස්වාධීන අපේක්ෂක 1452 ක් ද වශයෙන් මුලු අපේක්ෂකයන් 3071 ක් තරග බිමට අවතීර්ණ වී ඇත. පළාත් තුනට හිමිවන මන්ත්‍රී සංඛ්‍යාව දිස්ත්‍රික් අනුව පහත සඳහන් 1 වන වගුවෙන් පැහැදිලිය.

2012 සැප්තැම්බර් මස අටවැනි දින පැවැත්වෙන පළාත් සභා මැතිවරණයේ ජනමතය සම්බන්ධව උපකල්පනය කිරීමට පසු ගිය පළාත් සභා මැතිවරණ ප්‍රතිඵලත්, වත්මන් රජය හා විපක්ෂය සුබවාදී හා අසුබවාදී ආකාරයකට මුහුණ දුන් අභියෝග පිළිබඳවත් අපක්ෂපාතිව ආපසු හැරී බැලීමක් කළයුතු වන්නේය. එහෙයින් අප මීට අවුරුදු හතරකට ඉහත එනම් 2008 අගෝස්තු 23 පැවති උතුරු මැද සබරගමු පළාත් සභා මැතිවරණ ප්‍රතිඵලත් මීට අවුරුදු 4 කට ඉහත එනම් 2008 මැයි 10 දින පැවති නැගෙනහිර පළාත් සභා මැතිවරණ ප්‍රතිඵලත් විමසා බලමු. **( 2 වනල 3 වන හා 4 වන වගු)**

මෙම මැතිවරණ ප්‍රතිඵල දෙස බැලීමේදී එක්සත් ජනතා නිදහස් සංධානය විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ඇති බව පැහැදිලි වන අතර නැගෙනහිර පළාත් සභාව තුළින් තරගකාරිත්වයක් පෙන්නුම් කර ඇත. එසේ සඳහන් කිරීමට සිදුව ඇත්තේ රත්නපුර, කෑගල්ල, අනුරාධපුර, පොලොන්නරුව, මඩකලපුව, දිගාමඩුල්ල දිස්ත්‍රික්ක එ.ජ.නි.ස විශිෂ්ට ජයග්‍රහණයක් ලබාගත්තත් ත්‍රිමල දිස්ත්‍රික්කය පමණක් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කිරීම නිසාය.

මෙම පළාත් සභා තුන වත්මන් රජය ජයග්‍රහණය කරන අවස්ථාව වන විට උතුරේ ත්‍රස්තවාදය නිමාකර නොතිබුණත් ත්‍රස්තවාදී රජ දහනක්ව පැවති තොප්පිගල ප්‍රදේශය මුදාගෙන තිබීමත්, ඒ හරහා මුලුමනින්ම ත්‍රස්තවාදය අතුගා දැමීමට හැකියාවක් රජයට ඇති බව ඒත්තු ගැන්වීම නිසාත් එක්සත් ජාතික පක්ෂ නායකයන් තොප්පිගල කැලෑවක් යැයි කියමින් තොප්පිගල ජයග්‍රහණය අවඥාවට ලක් කිරීමත්, කිලිනොච්චිය මැදවච්චියටත් අලිමංකඩ පාමංකඩ ලෙසත් හඳුන්වමින් උතුරේ සටන් හැල්ලු කිරීමත් නිසා එම අවස්ථාවේදී ජාති පක්ෂ භේදයෙන් තොරව රජය වෙත මනාපය පලකරමින් පළාත් සභා තුනම ජයග්‍රහණය කරදුන් බව අවිවාදයෙන් පිළිගත යුතු වන්නේය. කරු ජයසූරිය වැනි එ.ජා.ප. නායකයන් ත්‍රස්තවාදය තුරන් කිරීම සඳහා ජනාධිපති දෑත් ශක්තිමත් කිරීමට ඉදිරිපත් වීමත් එයට තවත් හේතුවක් විය. එලෙසින්ම එ.ජා. පාක්ෂිකයන් තම පක්ෂ නායකත්වය පිළිබඳ දෙගිඩියාවකින් ක්‍රියා කිරීමද එම මන්දෝත්සාහය වත්මන් රජයේ ජයග්‍රහණයට දෝලනය වූ සෙයක් ද දිස්විය. මෙම මැතිවරණ සමයේ රජයේ ක්‍රියාමාර්ග වලට විදේශීය බලපෑම් අනවශ්‍ය ලෙස එල්ලවීමත් සමඟ ජීවන වියදම් පොදු ජන අපහසුතා අමතක කර රජයට අතදීමට ජනතාව පෙළගැසුන සෙයක්ද දිස්විය. එසේම එල්ටීටී නායක ප්‍රභාකරන්ගේ දකුණු අත මෙන් සිටි පිල්ලෙයාන් කරුණා, දයා මාස්ටර් වැනි ත්‍රස්තවාදී නායකයන් රාජ්‍ය පාක්ෂිකභාවය දක්වමින් රජයේ ආරක්ෂක අංශවලට සහය දැක්වීම නිසා රජයේ ප්‍රතිපත්ති අනුමත කරමින් මනාපය පල කළ සෙයක්ද දර්ශනය විය.

ඉහතින් දැක්වූයේ සබර ගමු, රජරට, නැගෙනහිර පළාත් සභා තුන රජයේ ජයග්‍රහණයට හේතු පාදකවූ කරුණු පිළිබඳ විශ්ලේෂණයකි. දැන් අපි රජය විසින් නියමිත කාලයට අවුරුදු දෙකකට කලින් විසුරුවා හරිනු ලැබු එනම් පසුගිය සිව් වසරක කාල පරාසය තුළ රජය මුහුණ දුන් අභියෝග හරහා ලත් අගතිය හා ප්‍රගතිය දෙස තුලනාත්මකව විමසා බලමු. ඉහත කී පළාත් සභා තුනේ ජයග්‍රහණයෙන් පසු පොදු ජනතාව තුළ තිබූ මරබිය තුරන් කරමින් සැකෙන් බියෙන් තොර දිවි පෙවෙතක් ගත කිරීමට රජයත්, හිටපු යුද හමුදාපති සරත් පොන්සේකා, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඇතුලු ආරක්ෂක අංශ වල දැඩි කැපවීම තුළින් හැකිවූ බව නොරහසකි. එහි ලකුණු වත්මන් රජයට බැරවීම කාලානුරූපව සිදු වීමක් විය. ත්‍රස්තවාදය නිමා කර ලීම නිසා පොදු ජනතා පැසසුමට රජය ලක්වූ අතර පක්ෂ භේදයෙන් තොරව ජනතා මනාපය ඒ සමගම දෙගොඩ තලා ගලා ආයේය. ඒ බව යාපනය හා නැගෙනහිර ඇතුලු සෙසු පළාත් පාලන ආයතන ජයෙන් තහවුරු විය. එ.ජා.පක්ෂය ජයග්‍රහණය කළද එකම පළාත්පාලන ආයතනය වූ කොළඹ මහ නගර සභාවද ජයගත්තේ ඉතාමත් අසීරුතාවයකිනි. මෙම කාල පරාසය තුළ එනම් පසුගිය වසරේ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ වාර්ෂික වාර්තාවන්ද 6% ක ආර්ථික වර්ධනයක් ලබා ඇති බව ජනමාධ්‍ය වාර්තා කර තිබුණි. රාජ්‍ය නොවන සංවිධාන හා එම සංවිධාන ගෙන හැර දක්වන දත්තයන් ගෙන හැර දක්වමින් උතුරේ ගැටලුව උග්‍රවී ඇති සෙයක් පෙන්වුවද උතුර සංවර්ධනය කිරීමට රජය අධි පරිශ්‍රමයක් දරණ බවද පිළිගත යුත්තකි. යම් යම් අඩු පාඩු සිදුවූවත් යම් යම් අක්‍රමිකතා, දූෂණ සිදුවූවත් එක එල්ලේ රජයට දොස් පැවරීම යුක්ති සහගතද නොවේ. යුද්ධය නිමාවීමෙන් යුද්ධයට යන වියදම රටේ ජීවන වියදම් අඩුකර සහන සැලසෙනු ඇතැයි පොදු ජනතාව අපේක්ෂා කළත් එය ඉටු නොවීම රජයට නැගෙන චෝදනාවන් වූවත් මහා පරිමාණ සංවර්ධන කටයුතු කෙරෙන බවද නොරහසකි.

මෙම ඉහත කරුණු තුළින් ගම්‍ය වන්නේ රජයේ ක්‍රියාමාර්ග දෙස සුබවාදී මංතීරුවක සිට පෙනෙන දර්ශනයකි. දැන් අපි පසු ගිය සිව්වසරක කාලය තුළ රජය මුහුණ දුන් අභියෝග හා පසු බැසීම විමසා බලමු. මීට ඉහත ඡේදයේ සඳහන් කළ පරිදි යුද්ධය නිමාවීමෙන් පසු වාර්ෂිකව වැයවූ කෝටි ගණන් මුදල් පොදු ජනතා පහසුව සඳහා ජීවන වියදම් අඩුකර දෙනු ඇතැයි පොදු ජනතාව අපේක්ෂා කළද එය ඉටු නොවීම නිසා ජනතා අපේක්ෂා භංගත්වයට පත්වී තිබීම අද ජනතාවගෙ මනාපය ලබා ගැනීමට ගැටලුවක් බවට පත් වී ඇත. එලෙසම සෑම වේදිකාවකින් නැගෙන ජාත්‍යන්තර බොරතෙල් මිල අඩු වූවත් එම සහනය ජනතාවට ලබා නොදීම රජයට පිළිතුරු දීමට අපහසු තත්ත්වයකි. රජය විසින් පොදු ජන පහසුව සැලසිය යුතු වූවත් විදුලි ගාස්තු ප්‍රවාහන ගාස්තු, ඉන්ධන ගාස්තු ඉහල යාම රජය මුහුණ දෙන තවත් අභියෝග යකි. සරසවි සිසු ගැටලු සරසවි ආචාර්ය වරුන්ගේ වැඩවර්ජන දොස්තර වරුන්ගේ වැඩ වර්ජන විදුලි බල මණ්ඩලයේ වැඩ වර්ජන රජයට අවාසිදායක තත්ත්වයක් ඇතිවීමට පෙරමග සලසන්නක් ද වෙයි. උසස් පෙළ සාමාන්‍ය පෙළ විභාග ගැටලු ඉසැඩ් ස්කෝර් අර්බුද සරසවි පිවිසුමට බාධක විභාග ගැටලු සමාවක් නොදෙන ජනතා අප්‍රසාදයට ලක්වන්නක් විය හැකි වෙයි. මෑතදී ලංඩනයේ පැවති අධිකරණ නඩු විභාගයකදී කෝටි ගණනක මුදලක් රජය විසින් ගෙවිය යුතු බවට දුන් හෙජින් නඩු තීන්දුව ජනමාධ්‍ය වලින් දැනගත හැකිවිය. මානව හිමිකම් කඩවීම සම්බන්ධව ජිනිවා සමුලුවේදී රජය පරාජයට පත්වීම රජය මුහුණ දුන් තවත් අභියෝග යක් විය. ජාත්‍යන්තර ක්‍රිකට් තරගය ලංකාවේ පැවැත්වීම සඳහා කෝටි ගණනක මුදල් වැය කරමින් කළ අසාර්ථක උත්සාහයද රජය මුහුණ දුන් ගැටලුවක් විය. සියයට 6 ක ආර්ථික වර්ධනයක් ඇතැයි ප්‍රකාශ කළ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ඇතැම් ලාංකික ආර්ථික විශේෂඥයන්ගේ දෝෂ දර්ශනයට ලක්වීමද රජයට බරපතළ ගැටලුවක් විය. එළවලු කුඩ ප්‍රශ්නය මෙන්ම පුද්ගලික අංශයට විශ්‍රාම වැටුප් දීමේ පනත විරෝධතාවය හා ජීවිතයක් බිලිගැනීම තුළින් ඉල්ලා අස්කර ගැනීමද රජය මුහුණ දුන් අභියෝගයක් විය.

දිනෙන් දින වර්ධනය වන මිනී මැරුම් ස්ත්‍රී දූෂණ බාලාපචාර අල්ලස් දූෂණ හමුවේ රජයේ ප්‍රාදේශීය දේශපාලකයන් සම්බන්ධවීම රජයට තවත් ගැටලුවක් වී ඇත්තේය. රජයේ මැති ඇමති වරුන්ගේ දේශපාලන හයිය අධිකරණ ක්ෂේත්‍රය දක්වා හඹා යෑම රජයේ විනිවිද භාවයට කැලලක් ද වන්නේය. විදුලිය කප්පාදුව මෙන්ම ගොවි ජනතාවට ගොවිතැන් සඳහා ජලය නොමැතිවීම වී අස්වැන්න අලෙවි කරගැනීමට බාධක තිබීමද රජයට මුහුණදීමට වූ ගැටලු අතර විය. රජයට කෝටි ගණනක අලාභය ගෙන දෙන බාල පැට්‍රල් ප්‍රශ්නය ද රජයට අභියෝග යක් වී ඇති අතර ඉදිරියේදී ප්‍රවාහන අර්බුදයකටද මංපෙත් සලසන්නක් විය හැකිය. රජයේ මැති ඇමැති වරුනට සම්බන්ධ කිසිදු දේශපාලනඥයකුට පළාත් සභා අපේක්ෂකත්වය නොදෙන බවට ප්‍රකාශ කළත් ඊට ඉදුරා වෙනත් තත්ත්වයක් පැවතීම ප්‍රශ්නයක් වී ඇති අතර රජයේ වාහන දේපල පක්ෂ දේශපාලනයට යොදා ගැනීම ගැනද ජනමාධ්‍ය වාර්තා කර තිබුණි.

ඉහතින් දක්වා ඇත්තේ රජයට ඇති වාසිදායක හා අවාසිදායක තත්ත්වයන් පිළිබඳ පැහැදිලි කිරීමකි. අපි දැන් අපේ විපක්ෂය ගැනද කරුණු සොයා බලමු. පළමුවෙන් පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් 225 දෙනාගෙන් 161 ක් රජයට පක්ෂ මන්ත්‍රීවරුන් බව පැහැදිලිව පෙනෙන්නකි. එවැනි ප්‍රබල ආණ්ඩු පක්ෂයක් සිටින රටක විපක්ෂය පිළිබඳව කිව හැක්කේ කණගාටුදායක තත්ත්වයකි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් භේද භින්නවී සිටින බවද සත්‍යයකි. විපක්ෂ නායක තුමා කෙරේ පැහැදිලි විශ්වාසයක් නොමැති බව පෙනෙන අතර ඒ මහතා ගන්නා තීන්දු තීරණ වලට එරෙහිව නඩු මගට බැස වාරණ නියෝග ගන්නා තත්ත්වයට එම පක්ෂය වැටී ඇත. මේ හේතුවෙන් පාක්ෂිකයන් නන්නත්තාරවී ඇති අතර පක්ෂයට තිබිය යුතු මොරාල් එක ගෑවිවත් නොමැත. පාක්ෂිකයා උකටලි තත්ත්වයට පත්වී ඇති අතර ඡන්ද භාවිතයටවත් නොයන තත්ත්වයක් දිස්වෙමින් පවති. වත්මන් රජය විවිධ අභියෝග, දූෂණ, වැඩවර්ජන හමුවේ ගැටලු සහගත තත්ත්වයට පත්ව තිබුනත් ඊට සෘජුව මුහුණ දෙමින් ජයග්‍රහණ ලබා ගැනීමේ හැකියාවක් පෙන්නුම් නොකිරීම මෙරට ප්‍රජාතන්ත්‍රවාදයටද ගැටලුවක් වන්නේය. දුබල විපක්ෂය හමුවේ රජය ගන්නා තීන්දු තීරණ එක පයින් සම්මත වීම පොදු ජන අපේක්ෂා බිඳ වැටීමේ ප්‍රවනතාවයට හේතුවක් වෙයි.

නැගෙනහිර ත්‍රිමලයේ රජයට විරුද්ධව විමල් වීරවංශ ඇමති තුමාගේ පක්ෂය තරග කරන අතර මුස්ලිම් කොංග්‍රසය නැගෙනහිරදී තනිව තරග කරයි. මෙවැනි ගැටලු සිදුවූවත් රජයට විරුද්ධව මුහුණ දීම විපක්ෂයට අසීරු කරුණක් වූවත් නැගෙනහිර පළාත පමණක් රජයට තරගකාරිත්වයක් දිස්වන සෙයක් දිස්වෙයි. කෙසේ වූවත් නිදහස් සාධාරණ මැතිවරණයක් තුළින් සාමකාමීව කටයුතු කිරීම පක්ෂ විපක්ෂ දේශපාලන කණ්ඩායම්වල පරම යුතුකම වන්නේය.

**තියබෝල්ඩ් සමරතුංග**

### 1 වගුව - මන්ත්‍රී සංඛ්‍යාව

| සබරගමු පළාත | | උතුරු මැද පලාත | | නැගෙනහිර පළාත | |
|---|---|---|---|---|---|
| රත්නපුර දිස්ත්‍රික්කය | 24 | අනුරාධපුර දිස්ත්‍රික්කය | 21 | දිගාමඩුල්ල | 14 |
| කෑගල්ල දිස්ත්‍රික්කය | 18 | පොලොන්නරුව දිස්ත්‍රික්කය | 10 | මඩකලපුව | 11 |
| | | | | ත්‍රිකුණාමලය | 10 |
| | 42 | | 31 | | 35 |

### 2 වගුව - 2008 පළාත් සභා මැතිවරණය

| සබරගමු පළාත් සභාවේ මැතිවරණ ප්‍රතිඵල | ලැබූ ඡන්ද | ලැබූ ආසන ගණන | ප්‍රතිශත |
|---|---|---|---|
| 1. එක්සත් ජනතා නිදහස් සංධානය | 4,72,789 | 25 | 55.37% |
| 2. එක්සත් ජාතික පක්ෂය | 3,46321 | 17 | 40.53% |
| 3. ජනතා විමුක්ති පෙරමුණ | 19068 | 02 | 2.23% |
| 4. වෙනත් | 16216 | - | 1.83% |

### 3 වගුව - 2008 උතුරු මැද පලාත් සභා මැතිවරණ

| උතුරු මැද පළාත් සභාවේ මැතිවරණ ප්‍රතිඵල | ලැබූ ඡන්ද | ලැබූ ආසන ගණන | ප්‍රතිශත |
|---|---|---|---|
| 1. එක්සත් ජනතා නිදහස් සංධානය | 307457 | 20 | 56.37% |
| 2. එක්සත් ජාතික පක්ෂය | 205284 | 12 | 37.64% |
| 3. ජනතා විමුක්ති පෙරමුණ | 26738 | 01 | 4.90% |
| 4. වෙනත් | 5961 | - | 1.09% |

### 4 වගුව - 2008 නැගෙනහිර පලාත් සභා මැතිවරණ

| නැගෙනහිර පළාත් සභාවේ මැතිවරණ ප්‍රතිඵල | ලැබූ ඡන්ද | ලැබූ ආසන ගණන | ප්‍රතිශත |
|---|---|---|---|
| 1. එක්සත් ජනතා නිදහස් සංධානය | 30,88,86 | 18 | 52.21% |
| 2. එක්සත් ජාතික පක්ෂය | 250731 | 15 | 42.38% |
| 3. ජනතා විමුක්ති පෙරමුණ | 9390 | 01 | 1.59% |
| 4.දෙමල ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සංධානය | 7714 | 01 | 1.30% |

# සමිඳු සේවයට කැපවූ අක්කා නගෝ

කැලණියේ දලුගම ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් මුනිඳු මීසමට අයත් ඊරියවැටිය, සුන්දර ගම්පියසකි. කඳු පල්ලම් සහිත රතු ගුරු පාර දෙපස ගල් අන්නාසි පඳුරුය. පොල් රුප්පා මැදින් බඩගාළුන ගුරුපාර කොළඹ නුවර මහපාර දක්වා ඇවිත් නවතියි. ඊට පසු හමුවන 7 කණුව හංදියෙන් ඔබ්බට මද දුරක් යත්දී දලුගම සාලෙස් දෙව්මැඳුරට යාබදව පිහිටි ශාන්ත තෙරේසා කන්‍යාරාමය හමුවේ.

දිනපතා උදේ මේ ගුරුපාර දිගේ දලුගම මඩම ඉස්කෝලය බලා ඇවිදගෙන යන දැරියන් දෙපළකි. ඉන් වැඩිමලා ගර්ටිය. බාලයා රීටාය. දෙදෙනාම ඉගෙනීමෙහි දක්ෂය. තරුණ වියට පා තබත්ම ඔවුන් තුළ වූ බාහිර සහජ හැකියාවන්ද මතුවුණි. ජෙරමියස් කැත්‍රින් පෙරේරා පවුලේ මෙම අක්ක නගෝ දෙපළගෙන් තොරවූ නැටුමක්, ගැයුමක් විවිධ ප්‍රසංගයක් එදා තෙරේසා මඩම පාසලේ නම් නොවීය. බාලාංශයේ මාග්‍රට් ගුරුනාන්සේගේ සිට ඉහළ අවසාන පංතියේ රෝස්මේරි ටීචර් දක්වා වූ තෙරේසා බාලිකාවෝ ගුරුමෑණිවරුන්ගේ සිත් දිනාගැනීමට මෙම දෙසොහොසුරියෝ සමත් වූහ.

ප්‍රංශ සුවාමිලාගේ පාලන කාලය නිමාකරමින් 1947 වසරේ දලුගම මීසම් භාර පියතුමා හැටියට මුල්වරට සිංහල පියතුමකු පත්වී ආවේය. ඒ ගරු මනුවෙල් අපෝන්සු පියතුමාය. මීසම පුරා අමුතු ආධ්‍යාත්මික ප්‍රබෝධයක් ඇති කිරීමට අලුත ආ පියතුමා සමත්වුණි. ජපමාලභක්තිය කෙරෙහි එතුමා දැක්වූයේ සුවිශේෂි උනන්දුවකි. අද මේ දක්වා පවතින දලුගම මීසමට අයත් දිප්පිටිගොඩ පාතිමා දෙව්මැඳුර ඉදිකිරීම මෙතුමා අතින් සිදුවූවකි. දලුගම මීසම තුළ අපෝන්සු පියතුමා හා පුරා කියා ඇරඹූ දේවමාතා දරු සමාගම එදා ගමේ තරුණියන්ගේ ආකර්ෂනය දිනා ගැනීමට සමත්විය. මේ අතර දේවමාතා දරු සමාගමේ රස්නය තෙරේසා බාලිකාවටද දැනුණි. නොබෝ දිනකින් ගමේ හැම තරුණියක්ම දරුසමාගමේ සාමාජිකාවක් වූවාය. දේවමාතා දරු සමාගම මගින් ගැහැණනු දරුවන් සමිඳු සේවයට කැඳවාගැනීමේ අල්පෝන්සු පිය අරමුණ සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක විය.

ඒ අතර ගේ දොර දෙමාපියන් නෑ හිතවතුන් යන මේ සියල්ල අතහැර දමා සමිඳු සේවයට කැපවීමේ ආන්දෝලනයක් ගමේ තරුණියන් අතර පැතිරිණි. ශුද්ධවූ පවුලේ නිකායේ කන්‍යා සොහොයුරියක වීමේ එකම චේතනාවත් සමඟ හද යෞවනයේ චමත්කාරයෙන් පිරි සමිඳු කරා ගිය මෙම පෙරහරේ ඉස්සරහින්ම සිටි කසකාරියන් වූයේ රිටා සහ ගර්ටි පෙරේරා දෙසොහොයුරියන් බව කිව යුතුය. ඒ දෙපළ ආදර්ශයට ගනිමින් එම පෙරහරට ගමේ තරුණියන් තවත් කීප දෙනකුම ඉන්පසු එකතු වූහ. මේරි ජසින්තා, මේරි ෆිලෝතියා, මේරි බ්‍රයිස්, මරියාපාවින්, මොරින්, මේරි මර්සි,




ක්‍රිසාන්තුස්, මේරි ප්‍රසිඩා වැනි ගරු පැවිදි සොහොයුරියන් ඉන් සමහරෙකි. පල්ලිය ඉස්සරහ ඇණතියාගෙන වෙරළු අච්චාරු විකුණන සෙලක්කාගෙන් සත පහට ගත් අච්චාරු කැන්දකොළයට අත් දාගෙන එකට රහ බැලූ මේ යෙහෙළියන් අද විවිධ නිකාය වලට අයත් සිස්ටර්ලාවී සිටීම ඇත්තෙන්ම අපටද සතුටකි. ගමටම ආඩම්බරයකි.

1949 පෙබ්‍ර. 04 දින ශ්‍රී ලංකා වාසි හැමෝම ජාතියේ නිදහස් උත්සව පළමු සැමරුම සමරද්දී මේ අක්කා නගෝ දෙපළ ශුද්ධවූ පවුලේ පැවිදි නිකායේ මූලස්ථානය බලා ගමන් ගත්හ. දෙවසරක් ඇවෑමෙන් 1951 ජූනි 18 දින මුල්වරට වේද භාර දෙමින් රිටා ගුරු මේරි අමීලියා බවට පත්වූවාය. හරියටම ඊට තවත් වසරකට පසු ජූනි 18 දින ඇගේ වැඩිමල් සොහොයුරියද සිස්ටර් මේරි බර්ලින්ඩා හැටියට පොරොන්දු දුන්නාය. පුත්තලම මුතුකුමාර නිවාසය තුළින් තම දහම් දූතික සේවාව ඇරඹූ බර්ලින්ඩා සොහොයුරිය ඉන්දියාවේ සහ ප්‍රංශයේ ශුද්ධවූ පවුලේ මව් ගෘහයේදී දේව ධර්මය පිළිබඳ පුහුණුවක් ලබා ඇත. බණ්ඩාරවෙල, කටාන, බෝලවත්ත, තුඩැල්ල, කුරුණෑගල ආඬිඅම්බලම වැනි ශුද්ධවූ පවුලේ කන්‍යාරාමවල ඇය සේවය කොට තිබෙයි. පුරා වසර 30 ක දීර්ග සේවාවක් නිමා කළ මෙම උදාර පැවදි සොහොයුරිය අද බුරුල්ලපිටියේ කන්‍යාරාමයෙහි විශ්‍රාමිකව වෙසෙයි.

බෝලවලාන ගුරු අභ්‍යාස විද්‍යාලයෙන් සහ පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් ද අධ්‍යාපනය පිළිබඳ හසල දැනුමක් ලබා ඇති ගරු මේරි අමිලියා සොහොයුරිය ඇගේ මුළු ජීවිත කාලයම අධ්‍යාපනික කටයුතුවල නියැලුනු අයෙකි. වෙන්නපප්ුව ප්‍රාථමික බාලිකාවේ වසර 16 ක් හා මාරවිල ශුද්ධවූ පවුලේ බාලිකා විදුහලෙහි විදුහල්පතිනිය වශයෙන් අවුරුදු 21 ක් එක දිගටම සේවය කරමින් ඇය තබා ඇති වාර්තාව සුවිශේෂ එකකි. වෙද ගුරු හෙදි හා ව්‍යාපාරික ක්ෂේත්‍රවල නියැලී සිටින තම ගෝලබාලයින් ගැන අද සිස්ටර් අමිලියා අමන්දානන්දයට පත්වන්නීය තම උපන් ගමට ආලෝකයක්, තම යෙහෙළියනට ආදර්ශයක් හා ශුද්ධවූ පවුලේ නිකායට අභිමානයක්ද වූ මේ අක්කා නගෝ දෙපළට අපිදු දෙව්ඳුන් යදිමු.



## ප්‍රදීපයෙන් බිහිවූ මාධ්‍යවේදී එවන්ස් කුරේ

'ඥානාර්ථ ප්‍රදීපය' පත්‍රයෙන් ලේඛන කලාව අරඹා, ජනාධිපති ප්‍රවෘත්ති ලේකම් ධූරය දක්වා උසස් වූ එවන්ස් කුරේ මහතා පසුගියදා අගෝස්තු (16) දා ලන්ඩනයේදී සගසුව දිනීය. මිය යන විට ඒ මහතාගේ වයස අවුරුදු 76 ක් විය. මෙයට වසර කිහිපයකට පෙර ලන්ඩන් නුවර නියෝජ්‍ය ශ්‍රී ලංකා මහ කොමසාරිස් තනතුරෙන් සමුගත් කුරේ මහතා. සිය බිරිඳ හා දරු තිදෙනා සමඟ ලන්ඩනයෙහිම පදිංචි වී සිටීමට තීරණය කර තිබුණි.

ඔහු පාසල් වියේදීම, ඥානාර්ථ ප්‍රදීපයට ලියන්නට පටන් ගත්තේ 'පයාගල එවන්ස් ගුණලාල් කුරේ යන නමිනි. එවකට ඔහු කඳාන ද මැසනඩ් විද්‍යාලයේ ශිෂ්‍යයකි.

ඔහු සමඟ තරගෙට මෙන් ප්‍රදීපයට ලිපි ලියූ තරුණයන් කිහිප දෙනා අතර මාරවිල අර්නස්ට් පෝරුතොට (දැන් ගරු පියතුමා) හා දලුගම මම ද වීමු. එම වකවානුවේදී අප දිරිගන්වනු ලැබුවේ එවකට ප්‍රදීපය කර්තෘ වශයෙන් සිටි ඩී. ජී. කුරුකුලසූරිය මහතා හා පසුව සංස්කාරක වශයෙන් පැමිණි ගරු මර්සලින් ජයකොඩි පියතුමන් විසිනි. මෙසේ ඥානාර්ථ ප්‍රදීපයෙන් ලියන්නට පුරුදුවූ එවන්ස් කුරේ වසර කීපයක් පුවත්පත් කලාවේදියකු වශයෙන් දිනමිණ, ලංකාදීප හා ඩේලි මිරර් යන පුවත්පත්වලට කලින් කලට සම්බන්ධ වී සේවය කළේය.

වර්ෂ 1957 දී ප්‍රවෘත්ති නිලධාරියකු වශයෙන් රාජ්‍ය සේවයට බැඳුනු එවන්ස් කුරේ, 1977 වසරේ දේශපාලන වෙනසත් සමගම, එවකට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ධූරය දැරූ රණසිංහ ප්‍රේමදාස මහතා යටතේ ප්‍රවෘත්ති පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් සේවය කළේය. ප්‍රේමදාස මහතා ඇමති, අගමැති හා ජනාධිපති වශයෙන් සිටි අවස්ථා තුනේදීම සමීප, විශ්වාසවත් හා හිතවත් සහයකයකු වශයෙන් එවන්ස් කුරේ රඳවා ගත්තේය. එවන්ස් කුරේද, ඔරලෝසුව නොබලා, මහත් කැපවීමකින් යුතුව පැය ගණන් එක දිගටම වැඩ කිරීමට පුරුදු විය. වැඩ අධික දිනවල බොහෝවිට අළුයම 4.00 ට අවදිවන ප්‍රේමදාස මහතා තමා ළඟින්ම සිට රාජකාරි කටයුතුවල යෙදුන ඇන්ටනි ප්‍රනාන්දු හා එවන්ස් කුරේ යන නිලධාරීන් දෙදෙනාද දුරකථනයෙන් අවදිකරයි.

විනාඩි තිහකින් පමණ කොළඹ සාන්ත බස්තියමේ පිහිටි සුචරිත මන්දිරයේ තම කාර්යාලයට ප්‍රේමදාස මහතා පැමිණෙන විට, එවන්ස් කුරේ හා ඇන්ටනි ප්‍රනාන්දු පැමිණ සිටිති. ඉන්පසු දවසේ රාජකාරි අවසන් වන්නේ කීයටදැයි ඔව්හුම නොදනිති.

ඇමැති ධූරයේ සිට අගමැති හා ජනාධිපති ධූර දක්වා රණසිංහ ප්‍රේමදාස මහතා සෑම නිල කටයුත්තකදීම පෙරමුණෙන් සිටියේ එවන්ස් කුරේ මහතාය. ඔහුට තර්ජන එල්ල වූ අවස්ථාද බොහෝය. ඔහු සමඟ ප්‍රවෘත්ති ක්ෂේත්‍රයෙහි නියැලි සිටි අපි කවුරුත් ඒ බව දැන සිටියෙමු.

එහෙත් තම ජීවිතයට වඩා සේවය උතුම්කොට සැලකූ එවන්ස් කුරේ, කඩිසරව වෙහෙසුනු ආකාරයෙන්ම අනිකුත් රාජ්‍ය නිලධාරින්ට ආදර්ශයක් විය. 1993 මැයි මස 1 වනදා ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා ත්‍රස්ත ප්‍රහාරයකින් මිය යන තුරුම එවන්ස් කුරේ එතුමා ළඟින් සිටියේය. ජංගම දුරකථන ඇමතුමකට සවන් දීමට ඔහු මඳක් පිටුපසට වීම නිසා, එම බෝම්බ ප්‍රහාරයෙන් ඔහු බේරුනේ පුදුමාකාර ලෙසිනි. ඔහු සමාදානයේ සැතපේවා!

**ඇල්ප්‍රඩ් පෙරේරා**

# නිර්මල මරිය නිකායට තවත් පූජක පුතුන් සිව් දෙනෙක්

**දිළිඳුන්ට සුබ අස්න දේශනා කිරීමේ නිර්මල මරිය නිකායික කැරිස්මාවට සවි දෙමින් සමිඳු කෙත රිසින් අස්වද්දන්නට, මූලික පූජක පුහුණුව අවසන් කළ තවත් නිර්මල මරිය නිකායික සහෝදරතුමන් සිව් නමක්, 2012 සැප්තැම්බර් මස 8 වන දින, මරදාන, පාතිමාවේ අප ස්වාමි දු දේවස්ථානයේ දී, අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අග්‍රාජගුරුප්‍රසාදීන් වහන්සේ අතින් පූදැදුරු වරම් ලබති. මෙසේ පූජාත්වරය ලබනුයේ ගරු ඇන්ටන් ශිවන්ත වාස් නි.ම.නි ගරු රොෂාන් ජනප්‍රිය වාස් නි.ම.නි ගරු සමීර දමිත් ෆොන්සේකා නි.ම.නි සහ ගරු ශේන් වින්ස්ටන් ද රොසයිරෝ නි.ම.නි යන සහෝදරතුමන් ය.**


ගරු ඇන්ටන් ශිවන්ත වාස් සහෝදරතුමා


ගරු රොෂාන් ජනප්‍රිය වාස් සහෝදරතුමා


ගරු සමීර දමිත් ෆොන්සේකා සහෝදරතුමා


ගරු ශේන් වින්ස්ටන් ද රොසයිරෝ සහෝදරතුමා

### ගරු ඇන්ටන් ශිවන්ත වාස් නි.ම.නි සහෝදරතුමා

ගරු ඇන්ටන් ශිවන්ත වාස් නි.ම.නි සහෝදරතුමා ඩබ්. එච්. ලැම්බට් වාස් පියාණන්ගේ හා වී. ඒ. එම්. රෝස් මෙලනි මෑණියන්ගේ දෙටු පුත් ලෙස මෙලොව එළිය දකින්නේ 1982 සැප්තැම්බර් 16 වන දිනදී ය. වෙන්නප්පුව ජෝසප් වාස් විදුහලින් තම ප්‍රාථමික අධ්‍යාපනය ලබාගත් ශිවන්ත වාස් බම්බලපිටිය සා. පීතර විදුහලින් උසස් පෙළ අධ්‍යාපනය හැදෑරුවේ ය. කොහුවල කනිටු දෙව්සත්හලින් තම දේව කැඳවීමේ ගමනට මුල පිරූ මොහු 2003 අගෝස්තු 22 වන දින, බණ්ඩාරවෙල, නිර්මල මරිය නිකායික ආධුනික දෙව්සත්හලින් තම ප්‍රථම වේද භාර ලබා ගනී. ගරු ශිවන්ත වාස් සහෝදරතුමා අම්පිටිය ජාතික දෙව්සත්හලින් දේවධර්මය දෙවන වසර තෙක් සම්පූර්ණ කර තම අධ්‍යාපන කටයුතු නිමා කිරීම සඳහා රෝමය බලා පිටත්ව ගිය අතර රෝමයේ දී තම සදාකාලික වේද භාර ද, තේවාචාර්ය වරම් ද ලබා ගන්නා මෙතුමා පෙරළා මව් බිමට පැමිණෙන්නේ සමාජ විද්‍යාව යටතේ තම ද්විතීයික අධ්‍යාපනය ද අවසන් කරමිනි. තේවාචාර්යවරයකු ලෙස ගරු ශිවන්ත වාස් සහෝදරතුමා රෝමයේ ශ්‍රී ලාංකිකයින්ට ද, කටුකුරුන්ද, මොරටුව, සාන්ත මරියා දේවස්ථානයේ මීසම් වාසීන්ට ද සේවය කර ඇත. රෝමයට යාමට මත්තෙන් සහෝදරතුමකු ලෙස මොහු බුත්තල, මැදවච්චිය, යාපනයේ කුලමන්කාල් යන දේවස්ථාන වල ද සේවය කර ඇත. පූදැදුරු වරම් ලැබීමෙන් අනතුරුව ගරු ශිවන්ත වාස් නවක පියතුමා වෙන්නප්පුව සා. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ දී සැප්තැම්බර් 9 වන දින පෙ.ව. 8.00 ට තම ප්‍රථම දිව්‍ය පූජාව සමරන්නට ද නියමිතව ඇත.

### ගරු රොෂාන් ජනප්‍රිය වාස් නි.ම.නි සහෝදරතුමා

එම්. ඇන්තනි වාස් පියාණන්ටත්, එම්. මාරි විනෙන්ෂියා මෑණියන්ටත් (නැසීගිය) දාව රොෂාන් ජනප්‍රිය වාස් 1978 නොවැම්බර් මස 13 වන දින මෙලොව එළිය දිටී ය. මීගමුව සා. මරියා විද්‍යාලයේ මූලික අධ්‍යාපනය ලත් එතුමා වසර 2000 දී කොහුවල සා. ජෝසප් කනිටු දෙව්සත්හලට ඇතුළත් විය. 2005 අගෝස්තු 22 වන දින, බණ්ඩාරවෙල, නිර්මල මරිය නිකායික අධුනික දෙව්සත්හලින් තම ප්‍රථම වේද භාර ද, 2011 ඔක්තෝබර් මස 6 වන දින අම්පිටිය නිර්මල මරිය නිකයික දෙව්සත්හලේ දී සදාකාලික වේද භාර ද ලබාගත් ගරු රොෂාන් සහෝදර තුමා 2011 නොවැම්බර් මස 11 වන දින තේවාචාර්ය වරම් ලබා ගත්තේය. තේවාචාර්යවරයකු ලෙස ගරු රොෂාන් ජනප්‍රිය වාස් සහෝදරතුමා ගැටඹේ සා. මරියා දේවස්ථානයේ හා මීගමුව කඩොල්කැලේ ගැළවුම් කරුවාණන්ගේ දේවස්ථානයේ මීසම් වාසීන්ට සේවය කර ඇත. එලෙසම මොහු අම්පිටිය ජාතික දෙව්සත්හලේ අධ්‍යාපනය ලබා ගන්නා අතරතුර සහෝදර තුමකු ලෙස හල්පේ, නිලාවැලි, බොගවන්තලාව සහ හපුතලේ යන මීසම් වල ද සේවය කර ඇත. ගරු රොෂාන් ජනප්‍රිය වාස් නි.ම.නි නවක පියතුමා ආඬිඅම්බලම ශු. ජපමාල මාතාවන්ගේ දේවස්ථානයේ දී සැප්තැම්බර් 9 වන දින ප.ව. 4.30 ට තම කුළුදුල් දිව්‍ය පූජා යාගය සමරයි.

### ගරු සමීර දමිත් ෆොන්සේකා නි.ම.නි සහෝදරතුමා

ගරු සමීර දමිත් ෆොන්සේකා නි.ම.නි සහෝදරතුමා සිරිල් ෆොන්සේකා පියාණන්ගේ හා සෙලීන් ප්‍රනාන්දු මෑණියන්ගේ දෙවන පුතණුවන් වේ. කලුතර සිරි කුරුස විදුහලින් තම ප්‍රාථමික අධ්‍යාපනය ලබා ගත් සමීර දමිත්, බම්බලපිටිය සා. පීතර විදුහලින් උසස් පෙළ අධ්‍යාපනය හැදෑරීය. කොහුවල කනිටු දෙව්සත්හලින් තම දේව කැඳවීම් ගමන අරඹන මොහු 2005 අගෝස්තු 22 වන දින, බණ්ඩාරවෙල, නිර්මල මරිය නිකායික ආධුනික දෙව්සත්හලින් තම ප්‍රථම වේද භාර ලබා ගත්තේය. සමීර සහෝදරතුමා 2011 ඔක්තෝබර් මස 6 වන දින අම්පිටිය නිර්මල මරිය නිකායික දෙව්සත්හලේ දී සදාකාලික වේද භාර ලබාගත් අතර එම වසරේම නොවැම්බර් මස 11 වන දින තේවාචාර්ය වරම් ලබාගත්තේය.

මොහු අම්පිටිය ජාතික දෙව්සත්හලේ අධ්‍යාපනය ලබා ගන්නා කාලයේ දී සහෝදරතුමකු ලෙස බුත්තල, පොල්වත්ත, පාලෙයුත්තු, නිලාවැලි සහ හපුතලේ යන මීසම් වල සේවය කර ඇත. තේවාචාර්යවරයකු ලෙස ගරු සමීර දමිත් ෆොන්සේකා නි.ම.නි සහෝදරතුමා කුරුණෑගල සා. ආනා ආසන දෙව් මැඳුරේ හා නව වෙක්කු වීදියේ වික්ෂෝප මාතාවන්ගේ දේවස්ථානයේ සේවය කර ඇත. පූදැදුරු වරම් ලැබීමෙන් අනතුරුව ගරු සමීර දමිත් ෆොන්සේකා නි.ම.නි නවක පියතුමා කටුකුරුන්ද පිලිප්නේරි දේවස්ථානයේ දී සැප්තැම්බර් 16 ව දින පෙ.ව. 8.00 ට තම ප්‍රථම දිව්‍ය පූජාව සමරන්නට ද නියමව ඇත.

### ගරු ශේන් වින්ස්ටන් ද රොසයිරෝ නි.ම.නි සහෝදරතුමා

ගරු ශේන් වින්ස්ටන් ද රොසයිරෝ නි.ම.නි සහෝදරතුමා 1984 නොවැම්බර් මස 13 වන දින උපත ලැබුවේ ය. පවුලේ මද්දුමයා වන ශේන් ගේ පියාණන් වන්නේ කිංස්ලි ද රොසයිරෝ මහතා යි. මෑණියන් වන්නේ මේරි මියුරින් ද රොසයිරෝ මහත්මිය යි. මීගමුව මාරිස්ටෙලා විද්‍යාලයෙන් මුලකුරු හැසිරවූ ශේන් පන්නිපිටිය ක්‍රිස්තු රජාණන්ගේ විද්‍යාලයෙන් උසස් පෙළ හැදෑරුවේ ය. දේව කැඳවීමට කන් දෙමින් මොහු 1999 ජනවාරි මස 10 වන දින කොහුවල සා. ජෝසප් කනිටු දෙව්සත්හලට ඇතුළත් විය. 2005 අගෝස්තු 22 වන දින, බණ්ඩාරවෙල නිර්මල මරිය නිකායික ආධුනික දෙව්සත්හලින් තම ප්‍රථම වේද භාර ද, 2011 ඔක්තෝබර් මස 6 වන දින අම්පිටිය නිර්මල මරිය නිකායික දෙව්සත්හලේ දී සදාකාලික වේද භාර ද ලබාගත් ගරු ශේන් වින්ස්ටන් සහෝදරතුමා 2011 නොවැම්බර් මස 11 වන දින තේවාචාර්ය වරම් ලබා ගත්තේය. තේවාචාර්යවරයකු ලෙස ගරු ශේන් වින්ස්ටන් සහෝදරතුමා ගම්පොල සා. ජෝසප් දේවස්ථානයේ හා දෙමටගොඩ සා. අන්තෝනි දේවස්ථානයේ මීසම් වාසීන්ට සේවය කර ඇත. ෂේන් වින්ස්ටන් ද රොසයිරෝ නි.ම.නි නවක පියතුමා පෙරියමුල්ල, තුෂාරයේ අප ස්වාමි දූ දේවස්ථානයේ දී සැප්තැම්බර් මස 9 වන දින පෙ.ව. 8.00 ට තම කුළුදුල් දිව්‍ය පූජා යාගය සමරයි.

**මාංශගත වූ... 1 පිටුවෙන්**

සිද්ධස්ථාන පරිපාලක ගරු ප්‍රිය ජයමාන්න පියතුමන් ප්‍රමුඛ පූජක, පැවදි, ගිහි කමිටුවක් මඟින් ඉතා මැනවින් මෙවර මෙහෙය සංවිධානය කර තිබුණි. විශ්‍රාමික අගරදගුරු අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් විසින් "ලංකා අප ස්වාමිදූ"ගේ ප්‍රතිමාව ප්‍රදර්ශනය කිරීමෙන් පසු මෙහෙය ආරම්භ විය.

ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති හිමිපාණන්ගේ ලේකම්, විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා, අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්, කලාපීය නාහිමිවරුන් හා පූජක පැවදි ගිහි විශාල පිරිසක් මෙහෙයට සහභාගි වූහ.

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ජුබිලි ශාලාවේ සිට දර්ශනීය පෙරහරින් වැඩම කරවාගෙන පැමිණීමෙන් අනතුරුව මෙහෙය ඇරැඹුණි. සිංහල, දමිළ, ලතින් යන තෙබසින්ම මෙහෙය පැවැත්විණි. දෙමළ බසින් දේශනය අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමි පැවැත්වීය.

**මරිය තුමියගේ උපත.... 5 පිටුවෙන්**

එතුමියගේ උපත් දිනය සැමරීම තුළින් කිතුනුවන් වන අපට මතකයට නඟන භාවනාත්මක මඟපෙන්වීම වනුයේ ශුද්ධවූ ජපමාලය උච්චාරණයයි. ජපමාලය උච්චාරණය තුළින් අප හට එල්ල වන නොයෙකුත් ජීවන ගැටලු, පීඩා ජය ගැනීමට හැකිය. අප සැම කෙනෙක්ම අප ජීවිත වැටීම්, හැල හැප්පීම්, බලාපොරොත්තු කඩවීම් යනාදි අතුරු අන්තරාවන්හිදී දෙව් මවුගෙන් අයදින්නේ එතුමියගේ මැදිහත් වීමෙන් පියාණන් වහන්සේගේ පිහිටාශිර්වාද ලබා දෙන ලෙසය. එතුමිය අපගේ සෙවනැල්ලයි. ජපමාලය තුළින් අපගේ ජීවිත වලට නැවුම් බවක් ද, ප්‍රීතිය හා සතුට ද අයිතිකර ගනිමු.

**මැයි භක්ති... 5 පිටුවෙන්**

ප්‍රංශ ජාතිකයෝ උලෙළට "මායි" කියා නම් තැබූ අතර, ජර්මානුවෝ "මායිබූම්" නම ව්‍යවහාර කළෝ ය. ඉතාලි ජාතිකයන්ට එය "මැයියෝ" විය. කිතුනු ප්‍රජාව මේ උලෙළ කිතුනු මංගල්‍යයක් ලෙස, ජේසු මව වූ මරියතුමිය පාදක කරගෙන මැයි අභ්‍යාසයන්ට එම අදේවවාදි උලෙළ පරිවර්තනය කළෝ ය.

මරි මවගේ මැයි බැතියට ලොල් වූවන් අතර, ශු. කාර්ලෝ බොරෝමියෝ තුමා, අල්පොන්සු රජතුමා (1284) සහ හෙන්රි සූසෝ නමැති ගිහියා ද වේ. (1366) අද මැයි බැතිය අවසන් වන්නේ මරියාවෝ තම ඥාති එළිසබෙත් තුමිය බැහැදුටු මංගල්‍යයෙනි. මරිය තුමියට කිතුනු සංඝය දක්වන ගෞරවාදරය, මරිය විරෝධීන්ගේ උදහසට ලක් වී ඇත. ජේසු මව වීමට මැණියන්ව තෝරාගත්තේ මහෝත්තම පිය දෙවිඳුන්මය. එසේ නම් ඇය සුළු කොට තැකීමට කවර කෙනෙකුට හැකි ද? ඉර හඳ තිබෙන තුරා ජේසු මැණියෝ මිනිස් හදවත් තුළ බැබළෙනු ඇත.



ජී. ඒ. නිමාලි ප්‍රනාන්දු විසින් රචිත "වත්මන් ගුරු භූමිකාවේ අභියෝග" නමැති ග්‍රන්ථය ඥානාර්ථ ප්‍රදීපය සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමන් වෙත පිරිනැමූ අයුරු..

# දේව දයාවේ සංචාරක සාමාජික එකමුතුව ව්‍යාප්ත වේ



**2006 වසරේ ගරු ගියොම් නෝනිස් පියතුමන්ගේ මූලිකත්වයෙන් ඇරැඹි 2008 වසරේ සිට ගරු ටෙරන්ස් කිත්සිරි පෙරේරා පියතුමන්ගේ අනුශාසකත්වයට පත් වූ දේව දයාවේ සංචාරක සාමාජික එකමුතුව තවදුරටත් ව්‍යාප්ත වෙමින් පවතී.**

එම සංගමයේ චතුරිකා ශිරෝමාලි (12), සහ නදීෂා ඉරෝෂනී (8) යන දැරියන්ගේ දායකත්වයෙන් අරඹා ඇති ශුද්ධවූ පැය 500 ක් භක්ති අභ්‍යාසයේ 50 වැනි අභ්‍යාසය සපුරාලීමට ද මේ වන විට හැකි වී ඇති අතර, පිලීෂියා මල්කාන්ති පෙරේරා මෙනෙවියගේ සභාපතිත්වය යටතේ කැපුන්ගොඩ සෙත්තප්පාඩුවේ දේව දයාවේ සංචාරක සාමාජික එකමුතුව අරඹා ඇති මෙම ආධ්‍යාත්මික ගමනට කවුරුත් ප්‍රශංසා කරන බවත් තම ත්‍රී රෝද රථය සියලු නිවාස වලට ප්‍රතිමාව රැගෙන යාමට ලබා දීමෙන් පර්සි වනසිංහ මහතා කළ පරිත්‍යාගි සේවාවත් බැතිබරව සිහිපත් කරන බවත් වාර්තා වේ.

# දෙව් මව් තුරුළට කැඳවා ගත් ගරු කේ. ඩී. ජෝශප් පියතුමා

**රත්නපුර පදවියේ උතුවන්කන්ද මීසම් සේවක ගරු කේ. ඩී. ජෝසප් පියතුමා ඉකුත් දා සගසුව දිනීය. අවසන් වසර උතුවන්කන්ද සා. ලාසරස් මුනි දේවස්ථානයේ සේවය කළ එතුමන් මාස 06 ක කෙටි කාල සීමාව තුළ සෞඛ්‍ය තත්ත්වය හෝ වයස නොබලා කළ මෙහෙවර කාගේත් පැසසුමට ලක්විය.**



**ගරු කේ. ඩී. ජෝශප් පියතුමා**

දේවස්ථානයේ බිම අලුත්වැඩියා කර නවීකරණය කළ අතර, විසුරුණු ජනතාවගේ ආධ්‍යාත්මික ප්‍රබෝධය සඳහා සේවය කළ කෙටි කාලය තුළ භාවනා වැඩසටහන්, නව සමිති සමාගම් ප්‍රතිසංවිධානය කරමින් කළ සේවය අති විශිෂ්ට විය. 1975 වර්ෂයේ පූජාත්වරය ලද ගරු කේ. ඩී. ජෝශප් පියතුමන් මුලින්ම ගාල්ල පදවියේ ද, පසුව රත්නපුර හා අනුරාධපුර පදවි වල ද සිය කැපවූ සේවාව ඉටු කළ අතර දේවස්ථාන හා ඒ ආශ්‍රිත ගොඩනැඟිලි නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ පුරෝගාමී පියතුමකු විය. බලංගොඩ ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානය එතුමන් අතින් ඉදි වූ විශිෂ්ට ගණයේ නිර්මාණයකි. දේශනාවාදී පියතුමකු ලෙස ප්‍රකට ගරු කේ. ඩී. ජෝසප් පියතුමන් නිතර විහිළු කරමින් අන් අය සතුටු කිරීමට ද ප්‍රකට විය.

හිනිදුම, තංගල්ල, හල්පාතොට, බලංගොඩ, කැගල්ල, රඹුක්කන, හබරණ, ඇඹිලිපිටිය, ගනේගම යන මීසම්වල අගනා සේවාවක් කරමින් දේව ජනතාව අතර ප්‍රසාදයට පත් විය. දිසානායක පියතුමකු, පදවි උපදේශක පියතුමකු හා කනිටු දෙව්සත්හල් අධ්‍යක්ෂ පියතුමකු ආදි වශයෙන් නොයෙක් නිලතල හොබවමින් පදවියට කළ සේවාව රත්නපුර පදවි කිතුනු ජනතාවට මහත් ආශිර්වාදයක් විය. රත්නපුර පදවි පූජක පුතුන් තෙනමකගේ රජත ජයන්ති තුති දීමේ දිව්‍ය යාගයේ ප්‍රධාන දෙසුම සිය මුවින් ඉටු කර දෙව් මව් තුරුළට යාමට එතුමා කැඳවීම ලැබීය. නොසිතූ මොහොතක සමිඳු තුරුළට කැඳවා ගත් ගරු කේ. ඩී. ජෝශප් පියතුමන් හට සදා මොක්සුව ලැබේවා!

**(ක්‍රිෂේන්ද්‍ර ප්‍රනාන්දු )**

# බලගල "දීපාලෝකයෙන්" වෛද්‍ය සායනයක්



හැඳල, බලගල දීපාලෝක සුභසාධක සංගමය මඟින් සංවිධානය කරන ලද වෛද්‍ය සායනයක් නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් බලගල අශෝකාරාමයේ දී පැවැත්විණ.

එම අවස්ථාවට අශෝකාරාමාධිපති පූජ්‍ය බටගල්ලේ පඤ්ඤාකිත්ති හිමි ද, බස්නාහිර පළාත් සභාවේ හිටපු අමාත්‍ය ලෝරන්ස් මාදිවල, දීපාලෝක සුභ සාධක සංගමයේ සභාපති මෙරිල් වික්‍රමසිංහ, ලේකම් ටී. මැනුවෙල්, භාණ්ඩාගාරික ට්‍රෙජින් ජයවර්ධන ඇතුළු සාමාජික සාමාජිකවෝ ද සහභාගි වූහ. **(සේයා සටහන නිමල් පෙරේරා)**

# 2012 ද ලාසාල් පා ගමනට විදුහල්පති සහෝදරවරුන්ගේ නියෝජනය



පසුගියදා වසර 107 ක් පැරැණි ද ලාසාල් විදුහලේ පා ගමනට කඳාන ද මැසනද්, කොටහේන සා. බෙනඩික්, ග්‍රෑන්ඩ්පාස් සා. ජෝශප් සහ රාගම දියගල බෝයිස් ටවුන් විදුහල්හි ගරු විදුහල්පති සහ ගරු සහෝදරවරුන් ද ශ්‍රී ලංකාවේ ප්‍රාදේශියාධිපති ගරු ඩෙන්සිල් පෙරේරා සහෝදරතුමා, ද ලාසාල් විදුහල්පති ගරු ඒ. ඊ. තාසියස් සහෝදරතුමන් ද සහභාගි වූහ.

**(මෝදර - රනිල් රාජපක්ෂ)**

## පහන් ගෙදරින් මංගල සීනු හැඬුවේ !



කොළඹ කතෝලික මුද්‍රණාලයේ පරිගණක අංශයේ සේවය කරන මොරටුව සරික්කාලිමුල්ල පදිංචි, සරික්කාලිමුල්ල සා. ආනා මුනිවරියගේ දෙව්මැඳුරේ දහම් ගුරුවරියක වශයෙන් ද සමිති සමාගම්හි ක්‍රියාකාරි සාමාජිකාවක ද වන සමෝදා ප්‍රනාන්දු මෙනෙවිය පසුගියදා යුග දිවියට පා තැබීය. ඇයගේ අතිනත ගත්තේ රාගම පදිංචි ටිරෝන් එලායස් මහතාය. ඔවුන් දෙපළට ප්‍රදීපයේ සුබාශිංසන

# කතෝලික දහම් ගුරු උපදේශිකාවට මංගල සීනු

රත්නපුර, ගුරුගල්ල සා. ප්‍රැන්සිස් සේවියර් දහම් පාසලේ 28 වසරක් දහම්ගුරු සේවයේ නියැලෙන, එහි විදුහල්පතිනිය මෙන්ම රත්නපුර පදවි දහම් ගුරු නියෝජිත සංගමයේ ලේකම් ලෙසද කටයුතු කළ දෙහිඕවිට අධ්‍යාපන කලාපයේ කතෝලික ධර්ම ගුරු උපදේශිකා මාරි සිල්වා මෙනෙවිය පසුගිය දා කීරපත්දෙණිය ක්‍රිස්ටෝපර් ඇන්ටනි මහතා සමඟ යුග දිවියට එළඹිණි.



ගුරුගල්ල සාන්ත ප්‍රැන්සිස් සේවියර් දෙව්මැඳුරේ මංගල දිව්‍ය යාගය පවත්වන ලද්දේ රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙනි. මෙම අවස්ථාවට රත්නපුර පදවි අනුනායක ගරු ඩේමියන් ප්‍රනාන්දු පියතුමන් ප්‍රමුඛ ගාල්ල, රත්නපුර සහ කොළඹ පදවිවල පියවරුන් රැසක් සහභාගි වූහ.

මාරි සිල්වා මහත්මිය ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ සාමාජිකාවක ද වන අතර සදාසරණ නිකායේ ගරු ජෙනට් සහ දයා සේවා නිකායේ ගරු හැරියට් පැවදි සොයුරියන්ගේ සොහොයුරියකි. නව යුවළට ප්‍රදීප සුබ පැතුම්.

**(තියබෝල්ඩ් සමරතුංග)**

# මුළු දිවයිනටම සාම විනිසුරු



නාත්තන්ඩියේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරි කුරුකුලසූරියගේ රංජිත් මිල්ටන් ප්‍රනාන්දු මහතා මුළු දිවයිනටම සාම විනිසුරුවරයකු ලෙස දිවුරුම් දුන්නේය.

ඒ මහතා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් බෝපිටිය මාහොලව පදිංචි වන අතර එහි ශුද්ධ අන්තෝනි මුනිඳුන්ගේ දෙව්මැඳුරේ දූත සේවා සහා භාණ්ඩාගාරික ලෙස කටයුතු කරයි. **(කුවින්ටස් ප්‍රනාන්දු)**



ඥානාර්ථ ප්‍රදීපය ලක්බිම ඡායාරූප මාධ්‍යවේදී පර්සි ප්‍රනාන්දු මහතා වයඹ ජනමාධ්‍යවේදින්ගේ සංගමයෙන් මාධ්‍යයට හා ඡායාරූප කලාවට කළ සේවය අගයමින් මාධ්‍ය හරසර සම්මානයෙන් පිදුම් ලැබීය.

# ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය සායනයක්



ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය සායනයක් පසුගියදා දියලගොඩ රෝ.ක. ප්‍රාථමික විදුහලේ පැවැත්විණි. බස්නාහිර පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සහ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෛද්‍ය කාර්යාලයේ අනුග්‍රහයෙන් පවත්වන ලද, මෙම උතුම් කර්තව්‍යයේ දී නිරෝගී ජීවිතයක් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය වෛද්‍ය උපදෙස් රාශියක් පැමිණ සිටි වෛද්‍යවරුන් විසින් ලබා දෙන ලදි.

සායනයට පැමිණ සිටි ජනතාවගේ රෝග පරීක්ෂා කිරීමෙන් පසු අවශ්‍ය බෙහෙත්, තෙල් ආදිය ද මෙම වෛද්‍යවරුන් විසින් නොමිලේ ලබා දීම විශේෂත්වයකි. දියලගොඩ මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ මූලිකත්වය ඇතිව සා. විසෙන්ති ද පාවුලා සමිතිය විසින් මෙය සංවිධානය කරන ලදි. **(ඩී. ඇන්සලම් ප්‍රනාන්දු)**